# ලෝකාණුවිචරණ සූත්‍රය

**සම්පාදක:-**

**පූජ්‍ය නිකපිටියේ ගුණරතන හිමි**

**ධර්මදානය පිණිසයි**

ශ්‍රී බු: ව: 2562 වූ වෙසක් මස පුර තියවක නම් තිථිය ලත් කිවි දින

ව්‍ය: ව: 2020-04-24

# හැඳින්වීම

**"යෙ ගහට්ඨා පුඤ්ඤකරා - සීලවනෙතා උපාසකා,**
**ධමෙමන දරං පොසෙනති - තෙ නමස්සාමි මාතලි"**

එක් දිනක් සක්දෙව් රජතුමා නන්දන උයන සිර දකිනු පිණිස යනු කැමති ව මාතලී රථාචාර්‍ය්‍යවරයාට කථා කොට ආජානීය අශ්වයන් දහසක් යොදන ලද රථය සූදානම් කරන ලෙස කීවේ ය. මාතලි රථාචාර්‍ය්‍යවරයා "යහපති ස්වාමීනි" යැයි කියා ආජානීය රථය යොදා සක්දෙව් රජතුමා හට "නිදුකාණනි, ඔබ වහන්සේගේ ගමනට සුදුසු කල් දනුව" යැයි සැල කළේ ය.

ඉක්බිති සක්දෙව් රජතුමා වෛජයන්ත ප්‍රාසාදයෙන් බසින්නේ ඇඳිලි බැඳ සියලු දිශාවන්ට නමස්කාර කළේ ය. එය දුටු මාතලී රථාචාර්‍ය්‍යවරයා **"වේදත්‍රය හදාරන්නා වූ සියලු පොළෝතල වාසීහු ද, ක්‍ෂත්‍රියයෝ ද, සතර වරම් මහ රජවරු ද, පිරිවර සෙසු දෙවියෝ ද, නුඹ වහන්සේට වඳිති. සක්දෙව් රජතුමනි, පිරිවර සහිත වූ යමෙකුට ඔබ වහන්සේ කා හට වඳින්නෙහි ද?"** යැයි ඇසුවේ ය.

එවිට සක්දෙව් රජතුමා **"වේදත්‍රය පර ප්‍රාප්ත වූ පෘථිවි තල වාසී වූ සියල්ලෝ ද, ක්‍ෂත්‍රියයෝ ද, සිවුවරම් මහ රජ දරුවෝ ද, පරිවාර සම්පන්න වූ සෙසු දෙවියෝ ද මට වඳිත්. ඒ මම ශීලයෙන් සමෘද්ධ වූ, බොහෝ කලක් මුළුල්ලෙහි එකඟ කළ සිත් ඇති, දිවි හිමියෙන් බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි යෙදී වසන්නා වූ පැවිද්දන් සකසා වඳිමි.**

**එසේ ම පින් කරන්නා වූ, සිල්වත් වූ, උපාසක ගුණයෙහි පිහිටියා වූ, යම් ගෘහස්ථ කෙනෙක් දැහැමින් අඹුදරුවන් රකිත් ද, එම්බා මාතලිය, මම ඔවුන් වඳිමි"** යැයි කීවේ ය.

එවිට මාතලි දිව්‍ය පුත්‍රයා **"සක්දෙව් රජතුමනි, යමෙකුට නුඹ වහන්සේ වඳින්නෙහි ද ඔහු ලොව ශ්‍රේෂ්ඨයෝ ම වෙති. වාසව නම් වූ දෙව් රජුනි, යම් කෙනෙකුන්ට ඔබ වඳින්නෙහි ද මමත් ඔවුන් වඳිමි"** යැයි කියා වැන්දේ ය.

මෙලෙස දෙවියන් විසින් මනුලොව වෙසෙන සිල් ගුණ ඇති අයට වඳිනු ලබන්නේ තමන් ඒ දිව්‍ය ආත්මභාවයෙහි විඳින සැප ද, ඒ සඳහා පූර්ව ජාතීන්හි කරගන්නා ලද කුසල් ද මනාකොට දක්නා බැවිනි.

එබැවින් ලෞකික ලෝකෝත්තර සියලු අර්ථයන් සිදුකර ගත හැකි එකම තැන නම් මිනිස් ලොව පමණකි. ඒ උත්තමාර්ථය සිදුකර ගැනීම පිණිස ගිහි පැවිදි සියලු දෙනාම අප්‍රමාදී විය යුතු ය.

සම්බුදු සසුනේ චිර පැවැත්ම පරමාර්ථය කරගත් ශාසන මාමක සත්පුරුෂ මණ්ඩලයක් එක්ව පිහිටුවා ගත් උසස් ප්‍රතිපත්ති සංවිධානයක් වන **"අපරිහානිය පදනම"** නම් වූ සංවිධානයෙහි සාමාජික සැම විසින් බෞද්ධ ජනයාගේ ලෞකික දියුණුව පිණිස හා ලෝකෝත්තර නිවන් සුව ලබනු පිණිස පවත්වා ගෙන යනු ලබන උදාර වැඩ පිළිවෙළ අගය කළ යුතු ය.

සම්බුදු සසුන් ප්‍රතිපත්තිය නඟා සිටවීමට ඇප කැප වූ යතිවරයන් වහන්සේලා අතර අපවත් වී වදාළ **ත්‍රිපිටකධරාචාර්ය මහෝපාධ්‍යා පරම පූජනීය නා උයනේ අරියධම්ම අනුනායක** මහා ස්වාමින් වහන්සේගේ 82 වන ජන්ම දිනය හා අපවත් වී වදාළ **අති පූජනීය ගංගොඩවිල සෝම ස්වාමින් වහන්සේගේ** 72 වන ජන්ම දිනය ව්‍යා: ව: **2019 - 04 - 24** දිනට යෙදී ඇත. ඒ නිමිත්තෙන් පුණ්‍යානුමෝදනා කිරීම පිණිස සිදු කරන පින්කම් මාලාවෙහි එක් අංගයක් ලෙස ධර්ම ග්‍රන්ථයක් සකසා දෙන ලෙස කළ ආරාධනයෙන් මෙම **"ලෝකාණුවිචරණ සූත්‍රය"** නම් ග්‍රන්ථය සැකසුවෙමි. මෙයින් ලෝක ධාතුවෙහි යහ පැවැත්ම හා පරිහානිය කෙසේ වන්නේ ද යන්න මනාව පැහැදිලි කර දෙන්නේ වේ. මෙම අගනා ධර්ම ග්‍රන්ථය සැවොම කියවා බලා එහි සාරය තම ජීවිතයන්ට එකතු කරගෙන යහපත් ධර්මානුකූල ජීවිත ගත කිරීමට සැමට හැකි වේවා.

මෙයින් ජනිත වන උතුම් කුසලය අප ගුරු දේවෝත්තම පරම පූජනීය නා උයනේ මහා ස්වාමින් වහන්සේට ද, අපවත් වී වදාළ සංඝ පීතෘවර සියලු මහෝත්තමයන් වහන්සේලාට ද සුවසේ සමත්‍රිංශත් පාරමිතා ධර්ම සපුරා ලොව්තුරා බුදු පදවිය ලැබීම පිණිස ම හේතු වේවා. සුජීවත් ව වැඩ සිටින නායක මාහිමිපාණන් වහන්සේලා ප්‍රධාන මහ සඟරුවනට ද, සදේවක ලෝකවාසී සියලු සත්වයන්ට ද සුව සේ පාරමී සපුරා නිවන් සුව ලබන්නට ම හේතු වේවා. මෙම ධර්ම ග්‍රන්ථය මුද්‍රණය සඳහා දයකත්වය දැරූ සැමට ද මුද්‍රණය කර දුන් මුද්‍රණාලයාධිපතිතුමා තුමා ප්‍රධාන කාර්ය මණ්ඩලයේ සැමට ද සුවසේ ම නිවන් සුව ලබන්නට හේතු වේවා.

මෙයට ශාසනමාමක
නිකපිටියේ ගුණරතන හිමි.
නා උයන ආරණ්‍ය සෙනසුන.

# පටුන

ලෝකාණුවිචරණ සූත්‍රය ..... 7
❄ සූත්‍ර නිදානය ..... 7
❄ ප්‍රථම ධර්ම සංගායනාව ..... 8
☸ ආනන්ද තෙරුන් රහත් වීම ..... 15
☸ විනය සංගායනා කිරීම ..... 16
☸ ධර්මය සංගායනා කිරීම ..... 17
☸ ධර්ම විනය බෙද දැක්වීම ..... 19
❄ ලෝකාණුවිචරණ සූත්‍ර සංගායනාව ..... 23
☸ නිසි බුද්ධෝපස්ථායෙකු නොවීම ..... 23
☸ නිත්‍ය උපස්ථායෙකු පත් කර ගැනීම ..... 25
☸ ප්‍රතික්ෂේප සතර ..... 26
☸ ආයාචනා සතර ..... 27
❄ දෙවියන් විසින් පුණ්‍ය වාර්තා ගෙන යෑම ..... 37
☸ සුධර්මා දිව්‍ය සභාව ..... 43
✪ වස්සූපනායික සංග්‍රහය ..... 45
✪ පවාරණ සංග්‍රහය ..... 46
✪ ධර්ම ශ්‍රවණය ..... 46
✪ පරසතු වෘක්ෂයෙහි ආනුභාවයෙන් ක්‍රීඩා කිරීම ..... 51
❄ වලාහක දෙවියෝ ..... 57
☸ රාජෝවාද ජාතකය ..... 61
☸ එළාර රජතුමා ..... 64
❄ නිගමනය ..... 66

**ආශ්‍රිත ග්‍රන්ථ** :- අංගුත්තර නිකාය 1
සංයුත්ත නිකාය 1
සංයුත්ත නිකාය 3
දීඝනිකායට්ඨකථා 2
සංයුත්තනිකායට්ඨකථා 1
සංයුත්තනිකායට්ඨකථා 2
අංගුත්තරනිකායට්ඨකථා 1
දීඝනිකාය මහාවග්ග ටීකා
සංයුත්තනිකාය ඛන්ධවග්ග ටීකා
අංගුත්තරනිකාය තිකනිපාත ටීකා
සිංහල මහාවංශය

# ලෝකාණුවිචරණ සූත්‍රය

### නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර **අනාථපිණ්ඩික** මහ සිටුතුමා විසින් සාදවා පූජා කරන ලද **ජේතවනාරාමයෙහි** වැඩසිටි දිනක මෙම ලෝකාණුවිචරණ සූත්‍රය ධර්මශ්‍රවණය පිණිස දම් සභා මණ්ඩපයට රැස් වූ **භික්ෂූන් වහන්සේලා** අරභයා දේශනා කොට වදාළ සේක. ඒ පිළිබඳ අර්ථ විවරණය මෙසේය.

## ❄ සූත්‍ර නිදානය

**"එවං මෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ."**

**"මා විසින් මෙසේ අසන ලදි. එක් සමයක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවනය නම් වූ අනාථපිණ්ඩික මහ සිටුතුමා විසින් සාදවා පූජා කරන ලද ආරාමයෙහි වැඩ වසන සේක."**

බුද්ධ උපස්ථායක වූ ආනන්ද තෙරුන් වහන්සේ විසින් ප්‍රථම සංගායනා කාලයෙහි ධර්ම සංගායනා කරන්නා වූ ආයුෂ්මත් මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ විසින් විමසූ කල්හි පන්සියයක් මහ රහතන් වහන්සේලා හමුවෙහි මෙම සූත්‍රය සංගායනාවට භාජනය කළේ ය. මෙය අංගුත්තර නිකායේ තික නිපාතයෙහි ප්‍රථම පණ්ණාසකයේ සතර වන දේවදූත වර්ගයෙහි එන සත් වන සූත්‍ර දේශනාවයි.

භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ වනාහි සියලු ධර්මයන් තමන් වහන්සේ විසින් ම අවබෝධ කළ සේක. ආචාර්යවරයෙකු නොමැත්තේ ය. ලෝක නාථ වූ භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ දම්සක් පැවතුම් සූත්‍ර දේශනාවෙහි

පටන් සුභද්‍ර පරිබ්‍රාජක තුමා හික්මවීම දක්වා වූ පන්සාලිස් වස තුළ කළ යුතු සියලු බුද්ධ කෘත්‍යයන් සම්පූර්ණ කොට කුසිනාරා නුවර උපවර්තන නම් මල්ල රජ දරුවන්ගේ සල් වනයෙහි යමක ශාල වෘක්ෂයන් අතර පනවන ලද උතුම් බුද්ධාසනයෙහි නැවත නො නැඟිටිනා සෙය්‍යාවෙන් වැඩ හිඳ වෙසක් පුර පසලොස්වක පොහොය දින අලුයම් වෙලෙහි අනුපාදිශේෂ පරිනිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පා වදාළ සේක.

## ❄ ප්‍රථම ධර්ම සංගායනාව

තථාගතයන් වහන්සේගේ පරිනිර්වාණය නිමිත්තෙන් රැස් වූ සත් ලක්ෂයක් භික්ෂු සංඝයා වහන්සේ අතර සංඝ ස්ථවිර වූ මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ තථාගතයන් වහන්සේගේ පරිනිර්වාණයෙන් සත් වන දින පාවා නුවර සිට කුසිනාරාව වෙත වඩිමින් සිට මඳක් විවේක ගැනීම පිණිස මාර්ගයෙන් ඉවත්ව එක් වෘක්ෂ මූලයක වැඩසිටි සේක. එකල්හි පාවා නුවර වැසි එක් උපාසකයෙක් බුද්ධ ශරීරයට ගෞරව දක්වා දෙවියන් විසින් ආකාශයෙහි සිට බුදු සිරුරට පූජා කරන ලද පාත්‍රයක් පමණ වූ දිව්‍යමය මදරා මලක් රැගෙන පාවා නුවර වෙත යමින් සිට මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ වෙත පැමිණ වැඳ සිටියේ ය. එවිට තෙරුන් වහන්සේ ඒ උපාසක තුමාගෙන් "**කොහි සිට එන්නේ ද**" යැයි අසා සිටියේ ය. ඔහු කුසිනාරාවෙහි සිට ආවෙමි යැයි කීවේ ය. "**අපගේ ශාස්තෲන් වහන්සේ දන්නෙහි ද**" යැයි තෙරුන් වහන්සේ විචාළේ ය. එසේය ස්වාමීනි. ඒ තථාගතයන් වහන්සේ පිරිනිවී සත් දවසක් වන්නේ ය යැයි කීවේ ය. එය අසා රහතන් වහන්සේලා ද, අනාගාමී ආර්යයන් වහන්සේලා ද ධර්ම සංවේග උපදවා ගත්හ. කාම රාග, ව්‍යාපාද ප්‍රහීණ නොවුණු බැවින් සෝවාන්, සකෘදගාමී ආර්යයන් වහන්සේලා ද, කල්‍යාණ පෘථග්ජන භික්ෂූන් වහන්සේලා ද අඬා වැලපෙන්නට වූහ.

ඒ අවස්ථාවේ සුභද්‍ර නම් මහලු පැවිද්දෙක් ඒ පිරිසෙහි සිටියේය. එම භික්ෂුව පූර්වයෙහි ආතුමා නුවර කරණවෑමියෙකු ව සිට වයස්ගත ව පැවිදි වූවෙකි. මහලු වයසේ සිටි බැවින් දරුවන් ලවා තම

ගෙවත්තෙහි ම කුටියක් සාදවාගෙන එහි සිටිමින් තම දරුවන්ගේ කෙස් රැවුල් කපමින් ජීවිකාව කළේ ය. එක් චාරිකා සමයක තථාගතයන් වහන්සේ එක්දහස් දෙසිය පනසක් පමණ වූ මහත් භික්ෂු පිරිසක් පිරිවරා ගෙන කුසිනාරා නුවර සිට ආතුමා නුවරට වැඩි සේක. එකල්හි එම භික්ෂුව තථාගතයන් වහන්සේ විශාල සඟ පිරිසක් සමග වඩින්නේ ය යැයි අසා සාමණේර භාවයෙන් සිටි තම දරුවන් දෙදෙනා අමතා **"දරුවනි, නුඹලා ගොස් හිස කෙස් කැපීමට උවමනා උපකරණ රැගෙන ගෙයක් පාසා ඇවිද මිනිසුන්ගේ කෙස්, රැවුල් කපා ලුණු, තෙල් හා අනුභව කළ යුතු දේ රැස් කරව්. භාග්‍යවතුන් වහන්සේ ප්‍රධාන සංඝයාට බෙහෙත් කැඳ දනයක් දෙන්නෙමු"** යැයි කීවේ ය. ඒ සාමණේර පැවිද්දෝ ද එසේ කළහ. භාග්‍යවතුන් වහන්සේ වැඩි කල්හි මිනිසුන්ගේ ද අත් උදව් ඇතිව එලෙස එක්රැස් කරන ලද දෙයින් භොජ්ජ යාගුවක් (ඝන කැඳක්) සැදවූහ. ගිතෙල්, මී පැණි, මත්ස්‍ය, මාංශ, මල් ඵල රස ආදිය ද, යම් කෑ යුතු දෙයක් වේ ද ඒ සියල්ල එහි දැම්මවී ය. තව ද හකුරු යොදා කරන ලද **"මධුගෝළක"** නම් කැවිලි ද පිළියෙල කරවූයේ ය. මෙයට **"අතිරස කැවුම්"** යැයි ද, **"මධුසීසක"** යැයි ද කියනු ලැබේ. මේ සියල්ල දන්නා භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා සමග නගරයට පිඬු පිණිස වැඩි සේක. මිනිස්සු **"භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා සමග නගරයට පිඬු පිණිස වඩියි, ඔබ කවුරුන් හට කැඳ පිළිගන්වන්නෙහි ද"** යැයි එම භික්ෂුවට කීහ. එවිට ඒ භික්ෂුව කලබල වී භාග්‍යවතුන් වහන්සේ ඉදිරියට ගොස්, **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, කැඳ පිළිගන්නා සේක්වා"** යැයි ආරාධනා කළේ ය. භාග්‍යවතුන් වහන්සේ **"මහණ, නුඹ කෙසේ කැඳ සැකසුවේ ද"** යැයි අසා ගර්හා කොට අකප්පිය සමාදනය ද, **"පූර්වයෙහි භාවිතා කළ කරණවැම් බඩු පාවිච්චි නොකළ යුතුය"** යැයි ද මෙසේ ඒ භික්ෂුව නිමිති කොට දුෂ්කට සිකපද දෙකක් පනවා දැහැමි කථාවක් කොට භික්ෂූන් අමතා මෙසේ වදාළ සේක. **"මහණෙනි, අනේක කල්ප කෝටි ගණනක් භෝජනය සොයන්නවුන් සමගම මේ දීර්ඝ සංසාරයේ කල් ගත කරන ලදි. මෙය වනාහි නුඹලාට අකැප ය. මේ අධර්මයෙන් උපයා ගත් භෝජනය පරිභෝග කළවුන් අනේක වූ ආත්මභාව සිය දහස් ගණනක් අපායෙහි ම උපදින්නෙහි ය. ඉවත් වන්න, මෙය පිළි නො ගන්න"** යැයි වදරා පිඬු පිණිස වැඩි සේක. එක් භික්ෂුවකුදු එය පිළි නො ගත්හ. සුභද්‍ර භික්ෂුව නො සතුටු ව **"මොහු සියල්ල දනිමි යැයි ඇවිදියි. ඉදින් නො ගනු කැමැත්තෙහි නම් එය කිය යුතු නොවන්නේ ද, මා වෙහෙසීමෙන්**

**කරන ලද සියල්ල මොහු විසින් නසන ලද්දේ ය. මොහු මා කෙරෙහි හිතවත් බවක් නැත්තේ ය"** යැයි තථාගතයන් වහන්සේ සමග වෛරී ව සිට තථාගතයන් වහන්සේ ජීවමාන ව සිටියදී කිසිවක් කියන්නට නොහැකි ව සිට පිරිනිවියේ යැයි අසා සතුටු ව අඬා වැලපෙන භික්ෂූන් අමතා මෙසේ කීවේය.

**"ඇවැත්නි, ශෝක නො කරව්. නො වැලපෙව්. අපි ඒ මහා ශ්‍රමණයාගෙන් සම්පූර්ණයෙන් මිදුණෝ වෙමු. ඒ මහා ශ්‍රමණයා මෙය නුඹලාට කැප ය, මෙය නුඹලාට අකැප ය යනාදී ලෙස සිකපද පනවමින් අපි පීඩාවට පත් කරනු ලැබුවෝ වෙමු. දැන් අපි ඒ ගැහැට වලින් නිදහස් වූවෝ වෙමු. එබැවින් දැන් අපි යමක් කැමැත්තෙමු නම් එය කරන්නෙමු. යමක් අකැමැත්තෙමු නම් එය නො කරන්නෙමු"** යැයි මේ වචනය කීවේය.

මේ වචනය මහා කාශ්‍යප මහ රහතන් වහන්සේට හදවතට වැදුණු පහරක් මෙන් ද, හිසට පහත් වූ වියලි හෙනයක් මෙන් ද හැඟී ගියේය. මහත් වූ ධර්ම සංවේගයක් හට ගත්තේ ය. තෙරුන් වහන්සේ සිතන සේක් **"සත් දිනකට පෙර භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පෑ නමුත් අදත් ඒ බුදු සිරුර රන් පැහැයම ය. භාග්‍යවතුන් වහන්සේ විසින් දුක සේ ගොඩනැගූ සසුනෙහි පාපී කසටක්, කටුවක් හට ගත්තේ ය. මෙවන් පාපී පුද්ගලයන්ට වැඩෙන්නට ඉඩ ලැබුණ හොත් තවත් සහායකයන් ලැබ ශාසනය පසු බස්සවන්නට හැකි වන්නේ ය. ඉදින් වනාහි මම මේ මහල්ලා ව මෙහි දී ම රෙදි කඩක් අන්දවා අළු විසුරුවා බැහැර කරන්නෙම් නම්, මිනිස්සු ශ්‍රමණ ගෞතමයන් වහන්සේගේ දේහය තිබිය දී ම ශ්‍රාවකයෝ විවාද ඇති කර ගනිති යැයි අපට දොස් පවරන්නාහු ය"** යැයි සිතා නැවත ද මෙසේ සිහිපත් කළේ ය.

භාග්‍යවතුන් වහන්සේ විසින් එකට එකතු නොකළ මල් රාශියක් මෙන් ධර්මය දේශනා කරන ලදි. එහි යම් සේ වාතය වැදීමෙන් සමහර මල් විසිරී යයි. එපරිද්දෙන් මෙබඳු පවිටු පුද්ගලයන් නිසා කල් ගත වන විට විනයෙහි සිකපද එක දෙක බැගින් විනාශ වී යන්නේ ය. සූත්‍රයන්හි එකක් දෙකක් ප්‍රශ්න වාරයන් නැසී යන්නේ ය. අභිධර්මයෙහි එක දෙක වෙනස් වාරයන් නැසී යන්නේ ය. මෙසේ පිළිවෙළින් මුල නැසුණු කල්හි අපි පිසාචයන් හා සම වූවෝ වෙමු. එබැවින් ධර්මයත්

විනයත් සංගායනා කරන්නෙමි. මෙසේ ඇති කල්හි ශක්තිමත් නූලකින් ගැට ගසන ලද මල් මාලාවක් මෙන් ධර්ම විනය දෙක ස්ථිරව පිහිටන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ මේ සඳහා ම මට පෙර ගමන් කළ සේක. අවවාද තුනකින් උපසම්පදව දුන් සේක. කයින් සිවුරු මාරු කළ සේක. මේ සියල්ලට වඩා අසාධාරණ වූ නවානුපූර්ව විහාර සමාපත්තීන්ගෙන් සම තැන තැබූ සේක. මෙසේ තමන් වහන්සේ හා සම තැන්හි තැබීමෙන් අනුග්‍රහ කරන ලද මට ධර්ම විනය සංගායනාව හැර අන් කිනම් මගකින් ණය නැති බවක් වන්නේ ද, සක්විති රජ කෙනෙකු තමන්ගේ සන්නාහයත් ඓශ්වර්‍යයත් දීමෙන් ස්වකීය කුල වංශය පිහිට වූ පුතුට මෙන් භාග්‍යවතුන් වහන්සේ **"මෙතෙම මාගේ සද්ධර්ම වංශය පිහිටුවන්නෙකු වන්නේ ය"** යැයි දැන මේ අසාධාරණ අනුග්‍රහයෙන් මට අනුග්‍රහ කළ සේක යැයි සිතුවේ ය. එසේම **"මා වැනි භික්ෂූන් වහන්සේලා සිටියදී මේ පාපියෙකුට සසුනෙහි දියුණු වන්නට ඉඩක් නො තැබිය යුතුය. යම්තාක් අධර්මය අවිනය නො බැබළේ ද ඒ තාක් ධර්මයත් විනයත් පසු බසින්නේ නැත. යම් විටෙක අධර්මය අවිනය බැබළේ ද එවිට ධර්මයත් විනයත් පසු බසින්නේ ය. එබැවින් අධර්මවාදීන් අවිනයවාදීන් බලවත් වීමට පෙර ධර්මවාදීන් විනයවාදීන් දුබල වීමට පෙර ධර්ම විනය දෙක සංගායනා කරන්නේ නම් මැනවි"** යැයි සිතා ඒ මොහොතේ කිසිවක් නොකියා කුසිනාරාව වෙත වැඩම කොට බුදු සිරුර තැන්පත් කරන ලද විසි රියන් උස සඳුන් දර සෑය වටා ප්‍රදක්ෂිණා කොට අධිෂ්ඨාන බලයෙන් බුදු සිරිපා තම නළලෙහි තබා වන්දනා කළේ ය. ඉන් පසු දේවානුභාවයෙන් ඒ චිතකය ගිනි ඇවිල ආදාහනය වූයේ ය.

පරිනිර්වාණයෙන් පසු බුදු සිරුර සත් දිනක් ඒ ආසනයෙහි ම පැවතුණේ ය. ඒ කාලය සදේවක ලෝකවාසීන් විසින් වැඳුම් පිදුම් කළහ. සත් වන දින ආදාහනය සිදු විය. ඉන් පසු සත් දිනක් ධාතු පූජා කාලය වූහ. ඉන් පසු සර්වඥ ධාතු බෙදා දීමට සත් දිනක් ගත විය. මේ අවස්ථාවට සත් ලක්ෂයකට අධික භික්ෂු සංඝයා වහන්සේ රැස්ව සිටියහ. ඒ සර්වඥ ධාතු බෙදා දීමේ කටයුතු නිමා වූ පසුව මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ මෙවැනි භික්ෂු සන්නිපාතයක් නැවත දුර්ලභ යැයි සිතා භික්ෂු සංඝයා අමතා ඇවැත්නි, **මම එක් සමයක පන්සියයක් පමණ වූ මහත් භික්ෂු පිරිසක් සමග පාවා නුවරින් නික්ම කුසිනාරාව බලා එන අතර තථාගතයන් වහන්සේගේ පරිනිර්වාණය අසා භික්ෂූන්**

**හඬා වැලපෙන කල්හි එක් පාපී භික්ෂුවක් "ඇවැත්නි නො හඬන්න නො වැලපෙන්න.... යමක් අකැමැත්තෙමු නම් එය නො කරන්නෙමු"** යැයි මෙසේ කීවේය.

පරිනිර්වාණයට පත් තථාගතයන් වහන්සේගේ බුද්ධ ශරීරය ආදහනය වීමටත් පෙර මේ නිර්ලජ්ජී පාප භික්ෂූන්ගේ නැඟී සිටීම විය. ධර්මය ශාස්තෘන් වහන්සේ සමගම නැතිව ගියේ යැයි ද, ධර්මය ශාස්තෘවරයෙකු නැති එකක් ය යැයි ද සිතන පාපී භික්ෂූහු අලජ්ජී පක්ෂය ලැබ, කොටස්වලට බෙදී නොබෝ කලකින් ම සද්ධර්මය අතුරුදහන් කරන්නාහුය යන මේ කාරණයක් වේද, මෙය විද්‍යමාන වන්නේ ය. යම්තාක් ධර්මය විනය පවත්නේ ද, ඒ තාක් බුද්ධ වචනය නො ඉක්මවා සිටින ශාස්තෘවරයෙකු ඇති එකක් වන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ විසින් ම "**යො වො, ආනන්‍ද, මයා ධම්මො ච විනයො ච දෙසිතො පඤ්ඤත්තො, සො වො මමච්චයෙන සත්‍ථා**" යනුවෙන් "**ආනන්දය, මා විසින් යම් ධර්මයක් දේශනා කරන ලද්දේ ද, යම් විනයක් පනවන ලද්දේ ද, ඒ ධර්ම විනය දෙක මාගේ පරිනිර්වාණයෙන් පසු නුඹලාට ශාස්තෘ වන්නේ ය**" යැයි මේ කාරණය වදරන ලද්දේමය. එබැවින් යම් සේ මෙම ශාසනය බොහෝ කල් පැවැත්මට සුදුසු වූවක් කොට ධර්මයත් විනයත් සංගායනා කරන්නෙමු" යැයි දන්වා සිටියහ.

භික්ෂූන් වහන්සේලා "**ස්වාමීනි, එසේ නම් ස්ථවිරයන් වහන්සේ ම ඒ සඳහා භික්ෂූන් වහන්සේලා තෝරා ගන්නා සේක්වා**" යැයි කීහ. තෙරුන් වහන්සේ සියලු නවාංග ශාස්තෘ ශාසන සංඛ්‍යාත පර්‍යාප්තිධර, නොයෙක් සිය, දහස් ගණන් පෘථග්ජන, සෝතාපන්න, සකෘදගාමී, අනාගාමී, ශුෂ්ක විදර්ශක ක්ෂීණාශ්‍රව භික්ෂූන් හැර පියා ත්‍රිපිටක බුද්ධ වචනය හා සියලු පර්‍යාප්ති ප්‍රභේදයන්හි පරප්‍රාප්ත සිවුපිළිසිඹියා පත් මහත් ආනුභාව ඇති, භාග්‍යවතුන් වහන්සේ විසින් ම අග්‍ර ස්ථානයෙහි තබන ලද ත්‍රිවිද්‍යා ආදී ප්‍රභේද ඇති ක්ෂීණාශ්‍රව භික්ෂූන් වහන්සේලා ම හාරසිය නව අනූ නමක් (499) තෝරා ගත්හ. කුමක් සඳහා එක නමක් අඩු කළ සේක් ද යති? ආනන්ද තෙරුන් වහන්සේට ඉඩ සලසනු සඳහා ය. ඒ වන විට ආනන්ද තෙරණුවෝ රහත් ව නොසිටි බැවිනි. මේ ආනන්ද තෙරුන් වහන්සේ, භාග්‍යවතුන් වහන්සේ පසුපස යමින් අග්‍ර උපස්ථානය කරමින් බොහෝ ධර්ම විනය

කාරණා උගත්තේ ය. එබැවින් තෙරුන් වහන්සේ නොමැතිව ධර්‍ම සංගායනාව නොකළ හැකිය. ඉන් පසු අන් භික්ෂූන් වහන්සේලාගේ ඉල්ලීමෙන් ආනන්ද තෙරුන් වහන්සේ ද තෝරා ගත්හ. ඉන් පසු ස්ථවිර භික්ෂූන් වහන්සේලාට "**අපි ධර්‍ම, විනය සංගායනාව කොතැන්හි දී කරන්නෙමු ද**" යැයි මේ සිත විය. එවිට එම භික්ෂූන් වහන්සේලාට මේ අදහස වූහ.

"**රජගහ නුවර භික්ෂාව ලැබීමට පහසු ය. බොහෝ සෙනසුන් ද ඇත. අජාසත් රජතුමාගේ දැහැමි ආරක්ෂාව ද ලැබිය හැක. එබැවින් අපි රජගහ නුවර වස් වසමින් ධර්‍මයත් විනයත් සංගායනා කරන්නෙමු, අපගේ මේ කටයුත්ත බොහෝ කල් පවත්නකි. කිසියම් විරුද්ධ පුද්ගලයෙකු සඟ මැදට පැමිණ අර්බුද ඇති කිරීමට ඉඩ ඇත. එබැවින් අන් භික්ෂූහු රජගහ නුවර වස් නො විසිය යුතුය. ධර්‍ම සංග්‍රාහක තෙරුන් වහන්සේලා පමණක් රජගහ නුවර වස් සමාදන් විය යුතුය**" යැයි අදහස වී ඤත්ති දුතිය කර්‍මයෙන් එලෙස සම්මත කර ගත්හ.

ඉන් පසු වස් එළඹෙන සමය ළං වන බැවින් මහා කාශ්‍යප තෙරුන් වහන්සේ, සංගායනාවට සම්මත කරගත් රහතන් වහන්සේලාගෙන් අඩක් ගෙන රජගහ නුවර බලා එක් මඟකින් වැඩි සේක. අනුරුද්ධ තෙරුන් වහන්සේ ද, රහතන් වහන්සේලාගෙන් අඩක් ගෙන රජගහ නුවර බලා එක් මඟකින් වැඩි සේක. ආනන්ද තෙරුන් වහන්සේ ද, රජගහ නුවර වඩිනු කැමති ව, භාග්‍යවතුන් වහන්සේගේ පාත්‍රය හා චීවර ගෙන මහත් වූ භික්ෂු පිරිසක් පිරිවරා සැවැත් නුවර බලා චාරිකාවෙහි වැඩි සේක. ජේතවනාරාමයට වැඩ භාග්‍යවතුන් වහන්සේ වැඩසිටි ගඳකිළියෙහි දොර විවර කොට ඇඳ පුටු බැහැරට ගෙන ගසා දමා ගඳකිළිය හැමද මැලවුණු මල් ආදී කසල බැහැර කොට ඇඳ පුටු ඇතුළට ගෙන ගොස් සුදුසු තැන්හි තබා භාග්‍යවතුන් වහන්සේ වැඩසිටි කල්හි මෙන් කළ යුතු සියලු වතාවත් සිදුකළ සේක. ආනන්ද තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ පරිනිර්වාණයෙහි පටන් සිටීම් හිඳීම් බහුලව සිටි බැවින් සෙම් පිත් ආදී දෙස් කිපුණු ශරීරයෙන් සිටි බැවින් දෙවන දින කිරි විරේකයක් පානය කොට විහාරයෙහි ම වැඩසිටි සේක. පසු දින සුභ මානවකයාගේ ආරාධනාවෙන් ඔහුගේ නිවසට වැඩ ඔහු විසින් විචාරන ලද පැන විසඳමින් දීඝ නිකායෙහි ඇතුළත් "**සුභ සූත්‍රය**" වදාළ සේක. අනතුරුව දෙව්රම් වෙහෙරෙහි

කැඩුණු බිඳුණු තැන් පිළිසකර කරවා වස් එළඹෙන සමය ළං වන බැවින් උපකාරක එක් භික්ෂුවක් සමග රජගහ නුවරට වැඩි සේක.

එසමයෙහි වනාහි රජගහ නුවර මහා විහාර අටලොසක් (18) වූහ. ඒවා අතර **තල් වනය, වේළුවනය, සීත වනය, මද්දකුච්ඡි මිගදය, ජීවක අම්බ වනය, මෝර නිවාපය, ලට්ඨි වනය** යන මේවා රජගහ නුවර සමීපයෙහි විය. එසේම **චෝර ප්‍රපාතය**, ඉසිගිලි පර්වතය පාමුල වූ **කාලසිලාව**, වේභාර පර්වතය පාමුල වූ **සප්තපර්ණි ගුහාව**, සීත වන සොහොන් බිම සමීපයෙහි වූ **සප්තසොණ්ඩික පබ්බහාරය, ගෝතම කන්දරය, තින්දුක ගුහාව, තපෝද කන්දරය, ඉන්ද සාල ගුහාව, පිප්ඵලි ගුහාව**, ගිජ්ජකූට පර්වතයෙහි වූ **සූකර කත ලෙන** යන මේවා රජගහ නුවර වටා පිහිටි ඒවා ය. භාග්‍යවතුන් වහන්සේගේ පරිනිර්වාණයෙන් පසු භික්ෂූන් වහන්සේලා මේ විහාර සියල්ල අතහැර දමා ගිය බැවින් මකුළු දැල් බැඳී කොළ රොඩු වලින් ගැවසී පාලු විය. මහා කාශ්‍යප තෙරුන් වහන්සේ ද, අනුරුද්ධ තෙරුන් වහන්සේ ද සපිරිවරින් රජගහ නුවරට වැඩ අපවිත්‍ර වී පාලුවට ගොස් ඇති සෙනසුන් දැක "**භාග්‍යවතුන් වහන්සේගේ වචනයට ගරු කිරීම පිණිස ද, තීර්ථක උපවාදයෙන් මිදෙනු පිණිස ද පළමු මාසය අපවිත්‍ර සේනාසන පිරිසිදු කර කැඩුණු බිඳුණු තැන් පිළිසකර කරන්නෙමු**" යැයි මෙසේ සිතූහ.

තීර්ථකයෝ "**ශ්‍රමණ ගෞතමයන් වහන්සේගේ ශ්‍රාවකයෝ ශාස්තෲන් වහන්සේ සිටි කල්හි පමණක් විහාරයන් පිළිදැගුම් කළහ. පිරිනිවි කල්හි ඒ වතාවත් අත හැරියාහු වෙති**" යැයි මෙසේ කියන්නාහුය. භාග්‍යවතුන් වහන්සේ විසින් විහාරයන්හි කැඩුණු බිඳුණු තැන් පිළිසකර කිරීම වර්ණනා කරන ලදි. ඇවැත්නි, එබැවින් අපි වස් කාලයෙහි පළමු මස විහාර පිළිසකර කරමු, මැද මාසයෙහි රැස්ව ධර්ම විනය සංගායනා කරන්නෙමු යැයි කතිකා කරගෙන දෙවන දින රජ මාලිගයට වැඩ අජාසත්ත රජතුමා සම්මුඛ වී විහාර පිළිසකර කිරීමට අත් උදව් අවශ්‍ය බව කීහ. රජතුමා මිනිසුන් දුන්නේ ය. තෙරුන් වහන්සේලා විහාර පිළිසකර කරවා රජතුමාට ඒ බව දන්වා නැවත ද "**මහ රජ, ධර්ම සංගායනාවක් කරනු කැමැත්තෙමු**" යැයි කීහ. රජතුමා එය අසා "**ස්වාමීනි, විශ්වාස ඇත්තෝ ව කරනු මැනවි. ස්වාමීන් වහන්සේලාට ධර්මචක්‍රය වේවා. මා හට ආඥා බලය වේවා. ඒ සඳහා මා විසින් කුමක් කළ යුතු ද**" යැයි අසා සිටියේය. "**මහ රජ, ධර්මය , විනය**

**සංගායනා කරන්නා වූ භික්ෂූන් වහන්සේලාට වැඩ හිඳීමට තැනක් කරවා ගත යුතුය"** යැයි කීහ. "**එය කොතැන්හි කළ යුතු ද"** යැයි රජතුමා ඇසුවේ ය. "**වේභාර පර්වතය පාමුල වූ සප්තපර්ණී ගුහා ද්වාරයෙහි සුදුසුය"** යැයි තෙරුන් වහන්සේලා කීහ.

එකල්හි රජතුමා, විශ්ව කර්ම දිව්‍ය පුත්‍රයා විසින් මවන ලද්දක් හා සමානව, මැනවින් බෙදන ලද බිත්ති ඇති, කණු ඇති, පිය ගැට පෙළ ඇති, නන් වැදෑරුම් මල් කම් ලිය කම්වලින් විසිතුරු කරන ලද මහා මණ්ඩපයක් කරවා, නොයෙක් මල් දම් එල්ලන ලද මනහර වියනක් කරවා, නොයෙක් රත්නයන්ගෙන් විසිතුරු වූ මැණික් ඔබ්බවන ලද මාලා කර්මයන්ගෙන් විසිතුරු වූ බිමක් එහි කරවා, බ්‍රහ්ම විමානයක් සේ සරසා, පන්සියයක් භික්ෂූන් වහන්සේලාට වැඩ හිඳීමට අනගි වූ පසතුරුණු පණවා, මණ්ඩපය මැද නැගෙනහිරට මුහුණ ලා සම්මා සම්බුදු රජාණන් වහන්සේට වැඩ හිඳීමට සුදුසු බුද්ධාසනයක් ද පනවා, එහි දකුණුපස උතුරු දෙසට මුහුණ ලා ථේරාසනයක් ද, ඇත් දළවලින් ලියවන ලද විසිතුරු විජිනිපතක් තබා "**ස්වාමීනි, මගේ කටයුතු නිමවන ලදී"** යැයි තෙරුන් වහන්සේලාට දන්වා සිටියේය.

## ☸ ආනන්ද තෙරුන් රහත් වීම

මේ වන විටත් ආනන්ද තෙරුන් වහන්සේ ශෛක්ෂ ව සිටි බැවින් රහතන් වහන්සේලා ආනන්ද තෙරුන් වෙත පැමිණ "**ආනන්දය, හෙට අපගේ රැස්වීම වන්නේය. නුඹ තවම ශෛක්ෂයෙකි, රැස්වීමට යෑමට නුසුදුස්සෙකි. එබැවින් අප්‍රමාදී විය යුතුය"** යැයි කීහ. ආනන්ද තෙරණුවෝ ද "**හෙට රැස්වීම වන්නේය. මා විසින් ශෛක්ෂ ව රැස්වීමට යෑම නොවටී ය"** යැයි සිතා රාත්‍රියෙහි බොහෝ වේලාවක් "**කායගතා සති"** කමටහනින් යුතුව සක්මනෙහි යෙදී උත්සාහ කළ නමුත් විශේෂාධිගමයක් නොවූ බැවින්, මඳක් විවේක ගෙන නැවත උත්සාහයෙහි යෙදෙන්නෙමි යැයි සිතා, අලුයම් වෙලෙහි සක්මනින් බැස පා සෝද විහාරයට පිවිස, විඩා හරින්නෙමි යැයි ඇඳෙහි වැඩ හිඳ කොට්ටය වෙත හිස එළ වූ සේක. දෙපා පොළොවෙන් මිදුණාහ. හිස කොට්ටයට නො පැමිණියේ ය. මේ අතර රහත් වූ සේක. මෙසේ හිඳීම, සිටීම, සක්මන් කිරීම සැතපීම යන සිව් ඉරියව්වෙන් තොරව රහත් වූහ.

**එබැවින් මේ බුදු සසුනෙහි සිව් ඉරියව්වෙන් තොරව යම් භික්ෂූන් වහන්සේ නමක් රහත් වූයේ නම් ඒ ආනන්ද තෙරුන් වහන්සේ ය** යැයි කිව යුතු වන්නේය.

පසු දින ස්ථවිර භික්ෂූන් වහන්සේලා බත් කිස කොට පාත්‍ර චීවර තැන්පත් කොට තබා ධර්ම මණ්ඩපයෙහි රැස්ව තමන් වහන්සේලාට නියමිත ආසනයන්හි වැඩ හුන් සේක. ආනන්ද තෙරුන් වහන්සේ ගේ ආසනය පමණක් හිස් විය. ආනන්ද තෙරුන් වහන්සේ තමන් රහත් ව වැඩි බව හඟවනු පිණිස භික්ෂූන් වහන්සේලා සමග නො වැඩියේ ය. භික්ෂූන් වහන්සේලා "**මේ ආසනය කවරෙකු සඳහා ද**" යැයි විචාළහ. "**මෙය ආනන්ද තෙරුන් වහන්සේ සඳහා**" යැයි කීහ. ආනන්ද තෙරුන් වහන්සේ ඒ මොහොතේ සිටි ආවාසයෙන් පොළොව කිමිද මණ්ඩපයෙන් මතු ව තමන් වහන්සේට නියමිත ආසනයෙහි වැඩසිටි සේක. මේ හේතුවෙන් ආනන්ද තෙරුන් වහන්සේ රහත් ව වැඩි බව සියලු භික්ෂූන් වහන්සේලා ම පිළිගත්හ.

## ☸ විනය සංගායනා කිරීම

මෙසේ ධර්ම සංග්‍රාහක මහා රහතන් වහන්සේලා ධර්ම මණ්ඩපයෙහි රැස් වූ කල්හි සංඝ ස්ථවිර වූ මහා කාශ්‍යප තෙරුන් වහන්සේ "**ඇවැත්නි, ධර්මය විනය දෙකෙන් කවරක් පළමු ව සංගායනා කරන්නෙමු ද**" යැයි භික්ෂු සංඝයා ඇමතූ සේක. භික්ෂූන් වහන්සේලා "**ස්වාමීනි, ස්ථවිරයන් වහන්ස, විනය නම් බුද්ධ ශාසනයාගේ ආයුෂයයි. විනය පිහිටි කල්හි ශාසනය සිටියේ වෙයි. එබැවින් පළමු ව විනය සංගායනා කරමු**" යැයි කීහ. "**කවුරුන් ප්‍රධාන කොට ගෙන විනය සංගායනා කළ යුතු ද**" යැයි කාශ්‍යප තෙරුන් වහන්සේ ඇසුවේ ය. "**ස්වාමීනි, ස්ථවිරයන් වහන්ස, මේ උපාලි තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ විසින් ම විනයධරයන් අතර අග්‍ර ස්ථානයෙහි තබා වදාළ සේක. එබැවින් උපාලි තෙරුන් වහන්සේ ප්‍රධාන කොට ගෙන සංගායනා කරමු**" යැයි භික්ෂූන් වහන්සේලා කීහ. ඉන් පසු කාශ්‍යප තෙරුන් වහන්සේ විනය විචාරීමට "**සුණාතු මෙ, ආවුසො, සඞෙඝා. යදි සඞඝස්ස පත්තකල්ලං, අහං ආයස්මන්තං උපාලිං විනයං පුච්ඡෙය්‍යං**" යනුවෙන් තමන් වහන්සේ ම සම්මත කරගෙන

ථේරාසනයෙහි වැඩසිටි සේක. උපාලි තෙරුන් වහන්සේ විනය විසඳීමට "**සුණාතු මෙ, භන්තෙ, සඞෙඝා. යදි සඞඝස්ස පත්තකල්ලං, අහං ආයස්මතා මහාකස්සපෙන විනයං පුට්ඨො විස්සජ්ජෙය්‍යං**" යනුවෙන් තමන් වහන්සේ ම සම්මත කරගෙන අසුනින් නැඟිට සිවුර ගැට වටු ගන්වා ගෙන, වැඩිහිටි ස්ථවිර භික්ෂූන් වැඳ, විජිනිපත ගෙන ධර්මාසනයෙහි වැඩ හුන් සේක. මහා කාශ්‍යප තෙරුන් වහන්සේ උපාලි තෙරුන් වහන්සේගෙන් මෙසේ විනය විචාළ සේක.

"**ඇවැත්නි, උපාලිය, භාග්‍යවතුන් වහන්සේ පළමු පාරාජිකාව කොතැනක දී පනවා වදාළ සේක් ද**" යැයි ඇසීය. උපාලි තෙරුන් වහන්සේ "**ස්වාමීනි, ස්ථවිරයන් වහන්ස, විශාලා මහනුවර දී පනවා වදාළ සේක**" යැයි විසඳුවේ ය. "**කවුරුන් අරබයා පනවා වදාළ සේක් ද**" යැයි ඇසීය. "**කලන්දක පුත්‍ර සුදින්න තෙරුන් අරබයා පනවා වදාළ සේක**" යැයි විසඳුවේ ය. "**කුමන වස්තුවෙහි පනවා වදාළ සේක් ද**" යැයි ඇසීය. "**මෛථුන ධර්ම ප්‍රතිසේවනයෙහි පනවා වදාළ සේක**" යැයි විසඳුවේ ය. ඉන් පසු සියලු දෙනා වහන්සේ ම එකතුව පළමු පාරාජිකා සිකපදය නිදන සහිතව සන සජ්ඣායනා කළහ. මෙලෙස සෙසු ශික්ෂාපදයන් ද, භික්ෂු භික්ෂුණී උභතෝ විභංගය ද, දෙවිසි ඛන්ධකයන් ද, සොළොස් පරිවාරයන් ද සහිත සියලු විනය පිටකය සංගායනා කොට උපාලි තෙරුන් වහන්සේ විජිනිපත තබා ධර්මාසනයෙන් බැස වැඩිහිටි තෙරුන් වහන්සේලා වැඳ තමාට පැමිණි අසුනෙහි වැඩ හුන් සේක.

## ☸ ධර්මය සංගායනා කිරීම

විනය සංගායනාවෙන් අනතුරුව ධර්මය සංගායනා කරනු කැමති මහා කාශ්‍යප තෙරුන් වහන්සේ, භික්ෂු සංඝයා වහන්සේ අමතා "**ධර්මය සංගායනා කරන්නා වූ අප විසින් කවුරුන් ප්‍රධාන කොට ගෙන කළ යුතු ද**" යැයි අසා සිටියේය. භික්ෂූන් වහන්සේලා "**ස්වාමීනි, ස්ථවිරයන් වහන්ස, මේ ආනන්ද තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි බොහෝ ධර්මයන් ඉගෙන ගත්තෙකි. භාග්‍යවතුන් වහන්සේ විසින් කරුණු පසකින් අග්‍ර ස්ථානයෙහි තබන ලද්දෙහි ය. එබැවින් මේ ආනන්ද තෙරුන් වහන්සේ ප්‍රධාන කොට ගෙන**

**සංගායනා කරමු**" යැයි කීහ. ඉන් පසු කාශ්‍යප තෙරුන් වහන්සේ ධර්මය විචාරීමට "**සුණාතු මෙ, ආවුසො, සඞෙඝා. යදි සඞඝසස පතතකලලං, අහං ආයසමනතං ආනනදං ධමමං පුචෙඡයයං**" යනුවෙන් තමන් වහන්සේ ම සම්මත කරගෙන ථේරාසනයෙහි වැඩසිටි සේක. ආනන්ද තෙරුන් වහන්සේ ධර්මය විසඳීමට "**සුණාතු මෙ, භනෙත, සඞෙඝා. යදි සඞඝසස පතතකලලං, අහං ආයසමතා මහාකසසපෙන ධමමං පුටෙඨා විසසජෙජයයං**" යනුවෙන් තමන් වහන්සේ ම සම්මත කරගෙන අසුනින් නැඟිට සිවුර ගැට වටු ගන්වා ගෙන වැඩිහිටි ස්ථවිර භික්ෂූන් වහන්සේලා වැඳ විජිනිපත ගෙන ධර්මාසනයෙහි වැඩ හුන් සේක. මහා කාශ්‍යප තෙරුන් වහන්සේ ආනන්ද තෙරුන් වහන්සේගෙන් මෙසේ ධර්මය විචාළ සේක.

"**ඇවැත්නි, ආනන්දය, භාග්‍යවතුන්** වහන්සේ **බ්‍රහ්ම ජාල සූත්‍රය කොතැනක දී දේශනා කොට වදාළ සේක් ද**" යැයි ඇසීය. ආනන්ද තෙරුන් වහන්සේ, "**ස්වාමීනි, ස්ථවිරයන් වහන්ස, රජගහ නුවරටත් නාලන්ද නුවරටත් අතර අම්බලට්ඨිකා රජ උයනෙහි වූ රාජාගාරයෙහිදී දේශනා කොට වදාළ සේක**" යැයි විසඳුවේ ය. "**කවුරුන් අරබයා දේශනා කොට වදාළ සේක් ද**" යැයි ඇසීය. "**ස්ථවිරයන් වහන්ස, සුප්පිය පරිබ්‍රාජකයා හා බ්‍රහ්මදත්ත මානවකයා අරබයා දේශනා කොට වදාළ සේක**" යැයි විසඳුවේ ය. මෙසේ බ්‍රහ්ම ජාල සූත්‍රයෙහි නිදානය ද විචාළහ. පුද්ගලයා ද විචාළහ. ඉන් පසු "**ඇවැත්නි, ආනන්දය, භාග්‍යවතුන් වහන්සේ සාමඤ්ඤ ඵල සූත්‍රය කොතැනක දී දේශනා කොට වදාළ සේක් ද**" යැයි ඇසීය. ආනන්ද තෙරුන් වහන්සේ, "**ස්වාමීනි, ස්ථවිරයන් වහන්ස, රජගහ නුවර ජීවක අඹ වනයෙහි දී දේශනා කොට වදාළ සේක**" යැයි විසඳුවෙහි ය. "**කවුරුන් අරභයා දේශනා කොට වදාළ සේක් ද**" යැයි ඇසීය. "**වේදේහි පුත්‍ර අජාසත්ත රජතුමා අරබයා දේශනා කොට වදාළ සේක**" යැයි විසඳුවෙහි ය. මෙසේ සාමඤ්ඤ ඵල සූත්‍රයෙහි නිදානය ද විචාළහ. පුද්ගලයා ද විචාළහ. මේ ක්‍රමයෙන් සියලු සූත්‍ර පිටකය ද, සියලු අභිධර්ම පිටකය ද සංගායනා කළහ. මෙසේ සංගායනා කරන ලද්දේ වූ ධර්ම විනය විවිධාකාරයෙන් බෙදා දැක්වූහ.

## ☸ ධර්‍ම විනය බෙද දැක්වීම

**මේ සියලු බුද්ධ වචනය රස වශයෙන් එක් වැදෑරුම් වේ. ධර්‍මය විනය වශයෙන් දෙවැදෑරුම් වේ. වචන වශයෙන් තෙවැදෑරුම් වේ. පිටක වශයෙන් ද තෙවැදෑරුම් වේ. නිකාය වශයෙන් පස් වැදෑරුම් වේ. අංග වශයෙන් නව වැදෑරුම් වේ. ධර්‍මස්කන්ධ වශයෙන් සුවාසූ දහසක් (84,000) වේ.**

**✠ බුද්ධ වචනය රස වශයෙන් එක් වැදෑරුම් වන්නේ කෙසේ ද?**

භාග්‍යවතුන් වහන්සේ අනුත්තර සම්මා සම්බෝධියට පැමිණ දම්සක් සූත්‍රය පැවැත්වීමේ පටන් පිරිනිවන් මඤ්චකය දක්වා වදළ සියලු බුද්ධ වචනය, මහා සමුද්‍රයෙහි කොතැනින් ජල බිඳක් ගත්තේ ද එකම ලුණු රසය වන්නා සේ, දහම් පදයක් පාසා ම සත්වයන් නිවනට පමුණුවන ගුණයෙන් යුක්ත බැවින් නිවන් රසයෙන් යුක්ත ය.

**✠ ධර්‍ම විනය වශයෙන් දෙ වැදෑරුම් වන්නේ කෙසේ ද?**

කාය වාක් සංවරය පිණිස පනවා වදළ සියලු බුද්ධ වචනය **"විනය"** නම් වේ. සිතෙහි පවත්නා කෙලෙසුන්ගේ තදංග විෂ්කම්භන සමුච්ඡේද වශයෙන් ප්‍රහාණය පිණිස දේශනා කොට වදළ අවශේෂ බුද්ධ වචනය **"ධර්‍ම"** නම් වේ.

**✠ වචන වශයෙන් තෙවැදෑරුම් වන්නේ කෙසේ ද?**

බුදු බවට පැමිණ පටිච්ච සමුප්පාද හේතුඵල ධර්‍මය අනුලෝම ප්‍රතිලෝම වශයෙන් මනසිකාර කිරීමෙන් ඇති වූ පහන් සංවේගය වචන බවට පෙරලී ප්‍රථමයෙන් ම බුදු මුවින් පිටවුණු :-

**"අනෙක ජාති සංසාරං - සන්ධාවිස්සං අනිබ්බිසං,**
**ගහකාරකං ගවෙසන්තො - දුක්ඛා ජාති පුනප්පුනං"**

"ගහකාරක දිට්ඨොසි - පුන ගෙහං න කාහසි,
සබ්බා තෙ ඵාසුකා භග්ගා - ගහකූටං විසඞ්ඛතං,
විසඞ්ඛාරගතං චිත්තං - තණ්හානං ඛයමජ්ඣගා"ති.

යන මේ ගාථා දෙක ප්‍රථම බුද්ධ වචනයයි.

පරිනිර්වාණ මඤ්චකයෙහි සැතපී අවසාන වශයෙන් වදාළ **"හන්දදානි, භික්ඛවෙ, ආමන්තයාමි වො, වයධම්මා සඞ්ඛාරා, අප්පමාදෙන සම්පාදෙථ"** යන මෙය අන්තිම බුද්ධ වචනයයි. මේ අතරතුර පන්සාළිස් වසක් මුළුල්ලෙහි වදාළ සියල්ල මධ්‍යම බුද්ධ වචනයයි.

### ✠ පිටක වශයෙන් තෙවැදෑරුම් වන්නේ කෙසේ ද?

ප්‍රථම සංගායනාවේ දී සංගායනාවට නැගුණා වූ ද, නො නැගුණා වූ ද සියල්ල එක් කොට **"උභය ප්‍රාතිමෝක්ෂය, උභය විභංගය, දෙවිසි කඳුවත්, සෝළස පරිවාර"** යන මේ සියල්ල **"විනය පිටකය"** නම් වේ. **"දීඝ නිකාය, මජ්ඣිම නිකාය, සංයුත්ත නිකාය, අංගුත්තර නිකාය, ඛුද්දක නිකාය"** යන මේ සියල්ල **"සූත්‍ර පිටකය"** නම් වේ. **"ධම්මසංගණී, විභංග, ධාතු කථා, පුග්ගල පඤ්ඤත්ති, කථා වත්ථු, යමක, පට්ඨාන"** යන ප්‍රකරණ සත **"අභිධර්ම පිටකය"** නම් වේ.

### ✠ නිකාය වශයෙන් පස් වැදෑරුම් වන්නේ කෙසේ ද?

බ්‍රහ්මජාල සූත්‍රයෙහි පටන් දීඝ වූ සූත්‍ර තිස්හතරක් ඇති වර්ග තුනකින් යුත් සංග්‍රහය **"දීඝනිකාය"** නම් වේ. මූලපරියාය සූත්‍රයෙහි පටන් මධ්‍යම ප්‍රමාණයෙන් යුත් සූත්‍ර එකසිය දෙපණසකින් යුක්ත වූ වර්ග පසළොසකින් යුත් සංග්‍රහය **"මජ්ඣිම නිකාය"** නම් වේ. ඔඝතරණ සූත්‍රයෙහි පටන් සත් දහස් සත්සිය දෙසැටක් (7762) සූත්‍ර ඇති සංයුත්ත පනස් හයකින් යුත් සංග්‍රහය **"සංයුත්ත නිකාය"** නම් වේ. චිත්ත පරියාදය සූත්‍රයෙහි පටන් සූත්‍ර නවදහස් පන්සිය සත්පනසකින් (9557) යුත් වර්ග එකසිය සත් සැත්තෑවක් ඇති නිපාත එකොළොසකින් යුත් සංග්‍රහය **"අංගුත්තර නිකාය"** නම් වේ. එසේම මේ නිකාය සතරට ඇතුළත් නොවූ **"ඛුද්දකපාඨ, ධම්මපද, උදාන, ඉතිවුත්තක, සුත්තනිපාත,**

**විමානවත්ථු පෙතවත්ථු, ථෙරගාථා, ථෙරිගාථා, පටිසම්භිද, අපදන, ජාතක, නිද්දේස, බුද්ධවංස, චරියා පිටක"** යන කුඩා ග්‍රන්ථ පසළොසද, **"විනය පිටකය හා අභිධර්‍ම පිටකය"** යන දෙක ද ඇතුළත් ව මේ සියල්ල **"ඛුද්දක නිකාය"** නම් වේ. මෙසේ නිකාය වශයෙන් පස් වැදෑරුම් වේ.

✠ **අංග වශයෙන් නව වැදෑරුම් වන්නේ කෙසේ ද?,**

**"සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදන, ඉතිවුත්තක, ජාතක, අබ්භූතධම්ම, වෙදල්ල"** යන මේ නවයයි. මෙය **"නවාංග ශාස්තෘ ශාසනය"** නම් වේ.

- ❖ **"උභතෝ විභංගය, නිද්දේස, ඛන්ධක, පරිවාර"** යන මේවා ද, සුත්ත නිපාතයෙහි ඇතුළත් **"මංගල සූත්‍රය, රතන සූත්‍රය, නාලක සූත්‍රය, තුවටක සූත්‍රය"** ආදී සූත්‍ර නාමයෙන් දක්වෙන සියලු බුද්ධ වචනය **"සුත්ත"** නම් වේ.
- ❖ සියලු ගාථා සහිත සූත්‍ර **"ගෙය්‍ය"** නම් වේ. සංයුත්ත නිකායෙහි සගාථ වර්‍ගය ද, අන් සියලු සගාථ සූත්‍රයන් ද මෙහි ඇතුළත් වේ.
- ❖ සියලු අභිධර්‍ම පිටකය ද, සියලු නිර්‍ගාථක සූත්‍රයන් ද, අන් අංග අටෙහි සංග්‍රහ නොවූ සියලු බුද්ධ වචනය ද **"වෙය්‍යාකරණ"** නම් වේ.
- ❖ **"ධම්මපද, ථෙර ගාථා, ථෙරි ගාථා"** යන මේවා ද, සුත්ත නිපාතයෙහි සූත්‍ර සංඛ්‍යාවට නො ගැනෙන ගාථා වශයෙන් ඇති සියල්ල ද **"ගාථා"** නම් වේ.
- ❖ සොම්නස් සහගත සිතින් උපන් ගාථාවන්ගෙන් ප්‍රතිසංයුක්ත දෙයසූවක් (82) සූත්‍ර **"උදන"** නම් වේ.
- ❖ **"වුත්තඤ්හෙතං භගවතා"** ආදී ලෙස නැවත දේශනා කරන ලද එකසිය දෙළොසක් සූත්‍ර **"ඉතිවුත්තක"** නම් වේ.
- ❖ අපණ්ණක ජාතකය ආදී කරුණක් ඇති කල්හි ම දේශනා කරන ලද පන්සිය පණසක් පමණ පූර්‍ව බෝධිසත්ව චර්‍යාවන් **"ජාතක"** නම් වේ.

- **"චත්තාරො'මෙ භික්ඛවෙ, අච්ඡරියා අබ්භූතා ධම්මා ආනන්දෙ"** යනාදී ලෙස පැවති සියලු ම ආශ්චර්ය අද්භූත ධර්මයන්ගෙන් ප්‍රතිසංයුක්ත සූත්‍ර දේශනා **"අබ්භූතධම්ම"** නම් වේ.
- **"චූළවෙදල්ල සූත්‍රය, මහාවෙදල්ල සූත්‍රය, සම්මා දිට්ඨි සූත්‍රය, සක්කපඤ්හ සූත්‍රය, සංඛාර භාජනීය සූත්‍රය, මහා පුණ්ණම සූත්‍රය"** ආදී සංවාද ස්වරූපයෙන් නුවණත් සතුටත් ලබමින් විචාරන ලදුව වදාළ සියලු සූත්‍ර **"වෙදල්ල"** නම් වේ.

**✠ ධර්මස්කන්ධ වශයෙන් සුවාසූදහසක් වන්නේ කෙසේ ද?,**

ධර්ම සංගායනාවේ දී ආනන්ද තෙරුන් වහන්සේ විසින් මෙසේ වදරන ලද්දේ ය.

**"ද්වාසීති බුද්ධතො ගණ්හිං - ද්වෙ සහස්සානි භික්ඛුතො,**
**චතුරාසීති සහස්සානි - යෙ මෙ ධම්මා පවත්තිනො"**

**"මම, භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි දී ධර්මස්කන්ධ දෙයසූදහසක් උගතිමි. සැරියුත්, මුගලන් ආදී මහ රහතන් වහන්සේලා සමීපයෙහි දී ධර්මස්කන්ධ දෙදහසක් උගතිමි. මෙසේ මාගේ සිතෙහි ධරන්නා වූ ධර්මය ප්‍රමාණ වශයෙන් සුවාසූ දහසකි"** යැයි වදළේ ය.

එහි එක් අනු සන්ධියක් ඇති සූත්‍රයක් එක ධර්මස්කන්ධයකි. අනු සන්ධි බොහෝ ඇති සූත්‍රයන්හි ඒ අනු සන්ධි ගණනින් ධර්මස්කන්ධ ගණන් ගත යුතුය. දෙවියන් විසින් **"කති ඡින්දෙ කති ජහෙ"** යනාදී ලෙස ප්‍රශ්න ඉදිරිපත් කිරීමේ දී ඒ ප්‍රශ්න ගාථාවක් එක ධර්මස්කන්ධයකි. එයට භාග්‍යවතුන් වහන්සේ **"පඤ්ච ඡින්දෙ පඤ්ච ජහෙ"** යනාදී ලෙස වදාළ පිළිතුරු ගාථාව එක ධර්මස්කන්ධයකි. අභිධර්මයෙහි දුක මාතිකා, තික මාතිකාවන් බෙදීම ද, එක චිත්තවාර බෙදීම ද, එක එක ධර්මස්කන්ධ වේ. විනයෙහි වස්තු ඇත, මාතෘකා ඇත, පද භාජනීය ඇත, අන්තරාපත්ති ඇත, ආපත්ති ඇත, අනාපත්ති ඇත, තික පරිච්ඡේද ඇත. එහි එක එක කොට්ඨාශ එක ධර්මස්කන්ධ වේ. මෙසේ සියල්ල එකතුව ධර්මස්කන්ධ වශයෙන් (84,000) සුවාසූ දහසකි.

# ❄ ලෝකාණුවිචරණ සූත්‍ර සංගායනාව

පඤ්චසතික සංගායනාවේ දී මූලාසනයෙහි වැඩසිටි මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ අසන සේක් **"ආනන්දය, තථාගතයන් වහන්සේ මෙම ලෝකාණුවිචරණ සූත්‍රය කොතැනක දි දේශනා කළ සේක් ද?"** ධර්මාසනයෙහි වැඩ සිටියා වූ ආනන්ද මහ රහතන් වහන්සේ එය විසඳන සේක් **"ස්වාමීනි කාශ්‍යප ස්ථවිරයන් වහන්ස, සැවැත් නුවර ජේතවනය නම් වූ අනාථපිණ්ඩික මහ සිටුතුමා විසින් සාදවා පූජා කරන ලද ආරාමයෙහි දී දේශනා කොට වදාළ සේක"** යැයි කීවේය. මහා කාශ්‍යප රහතන් වහන්සේ **"ආනන්දය, කවුරුන් අරභයා වදාළ සේක් ද"** යැයි ඇසුවේ ය. ආනන්ද තෙරුන් වහන්සේ **"ස්වාමීනි කාශ්‍යප ස්ථවිරයන් වහන්ස, භික්ෂූන් වහන්සේලා අරභයා වදාළ සේක"** යැයි කීවේය. මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ **"කුමන කරුණක් හේතුකොටගෙන වදාළ සේක් ද"** යැයි ඇසුවේ ය. ආනන්ද තෙරුන් වහන්සේ **"ස්වාමීනි ස්ථවිරයන් වහන්ස, දම් සභා මණ්ඩපයට ධර්මශ්‍රවණය පිණිස රැස් වූ අවස්ථාවක දේශනා කොට වදාළ සේක"** යැයි කීවේ ය.

බුද්ධ උපස්ථායක වූ ධර්ම භාණ්ඩාගාරික ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි දී ඉගෙන ගන්නා ලද මේ සූත්‍රය සම්බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසක් ගත වූ තැන දී මහා කාරුණික වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ අධිෂ්ඨානය පරිදි මේ උතුම් සද්ධර්මය වෛනෙය්‍ය ජනයාගේ ප්‍රයෝජනය පිණිස බොහෝ කලක් පැවැත්මට භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි දී ඉගෙන ගත් බව දැක්වීමට මෙසේ ඉදිරිපත් කළේ ය. එහි පිළිවෙළ කථාව මෙසේය.

## ☸ නිසි බුද්ධෝපස්ථායෙකු නොවීම

ප්‍රථම බෝධිය වූ විසි වර්ෂය තුළ තථාගතයන් වහන්සේට නිත්‍ය උපස්ථායකයෙකු නොවී ය. ඒ කාලපරිච්ඡේදයෙහි දී **"නාගසමාල, නාගිත, උපවාන, සුනක්ඛත්ත, චුන්ද සාමණේර, සාගත, රාධ, මේඝිය"**

**යන තෙරුන් වහන්සේලා ද ඇතැම් විටෙක "ආනන්ද තෙරණුවෝ" ද** උපස්ථාන කළහ.

එක් දිනක් භාග්‍යවතුන් වහන්සේ, නාගසමාල තෙරුන් වහන්සේ උපස්ථායක කොට දීඝී මාගීයට පිළිපන්නේ දෙමන් සන්දියකට පැමිණ, එයින් එක් මගකින් වැඩි සේක. එවිට නාගසමාල තෙරුන් වහන්සේ **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, අපි මේ මගින් වඩිමු"** යැයි කීවේ ය. එවිට භාග්‍යවතුන් වහන්සේ **"නැත මහණ, මා විසින් මේ මාගීයෙන් යා යුතුය"** යැයි වදළ සේක. මෙසේ භාග්‍යවතුන් වහන්සේ තුන් වතාවක් වදළ නමුත් නාගසමාල තෙරණුවෝ **"එසේ නම් භාග්‍යවතුන් වහන්ස, පාත්‍ර චීවර ගත මැනව"** යැයි කියා භාග්‍යවතුන් වහන්සේ ගේ පාත්‍ර චීවර බිම තබා ගියේය. පසුව භාග්‍යවතුන් වහන්සේ තම පාත්‍ර චීවර ගෙන එකලාව වැඩි සේක. අන් මගින් ගිය නාගසමාල තෙරුන් වනයෙහි දී සොරුන්ට හසු වූහ. පාත්‍ර චීවර ද පැහැර ගත්හ, හිස ද පැළූහ. ඉන් පසු තෙරණුවෝ **"මට භාග්‍යවතුන් වහන්සේ හැර අන් පිහිටක් නැත"** යැයි සිතා භාග්‍යවතුන් වහන්සේ සොයා ආයේ ය. භාග්‍යවතුන් වහන්සේ මේ කිම් ද යැයි ඇසූ සේක. තෙරණුවෝ සිදු වූ සියල්ල කීවේය. භාග්‍යවතුන් වහන්සේ **"මහණ, ඔය කරුණ දැනගෙන ම ඒ මගින් යෑම වැළකුවෙමි"** යැයි වදළ සේක.

එසේම තවත් දිනක භාග්‍යවතුන් වහන්සේ මේඝිය තෙරුන් වහන්සේ උපස්ථායකයෙකු වශයෙන් කැඳවාගෙන පාචීනවංශ මුව වනයෙහි ජන්තු නම් ගමට වැඩි සේක. එහි පිඬු සිඟා ගිය මේඝිය තෙරුන් වහන්සේ අලංකාර වූ අඹ වනයක් දැක භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ මෙසේ කීවේය. **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ගේ පාත්‍ර චීවර බාර ගන්නා සේක්වා. මම මේ වනයට ගොස් මහණ දම් පුරමි"** යැයි කීවේය. භාග්‍යවතුන් වහන්සේ තුන් වතාවක් ම වැළකූ නමුත් ගියේය. ඉන් පසු භාග්‍යවතුන් වහන්සේ තම පාත්‍ර චීවර රැගෙන එකලාව ම වැඩි සේක. තෙරණුවෝ ඒ අඹ වනයට ගොස් භාවනාවට පටන් ගත්තේ ය. එහෙත් සුළු වේලාවකින් ම අකුසල විතර්කයන්ගෙන් පීඩිත ව මට භාග්‍යවතුන් වහන්සේ හැර අන් පිහිටක් නැතැයි සිතා භාග්‍යවතුන් වහන්සේ සොයා ආයේ ය.

භාග්‍යවතුන් වහන්සේ "**මේසිය, මම ඔය කරුණ දැනගෙන ම ඒ ගමන වැළකුවෙමි**" යැයි වදාළ සේක.

## ☸ නිත්‍ය උපස්ථායෙකු පත් කර ගැනීම

පසු කාලයෙහි බුද්ධත්වයෙන් විසිවන වර්‍ෂයෙහි දී සැවැත්නුවර ජේතවනාරාමයට වැඩියා වූ භාග්‍යවතුන් වහන්සේ, අග්‍ර ශ්‍රාවක, අසූ මහා ශ්‍රාවක මහ රහතන් වහන්සේලා ප්‍රධාන විශාල භික්ෂූන් වහන්සේලා පිරිසක් පිරිවරා උතුම් බුද්ධාසනයෙහි වැඩ හිඳිමින්, මෙසේ වදාළ සේක. "**මහණෙනි, මම දැන් වයෝවෘධයෙමි. මට උපස්ථානයට පැමිණෙන ඇතැම් භික්ෂූන් වහන්සේලා මේ මගින් යමු යැයි කී විට, නැත භාග්‍යවතුන් වහන්ස, මේ මගින් යමු යැයි කියා මගේ පාත්‍ර චීවර බිම දමා යති. එබැවින් මා හට නිත්‍ය උපස්ථායකයෙකු සම්මත කෙරේවා**" යැයි භික්ෂු සංඝයාට පැවරූ සේක. එවිට මහා සංඝයා හට මහත් සංවේගයක් ඇතිවූහ.

එවේලෙහි සැරියුත් මහ රහතන් වහන්සේ නැගිට චීවරය ගැට වටු කොට පොරවා ගෙන භාග්‍යවතුන් වහන්සේට අභිවාදනය කොට "**ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේ ම ප්‍රාර්ථනා කරගෙන ඒකාසංඛ්‍යය කල්ප ලක්‍ෂයක් පෙරුම් දම් පිරුවෙමි. මා වැනි වූ මහත් ප්‍රඥවන්තයෙකු උපස්ථානයට සුදුසු නොවන්නෙහි ද? මම භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන කරමි**" යැයි කීවේ ය.

භාග්‍යවතුන් වහන්සේ එය අසා "**කම් නැත සාරිපුත්‍රය, නුඹ යම් දිශාවක වාසය කරන්නේ ද, ඒ දිශාව නොසිස් ය. එබැවින් ඔබගෙන් උවටැන් කරවා ගැනීමක් අවශ්‍ය නැත**" යැයි ප්‍රතික්ෂේප කළහ. මෙසේ මුගලන් මහ රහතන් වහන්සේ, මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ ආදී මහ රහතන් වහන්සේලා ද, වෙන වෙනම උපස්ථානය ඉල්ලා සිටියහ. භාග්‍යවතුන් වහන්සේ ඒ සියලු දෙනා වහන්සේගේ ම ඉල්ලීම ප්‍රතික්ෂේප කළ සේක. එසේ වුව ද ආනන්ද තෙරුන් වහන්සේ නිහඬව ම සිටියේය. එවිට අන් භික්ෂූන් වහන්සේලා ආනන්ද තෙරුන් වහන්සේ අමතා "**ආනන්දය, ඔබ භාග්‍යවතුන් වහන්සේ වෙතින් උපස්ථායක තනතුර ඉල්ලා ගනු ව**" යැයි කීහ. එවිට ආනන්ද තෙරුන් වහන්සේ

**"ඇවැත්නි, ඉල්ලා ගත් තනතුරු කෙබඳු වේද? කිම, භාග්‍යවතුන් වහන්සේ මා නොදක්නා සේක් ද, භාග්‍යවතුන් වහන්සේ කැමති වන සේක් නම් ආනන්දය, මට උපස්ථාන කරන්න"** යැයි වදරන සේක යැයි කීවේය. එවිට භාග්‍යවතුන් වහන්සේ **"මහණෙනි, ආනන්ද අනුන් විසින් උත්සාහ කළ යුත්තෙකු නොවේ. තමන් ම ඒ බව දැන මට උපස්ථාන කරන්නේය"** යැයි වදාළහ. එවිට භික්ෂූන් වහන්සේලා **"ආනන්දය, නැඟී සිටින්න දස බලධාරීන් වහන්සේ ගේ උපස්ථානය ඉල්ලන්න"** යැයි කිහ. එවිට ආනන්ද තෙරුන් වහන්සේ නැඟිට චීවරය ගැට වටු ගන්වා පොරවා ගෙන භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ ඇඳිලි බැඳ ප්‍රතික්ෂේප කිරීම් සතරක් ඉල්ලා සිටියේ ය.

## ☸ ප්‍රතික්ෂේප සතර

1. භාග්‍යවතුන් වහන්සේට ලැබෙන චීවර මට නො දෙන සේක්වා.
2. භාග්‍යවතුන් වහන්සේට ලැබෙන පිණ්ඩපාතය මට නො දෙන සේක්වා.
3. භාග්‍යවතුන් වහන්සේ සමග එක ගඳකිළියෙහි විසීමට මට අවසර නො දෙන සේක්වා.
4. භාග්‍යවතුන් පිළිගත් ආරාධනාවලට මා කැඳවා ගෙන නො යන සේක්වා.

**"භාග්‍යවතුන් වහන්සේ මේ ප්‍රතික්ෂේප සතර පිළිගන්නා සේක් නම් මම උපස්ථාන කරමි"** යැයි කීවේය. එවිට භාග්‍යවතුන් වහන්සේ, **"ආනන්දය, නුඹ කවර ආදීනවයක් දැක මේ ප්‍රතික්ෂේප සතර ඉල්ලන්නෙහි ද"** යැයි අසා වදාළහ. එවිට ආනන්ද තෙරුන් වහන්සේ, **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ඇතැම් කෙනෙක් ආනන්ද තෙරුන් ලාභ අපේක්ෂාවෙන් භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන කරන්නේය යැයි මේ වචනය කියන්නේ ය. එබැවින් මේ ප්‍රතික්ෂේප සතර ඉල්ලමි"** යැයි කීවේය. නැවත මේ ආයාචනා සතර ද ඉල්ලා සිටියේය.

## ☸ ආයාචනා සතර

1. මා විසින් බාර ගත් දන ආරාධනාවලට භාග්‍යවතුන් වහන්සේ වඩින සේක්වා.
2. භාග්‍යවතුන් වහන්සේ දැකීමට පිටතින් පැමිණෙන පැවිදි ගිහි ආගන්තුකයන් පමා නොවී භාග්‍යවතුන් වහන්සේ වෙත යොමු කරවීමට මට අවසරය දෙන සේක්වා.
3. ධර්මය විනය පිළිබඳව සැකයක් උපන් විගස ඒ මොහොතෙහි දීම එය විසඳ ගැනීමට භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණීමට මට අවසරය දෙන සේක්වා.
4. භාග්‍යවතුන් වහන්සේ මා නැති තැනක දී දේශනා කරන ධර්මයන් නැවත මා හට දේශනා කරන සේක්වා.

**"භාග්‍යවතුන් වහන්සේ මේ ආයාචන සතර පිළිගන්නා සේක් නම් මම උපස්ථාන කරමි"** යැයි කීවේය. එවිට භාග්‍යවතුන් වහන්සේ **"ආනන්දය, නුඹ කුමන ආනිසංසයක් දැක මේ ආයාචන සතර ඉල්ලන්නෙහි ද"** යැයි අසා වදාළහ. එවිට ආනන්ද තෙරුන් වහන්සේ, **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, සැදැහැවත් සත්පුරුෂයෝ භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි අවකාශ නොලැබ මා හමුවට පැමිණ, ස්වාමීනි! ආනන්ද ස්ථවිරයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ සමග හෙට මාගේ ගෙයි දනට වඩින සේක්වා"** යැයි ආරාධනා කොට යයි. භාග්‍යවතුන් වහන්සේට එයට අවකාශ නැති විට ඒ සත්පුරුෂයන් භාග්‍යවතුන් වහන්සේ හමුවට පමුණුවාලීමටත් සැක දුරුකර ගැනීමටත් අවකාශ ලබති. එසේ නො ලැබුණු කල්හි **"කුමකට නම් මේ ආනන්ද තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ ගේ උපස්ථායක වූයෙහි ද, අපට මෙපමණ කුඩු අනුග්‍රහයක් නැත"** යැයි දෙස් නගන්නේ ය.

තව ද භාග්‍යවතුන් වහන්සේ නැති විටෙක ඇතැම් සත්පුරුෂයෝ මා හමුවට පැමිණ **"ඇවැත්නි, මේ සූත්‍රය, මේ ජාතකය, මේ ගාථාව භාග්‍යවතුන් වහන්සේ කොතැනක දී දේශනා කළ සේක් ද"** යැයි මගෙන් ඇසුව හොත් එය කිව යුතු වන්නේය. නොහැකි වුව හොත් **"මේ ආනන්ද තෙරුන් වහන්සේ කුමකට නම් භාග්‍යවතුන්**

**වහන්සේගේ සෙවණැල්ල මෙන් පාත්‍ර චීවර ගෙන යමින් පසුපස ඇවිද්දෙහි ද? මෙපමණ වත් දෙයක් නො දන්නෙහි ද?"** යැයි මා හට දෙස් නගන්නේ ය. එබැවින් මේ ආනිශංස දැක මා නැති තැන දෙසූ ධර්‍මයන් නැවත මා හට දේශනා කරන ලෙස ඉල්ලමි යැයි කීවේය. භාග්‍යවතුන් වහන්සේ එම ඉල්ලීම් අට පිළිගෙන උපස්ථායක තනතුර දුන් සේක. එතැන් පටන් ආනන්ද තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ නිත්‍ය උපස්ථායක වූයේ ය.

මේ ආනන්ද තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට උපස්ථායක වීමට කල්ප ලක්‍ෂයක් මුළුල්ලෙහි පුරන ලද පාරමිතා ගුණ ඇති මහෝත්තමයෙකි. මේ වරය ලත් දින පටන් ඇල් පැන් උණු පැන් දැහැටි සපයමින්, පිට පිරිමදිමින්, පාද පිරිමදිමින්, ගඳකිළි පිරිවෙන අමදිමින්, මේ වේලාවෙහි භාග්‍යවතුන් වහන්සේට මේ දෙය ලැබෙන්නට වටී ය, මේ වේලාවෙහි මේ දෙය කරන්නට වටී ය යැයි දවස මුළුල්ලෙහි ම බුද්ධෝපස්ථානයෙහි යෙදී සිටියේය. එසේම රාත්‍රී කාලයෙහි දඬු වැට පහනක් ගෙන නව වාරයක් භාග්‍යවතුන් වහන්සේ සැතපුණු ගඳකිළිය වටා ඇවිදින්නේ ය. මෙසේ කරන්නේ භාග්‍යවතුන් වහන්සේ මා ඇමතූ විටෙක නිදි බර ව සිටියේ නම්, එවිට ප්‍රති උත්තර දීමට නොහැකි වන්නේය යැයි ඒ පහන අතින් නුමුදා ම රෑ පහන් කරන්නේය. මෙසේ මහත් ගුණ ඇති ආනන්ද තෙරුන් වහන්සේ මේ බුදු සසුනෙහි **"බහුශ්‍රැත භික්ෂූන් අතර අග්‍ර වූහ. සතිමන්ත භික්ෂූන් අතර අග්‍ර වූහ. ගතිමන්ත භික්ෂූන් අතර අග්‍ර වූහ. ධෘතිමන්ත භික්ෂූන් අතර අග්‍ර වූහ. බුද්ධ උපස්ථායක භික්ෂූන් අතර අග්‍ර වූහ"**. මෙසේ අග්‍ර ස්ථානාන්තර පසකින් පිදුම් ලැබූහ.

ඒ මේ ආනන්ද තෙරුන් වහන්සේට එක් වරකට බණවර හැටක් (ගාථා පසළොස් දහසක්) ධාරණය වන්නේය. එය දීඝ නිකාය තරම් වූ ප්‍රමාණයකි. වසර විසි පහක් ම භාග්‍යවතුන් වහන්සේ පසුපස යමින් බොහෝ ධර්‍මයන් ඉගෙන ගත්තේ ය. ඒ නිසාම පඤ්චසතික සංගායනාවෙහි දී ආනන්ද තෙරණුවෝ :-

**"ද්වාසීති බුද්ධතො ගණ්හිං - ද්වෙ සහස්සානි භික්ඛුතො,**
**චතුරාසීති සහස්සානි - යෙ මෙ ධම්මා පවත්තිනො"**

යනුවෙන් **"මම භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි දී ධර්මස්කන්ධ දෙයාසූ දහසක් (82,000) උගතිමි. සැරියුත් මුගලන් ආදී මහ රහතන් වහන්සේලා සමීපයෙහි දී ධර්මස්කන්ධ දෙදහසක් උගතිමි. මෙසේ මාගේ සිතෙහි ධරන්නා වූ ධර්මය ප්‍රමාණ වශයෙන් සුවාසූ දහසකි (84,000)"** යැයි වදළේය.

මෙසේ ත්‍රිපිටක බුද්ධ වචනයෙන් බොහෝ දෑ භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි දී ඉගෙන ගන්නා ලද මේ ආනන්ද තෙරුන් වහන්සේ එම ධර්ම සංගීතියෙහි දී **"ලෝකාණුවිචරණ සූත්‍රය"** නමින් මෙසේ සංගායනාවට නැගූහ. එහි අර්ථ විවරණය මෙසේය.

**"එවං මෙ සුතං"** මා විසින් මෙසේ අසන ලදි. මෙය වනාහි මා විසින් අවබෝධ නොකරන ලද්දකි. ප්‍රත්‍යක්ෂ නොකරන ලද්දකි. යනුවෙන් තමන් වහන්සේ අත්හැර, මෙය මා විසින් භාග්‍යවතුන් වහන්සේ වෙතින් ම උගත්තෙමි යැයි අවධාරණය කොට දක්වන්නේය.

**"එවං"** යනුවෙන් තථාගතයන් වහන්සේ විසින් මාගේ ශාසනයෙහි බහුශ්‍රැත භික්ෂූන් අතර ද, යහපත් පැවතුම් ඇති භික්ෂූන් අතර ද, මනා සිහිය ඇති භික්ෂූන් අතර ද, ධාරණ ශක්තිය ඇති භික්ෂූන් අතර ද, උපස්ථායක භික්ෂූන් අතර ද මේ ආනන්ද තෙරුන් වහන්සේ අග්‍ර යැයි වදළ බුද්ධ වචනයට අනුරූප වූ තමන්ගේ ධාරණ ශක්තිය දක්වමින් **"මා විසින් මෙසේ අසන ලදි. එය ද අර්ථ වශයෙන් ද ව්‍යඤ්ජන වශයෙන් ද නො අඩුය. නො වැඩිය. මෙය මෙසේ ම මිස අන් අයුරකින් නො දත යුතුය"** යැයි සත්වයන් ගේ ඇසීමේ කැමැත්ත උපදවයි.

**"මෙ"** යනු මා විසින් යනුයි. භාග්‍යවතුන් වහන්සේ යම් සේ දේශනා කළ සේක ද, එසේම මා විසින් අඩු වැඩි නොකර වෙනස් නොකර මා විසින් ම භාග්‍යවතුන් වහන්සේ වෙතින් උගත්තෙමි යනුවෙන් දක්වමින් භාග්‍යවතුන් වහන්සේ මේ ධර්මය දේශනා කළ ධර්ම ශාස්තෘවරයාණන් වහන්සේ වශයෙන් දක්වා තමන් ශ්‍රාවකයෙකු කොට දක්වයි.

**"සුතං"** යනු අසන ලදි යනුයි. ඒ ඇසීම වනාහි අනිකෙකු භාග්‍යවතුන් වහන්සේගෙන් අසා දැනගෙන මට කීවා නොවේ.

භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි දී මගේ කණින් ම අවධානය යොමු කොට මනා ධර්ම ගෞරවයෙන් ම අසා දැන ගත්තෙමි යැයි දක්වයි.

එසේම මේ ආනන්ද තෙරුන් වහන්සේ වනාහි මිහිරි හඬින් ධර්මදේශනා කරන්නා වූ බහුශ්‍රැත වූ විචිත්‍ර ධර්ම කථිකයෙකි. මේ ආනන්ද තෙරුන් වහන්සේ මෙසේ වාක් චාතුර්යයෙන් යුක්තව මහේශාක්‍ය මහ රහතන් වහන්සේලා ඉදිරියෙහි මේ උතුම් බුද්ධ වචනය සංගායනා කරන කල්හි එය දැකීමට ශ්‍රවණය කිරීමට අප්‍රමාණ දෙවියෝ ද, බ්‍රහ්මයෝ ද රැස් වූහ. ඔවුන් අතරින් ඇතැම් දෙවියන්ට මෙබඳු සැකයක් උපන්හ.

**"තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ ද ශාක්‍ය වංශිකයෙකි. මේ ආනන්ද තෙරුන් වහන්සේ ද ශාක්‍ය වංශිකයෙකි. භාග්‍යවතුන් වහන්සේ ගේ සුළු පියා වූ අමිතෝධන ශාක්‍ය රජතුමාගේ පුත්‍රයා ය. රූපයෙන් ද ස්වරයෙන් ද ශෝභමාන ය. භාග්‍යවතුන් වහන්සේගේ දායාදය ද ලබති. භාග්‍යවතුන් වහන්සේම මේ ආනන්ද තෙරුන් වහන්සේ කරුණු පසකින් අග්‍ර තැන්හි තැබූහ. ඓශ්වර්ය ධර්ම සතරකින් යුක්ත වූවෙකු ද වෙති. සැමට ප්‍රියමනාප වූයේ වේ. දැන් භාග්‍යවතුන් වහන්සේ ගේ ධර්ම දායාදය ලැබ බුදු වූයේ ය"** යැයි සිතූහ. එබැවින් ආනන්ද තෙරුන් වහන්සේ දෙවියන් තුළ වූ ඒ සිත තම සිතින් දැන එසේ වූ අද්භූත වූ ගුණ සම්භාවනාව නො ඉවසන සුළු වූයේ දෙවියන්ට ඇති වූ ඒ රැවටුණු අදහස් දුරු කරමින් ශාස්තෲන් වහන්සේට ඉමහත් ගෞරවය දක්වා තමන්ගේ ශ්‍රාවක බව **"එවං මෙ සුතං"** යනුවෙන් ප්‍රතිඥා කළේ ය.

තවද "එවං මෙ සුතං" යනුවෙන් **"මා විසින් මේ ධර්මය චතු වෛශාරද්‍ය විශාරද වූ, දසබලධාරී වූ, උත්තම ස්ථානයෙහි පිහිටියා වූ, සිංහ නාද සමාන නාද ඇත්තා වූ, සියලු සත්වයන්ට උත්තම වූ, ධර්මේශ්වර වූ, ධර්මරාජ වූ, ධර්මාධිපති වූ, ධර්මද්වීප වූ, ධර්මසරණ වූ, සද්ධර්ම වර චක්‍රවර්ති වූ, සම්මා සම්බුද්ධ වූ භාග්‍යවතුන් වහන්සේ ගේ සම්මුඛයෙන් පිළිගන්නා ලද්දේ වෙමි. මෙහි අර්ථයෙහි හෝ ධර්මයෙහි හෝ පදයෙහි හෝ ව්‍යඤ්ජනයෙහි හෝ සැකයක් හෝ විමතියක් හෝ නොකළ යුතුය"** යැයි සියලු දෙව් මිනිසුන් ගේ මේ ධර්මයෙහි අශ්‍රද්ධාව නසන සේක. ශ්‍රද්ධාව උපදවන සේක.

**"එකං සමයං භගවා සාවත්‍ථියං විහරති ජේතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ"** එක් සමයක භාග්‍යවතුන් වහන්සේ අනාථපිණ්ඩික මහ සිටුතුමා විසින් සාදවා පූජා කරන ලද ජේතවනාරාමයෙහි වැඩසිටි සේක.

මෙහි **"එකං සමයං"** යන මෙහි සංවත්සර, ඍතු, මාස පක්‍ෂ දින පූර්‍වාහ්නය, මධ්‍යාහ්නය, අපරාහ්නය ප්‍රථම යාමය, මධ්‍ය යාමය, පශ්චිම යාමය වශයෙන් කාලය දැක්වීම **"සමය"** නම් වේ. මෙහි සමය බොහෝ වේ. පූරිත පාරමිතා ගුණ ඇති මහ බෝසතාණන් වහන්සේ දසදහසක් ලෝකධාතු වැසි දිව්‍ය බ්‍රහ්මයන්ගේ ආරාධනයෙන් පඤ්ච මහා විලෝකනයන් බලා සුදුසු මව් කුසෙහි පිළිසිඳ ගැනීම **"ගර්භාවක්‍රාන්ති සමය"** නම් වේ. උයනක දී මව් කුසෙන් බිහි වීම **"ජාති සමය"** නම් වේ. එතැන් පටන් සතර පෙර නිමිති දැකීම දක්වා ගිහි ව විසීම **"සංවේග සමය"** නම් වේ. පුතෙකු උපන් දම පැවිදි රුවක් දැක මහාභිනිෂ්ක්‍රමණය කිරීම **"අභිනිෂ්ක්‍රමණ සමය"** නම් වේ. අඩුම තරමින් සත් දිනක් හෝ දුෂ්කර ක්‍රියා කිරීම **"දුෂ්කර ක්‍රියා සමය"** නම් වේ. බෝධි මූලයට වැඩ අපරාජිත පර්‍යංකයෙහි වැඩ හිඳිමින් මාර පරාජය කිරීම **"මාරවිජය සමය"** නම් වේ. ඒ එකම පර්‍යංකයෙහි වැඩ හිඳිමින් තුන් යම් රාත්‍රියෙහි පූර්‍වේනිවාස ඥානය, දිව්‍යශ්‍රෝත ඥානය, ආශ්‍රවක්‍ෂය ඥානය ලැබීමත් සමගම සර්‍වඥතාඥාන ඥාන ප්‍රතිලාභයෙන් අභිසම්බෝධියට පැමිණීම **"අභිසම්බෝධි සමය"** නම් වේ. සත් සති ගත කිරීම ද, නිරෝධ සමාපත්ති, ඵල සමාපත්ති, ධ්‍යාන සමාපත්ති සුව විඳීම ද **"දිට්ඨධම්ම සුඛවිහරණ සමය"** නම් වේ. බ්‍රහ්මාරාධනාවෙන් දම්සක් සූත්‍රය දෙසීමෙහි පටන් ධර්මදේශනා කිරීම **"ධර්මදේශනා සමය"** නම් වේ. සූවිසි කෝටි ලක්‍ෂ වාරයක් නවානුපූර්‍වී විහාර සමාපත්ති සුව විඳ එයින් නැඟී සිට අනුපාදිශේෂ පරිනිර්‍වාණ ධාතුවෙන් පරිනිර්‍වාණයට පැමිණීම **"පරිනිර්‍වාණ සමය"** නම් වේ.

ඒ සමයන් අතර මෙහි **"එකං සමයං"** යනු එක් ධර්ම දේශනා සමයක දී යනුයි. ඒ දේශනා සමය ද, **"ඥාණ කෘත්‍ය, කරුණා කෘත්‍ය"** සමයන් අතර **"කරුණා කෘත්‍ය"** සමයකි. **"ආත්ම හිත ප්‍රතිපත්ති සමය, පරහිත ප්‍රතිපත්ති සමය"** යන ප්‍රතිපත්ති සමයන් අතර **"පරහිත ප්‍රතිපත්ති"** සමයකි. රැස් වූ විට කළ යුතු වූ **"ධර්මකථා සමය, දේශනා**

**ප්‍රතිපත්ති සමය**" යන සමයන් අතර "**ධර්‍මකථා**" **සමයකි**. මේ සියල්ල අතරින් මෙය "**දේශනා සමයකි**".

"**භගවා**" යනු ගුණයෙන් විශිෂ්ට වූ සත්වයන්ට උත්තම වූ ලෞකික ලෝකෝත්තර සැප නිපදවන්නා වූ දන සීලාදී පාරමී භාවයට පැමිණි කුසල් ඇති බැවින් ද, දස ක්ලේශ, අකුශල මූල, දුෂ්චරිත ආදී අනේක විධ වූ ක්ලේශයන් බිඳ හළ බැවින් ද, ඓශ්වර්‍ය්‍ය භාග්‍යා දී කීර්ති ප්‍රශංසාවට ගෞරවයට ලක්වන ගුණයෙන් යුක්ත වන බැවින් ද, අවබෝධ කළ යුතු වූ සියලු ධර්‍ම කුසල ත්‍රික ආදී ලෙස බෙද දක්වූ බැවින් ද "**භගවා**" නම් වන සේක.

තවද මෙහි "**එවං මෙ සුතං**" යන වචනයෙන් ඇසූ පරිදි ඉගෙන ගත් පරිදි ධර්‍මය දේශනා කරන්නා වූ දේශකයෝ භාග්‍යවතුන් වහන්සේගේ ධර්‍ම ශරීරය පමණක්ම දේශනා කරති. එබැවින් "**මේ ධර්‍මය වනාහි ශාස්තෲවරයෙකු නොමැති එකක් නොවේ. මේ නුඹලාගේ ශාස්තෲවරයාය**" යැයි භාග්‍යවතුන් වහන්සේ නො දැකීමෙන් රූපකයෙහි පිරිනිවීම දක්වයි. එමගින් "**මේ ආර්‍ය්‍ය ධර්‍මය දේශනා කරන ලද්ද වූ දසබල ධාරී වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේ ද, වජ්‍ර සමාන කයක් ඇත්තේ නමුදු පරිනිර්‍වාණයට පත් වූ සේක් නම්, එබඳු ශක්තියක් නැති අන්‍යයන් විසින් දුබල ජීවිත කෙරෙහි කුමන කරුණක් හේතුකොටගෙන ජීවිතාශාව ඉපදවිය යුත්තේ ද**" යැයි ජීවිත මදෙන් මත් වූ ජනතාව සංවේගයට පත් කරයි. ඔවුනට සද්ධර්‍මයෙහි උත්සාහ උපදවයි. මෙසේ "**එවං**" යන්නෙන් දේශනා සම්පත්තිය ද "**මෙ සුතං**" යන්නෙන් ශ්‍රාවක සම්පත්තිය ද "**එකං සමයං**" යන්නෙන් කාල සම්පත්තිය ද "**භගවා**" යන්නෙන් දේශක සම්පත්තිය ද දක්වයි.

"**සාවත්‍ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ**" සැවැත් නුවර සමීපයෙහි වූ අනාථපිණ්ඩික සිටුතුමා විසින් සාදවා පූජා කරන ලද ජේතවනාරාමයෙහි වැඩසිටි සේක යන මෙහි "**සාවත්‍ථියං** " යනු මෙනම් නම් ඇති නගරයයි.

ස්වස්ථ ඍෂිවරයා හට වාස භූමිය වූ බැවින් මේ භූමිය "**සාවස්ථි**" නම් විය. මිනිසුන්ට අවශ්‍ය උප භෝග පරිභෝග භාණ්ඩ

මෙහි ගබඩා කොට ඇති බැවින් **"සියල්ල ඇත්තේ ය"** යනාර්ථයෙන් සාවත්ථි නම් විය.

මෙසේ සියල්ල පරිපූර්ණ වූ මේ සැවැත් පුරයෙහි එන්න, කන්න, බොන්න ආදී වූ දසවිධ ශබ්දයන්ගෙන් වෙන් නොවූ ආහාර පානාදියෙන් පරිපූර්ණ වූ කොසොල් රට වැසියන්ගේ මේ අග නගරය වනාහි රම්‍ය වූ ද, දර්ශනීය වූ ද, මනෝ රමණීය වූ පුණ්‍ය භූමියක් වූයේ ය. අභිවෘධියෙන් යුක්ත වූ විපුල බවට පත් සාරවත් වූ සමෘධිමත් වූ දෙවියන්ගේ ආලකමන්දව වැනි වූ මේ සැවැත්නුවර උතුම් ය. බුද්ධ කාලයෙහි පසේනදි කොසොල් මහ රජතුමාගේ වාස භූමිය වූයේ ද මෙහි ය. පිහිටීම් වශයෙන් අචිරවතී නදී තීරයෙහි විය. මේ නදිය වක්‍රාකාරව ගලා යන බැවින් නගරයෙහි උතුරු දකුණු දෙදිසාවෙන් ම නදිය විය. බුදුරජාණන් වහන්සේගෙන් ම ධර්මය ශ්‍රවණය කොට මඟ ඵල ලැබුවෝ පන්කෝටියක් වූහ. අනාථපිණ්ඩික සිටුතුමා විශාකා මහෝපාසිකාව වැනියවුන් නිසා මේ නුවර බැබළීමට ගියේය.

**"විහරති"** යනු දිව්‍ය බ්‍රහ්ම ආර්‍යය විහරණයන්ගෙන් යම් විහරණයකින් වාසය කරයි යනුයි. එනම් ගමන් කිරීම සිටීම සැතපීම යන සිව් ඉරියව් පවත්වමින් වාසය කිරීමයි. බුද්ධත්වයෙන් තුන් වන වර්ෂයෙහි දී භාග්‍යවතුන් වහන්සේ මේ සැවැත් නුවරට වැඩි පළමු වතාවෙහි දීම නව මසක් වැඩසිටි සේක. ඉන් පසු දහතර වන වස් කාලයෙහි ද, විසි එක් වන වස්කාලයෙහි පටන් සතළිස් හතර වන වස්කාලය අවසන් වීම දක්වා වූ විසිපස් වසරක කාලයක් මේ සැවැත් නුවර ම වැඩසිටි සේක.

**"ජෙතවනෙ"** යනු තමාගේ සතුරු ජනයා ජය ගනීනුයි **"ජේත"** නම් වේ. නොහොත් රජු තම සතුරු ජනයා දිනූ කල්හි උපන් බැවින් මේ කුමරාට **"ජේත"** යැයි නම් තැබීය. සේවනය කෙරේනුයි **"වන"** නම් වේ. නොයෙක් ආකාරයේ මල් සුවඳින් සතුටු වූ මත් වූ කොවුල් ආදී පක්ෂීන්ගේ නාදයෙන් ද මඳ පවනින් ද සෑම කල්හි ම දළු කොළවලින් ද, මල් ගෙඩි බරින් පිරී බර වී පවතින මෙය **"එවු මා පරිභෝග කරවු"** යැයි ආයාචනා කරන්නාක් වැනි වූ බැවින් **"වන"** නම් වේ. තවද ජීවිතය පිළිබඳ බලාපොරොත්තු ඇති කරවන බැවින් ද **"වන"** නම් වේ. මෙහි අර්ථය නම් ජීවිතය පිළිබඳ කලකිරීමක් දුකක් කනගාටුවක් ව්‍යසනයක්

ඇති වූ විටෙක මේ වනයට ගිය කල්හි එහි ඇති අනේක විධ වූ සුවඳවත් වූ මලින් ද ඉදුණු පැසුණු මියුරු පලතුරු ආදියෙන් ද, ඒ මල් පැණි පලතුරු ආදිය පරිභෝගයෙන් තෘප්තිමත් වූ මී මැසි බඹර පක්ෂීන් සිව්පාවන් වැනි සත්වයින්ගේ මිහිරි නාදයෙන් ද, කයට සුව එළවන මඳ පවනින් ද සිත් ඇදගන්නා සුළු වූ ඒ අසිරිය තුලින් මනසෙහි ඇති දුක් පීඩා අමතක වී යන්නේ වේ. එබැවින් ද මෙය "**වන**" නම් වේ. මෙය ජේත කුමාරයාට අයති වූ ඔහු විසින් රෝපණය කරන ලද පවත්වා ගෙන යන ලද්දක් බැවින් "**ජේතවන**" නම් වේ.

"**අනාථපිණ්ඩිකස්ස ආරාමෙ**" අනාථපිණ්ඩික සිටුතුමා විසින් කරවා බුද්ධ ප්‍රමුඛ වූ භික්ෂු සංඝයා වෙත පූජා කරන ලද ආරාමයෙහිය. මව්පියන් තැබූ නමින් "**සුදත්ත**" නම් වූ ඒ ගෘහපති තෙමේ සියලු කාමයෙන් යුක්ත වූ බැවින් ද, පහ වූ මසුරු මල ඇති බැවින් ද, කරුණා ආදී විශේෂ ගුණයන්ගෙන් යුක්ත බැවින් ද, සියලු කල්හි ම අනාථයන්ට ආහාරාදියෙන් සංග්‍රහ කළ බැවින් ද "**අනාථපිණ්ඩික**" යැයි ගෞරව නාමයක් විය. "**ආරාමං**" යනු ආරාමයයි. ප්‍රාණීහු හෝ පැවිද්දෝ සිත් අලවා වෙසෙත්නුයි "**ආරාම**" නම් වේ. මේ ආරාමය ජනාවාසයට ඉතා ළඟ ද නොවූ, ඉතා දුර ද නොවූ ධ්‍යාන භාවනා වැඩීමට ඉතාමත් යෝග්‍ය වූ දකුම්කලු භූමියකි. මෙම භූමිය ලොව පහළ වන සියලු බුදුරජාණන් වහන්සේලාගේ නිත්‍ය වාසස්ථානය වන්නේය. මෙම ආරාම පූජාව උදෙසා ම කල්ප ලක්ෂයක් පුරාවට පිරූ පාරමී ඇති අනාථපිණ්ඩික සිටුතුමා විසින් කහවනු අටලොස් කෝටියක් ජේත කුමාරයාට අයති එම භූමියෙහි අතුරා එම භූමිය මිල දී ගෙන එහි කහවනු අටලොස් කෝටියක් වැය කොට හඳුන් දැවයෙන් සුවඳවත් ආරාමයක් කරවා බුද්ධ ප්‍රමුඛ භික්ෂු සංඝයා හට පවරා දුන් බැවින් අනාථපිණ්ඩික සිටුතුමාගේ ආරාමය නම් විය. අටලොස් කෝටියක් කහවනු වැය කොට ආරාම පූජාව කළේ ය. මෙසේ අනාථපිණ්ඩික සිටුතුමා මෙම ආරාම පූජාව දක්වා කහවනු පනස්හතර කෝටියක් වැය කළේ ය. එසේම ජේත කුමාරයා විසින් මෙම ආරාම භූමියෙහි අප්‍රමාණ ධනයක් වැය කොට අලංකාරමත් ලෙස රෝපණය කරන ලද වෘක්ෂලතා, මල්, පලතුරු උයන් ආදිය එතුමාගේ පරිත්‍යාගයෝ ය. ආනන්ද තෙරුන් වහන්සේ විසින් මෙම කථාවස්තුව ඉදිරිපත් කිරීමෙන් "**පුණ්‍යකාමීහු මෙසේ පින් රැස් කෙරෙති**" යැයි දක්වමින් පින් කැමති අන්‍යයන් ද එසේම පින් කිරීමෙහි යොදවයි.

**මෙහි සාවත්‍ථියං විහරති ජේතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ:** යන මෙහි සැවැත්නුවර දැක්වීමෙන් ගොදුරු ගම ද ආරාමය දැක්වීමෙන් පැවිද්දට යෝග්‍ය නිවාසස්ථානය ද, තවද සැවැත් පුරය දැක්වීමෙන් භාග්‍යවතුන් වහන්සේගේ ගිහි ජනයාට අනුග්‍රහ කිරීම ද ආරාමය දැක්වීමෙන් පැවිද්දන්ට අනුග්‍රහ කිරීම ද, එසේම නගරය දැන්වීමෙන් සිවුපසය ලැබීමෙන් අත්ථකිලමතානුයෝගයෙන් දුරු වීම ද, ආරාමය දැක්වීමෙන් වස්තු කාම ප්‍රහාණයෙන් වෙන් වීමේ උපාය ද, එසේම නගරය දැක්වීමෙන් ධර්මශ්‍රවණය ද ආරාමය දැක්වීමෙන් ඒ ධර්මයෙහි යෙදීම ද, එසේම ගොදුරු ගම දැක්වීමෙන් කරුණාවෙන් ජනයා වෙත එළඹීම ද ආරාමය දැක්වීමෙන් ඒ ගෘහ වාසයෙහි ආදීනව දැක ඒවායෙන් නිදහස් වීම ද, එසේම ගොදුරු ගම දැක්වීමෙන් සත්වයන්ට හිත සුව ඇති කිරීමේ අදහස ද, ආරාමය දැක්වීමෙන් අනුන්ට හිත සුව ඇති කිරීමෙහි නො ගැලී සිටීම ද, එසේම ගොදුරු ගම දැක්වීමෙන් ධාර්මික සැපය අත නො හැරීම නිමිති කොට ඇති පහසු විහරණය ද ආරාමය දැක්වීමෙන් උත්තරිමනුෂ්‍ය ධර්මයෙහි යෙදීම නිමිති කොට ඇති පහසු විහරණය ද, එසේම ගොදුරු ගම දැක්වීමෙන් මිනිසුන්ට බොහෝ උපකාර බව ද ආරාමය දැක්වීමෙන් දෙවියන්ට බොහෝ උපකාර බවත් ද, එසේම ගොදුරු ගම දැක්වීමෙන් ලෝක ජනයා අතර ඉපද ඔවුන් අතරම වැඩුණු බව ද, ආරාමය දැක්වීමෙන් ලෝකය හා නො ඇලුණු බව ද දක්වයි.

**තත්‍ර බො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවො'ති. භදන්තෙ'ති බො භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච.**

එකල්හි භාග්‍යවතුන් වහන්සේ **"මහණෙනි"** යැයි භික්ෂූන් වහන්සේලාට ආමන්ත්‍රණය කළ සේක. එවිට භික්ෂූන් වහන්සේලා **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස"** යැයි පිළිතුරු දුන්හ. එවිට භාග්‍යවතුන් වහන්සේ මෙම **"ලෝකාණුවිචරණ සූත්‍රය"** වදාළ සේක.

එහි **"තත්‍ර"** යන්නෙන් දේශනා කාලය දක්වයි. එනම් මෙම දේශනාව කරන කාලයෙහි යම් තැනක වැඩසිටි සේක් ද එම ස්ථානය වූ ජේතවනාරාමය දැක්වීමයි. එසේම දම් සභා මණ්ඩපයෙහි රැස්ව සිටි භික්ෂූන් වහන්සේලාට ධර්ම ශ්‍රවණය සඳහා ආමන්ත්‍රණය කිරීම ද මෙයින් දක්වේ. **"භගවා"** යන්නෙන් මෙම සූත්‍රය දේශනා කරන්නා වූ දේශකයන්

වහන්සේ වන සම්මා සම්බුදු රජාණන් වහන්සේ දක්වයි. "**භික්ඛූ ආමන්තෙසි**" යන්නෙන් ධර්ම දේශක වූ භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි සිට අවවාද අනුශාසනා පිළිගෙන ඒ අනුව පිළිපදින්නා වූ ශ්‍රාවක පිරිස වන භික්ෂූන් වහන්සේලා ආසන්නයෙන් ම සිටින පිරිස බැවින් ද, හැම කල්හි එක්රැස් වන බැවින් ද, සිව් පිරිසෙහි ප්‍රධාන ශ්‍රාවක පිරිස බැවින් ද ඇසීමෙහි නියෝජනය කරනු පිණිස ආමන්ත්‍රණය කරයි. භාග්‍යවතුන් වහන්සේ පිරිවරා සිටින භික්ෂූන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේ කථා නොකරන කල්හි කර්මස්ථාන අරමුණක ම යෙදී සිටිති. එසේ ඇති කල්හි කරන දේශනාවට ඒ භික්ෂූන් වහන්සේලා සිත නො යොදත්. එයින් කරන දෙසුම ප්‍රයෝජනවත් නොවෙයි. එබැවින් ඒ භික්ෂූන් වහන්සේලාගේ අවධානය ඇති කරවා ගෙන ධර්ම ශ්‍රවණයෙහි සිහිය උපදවා දේශනාව කරනු පිණිස ආමන්ත්‍රණය කළ සේක. "**භික්ඛවො**" යන්නෙන් එසේ කරණ ආමන්ත්‍රණය දක්වයි.

"**භදන්තෙ'ති ඛො භික්ඛූ භගවතො පච්චස්සොසුං**" යන්නෙන් යම් භික්ෂු පිරිසක් සඳහා භාග්‍යවතුන් වහන්සේ ආමන්ත්‍රණය කරන සේක් ද, එම භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි භාග්‍යවතුන් වහන්සේගේ දේශනය ප්‍රාර්ථනා කරන අදහසින් එම ආමන්ත්‍රණය අසා සතුටු සිත් ඇත්තාහු වෙති. එබැවින් එක් භික්ෂූන් වහන්සේ නමක් දෙනමක් නොව රැස්ව සිටි සියලු භික්ෂු සංඝයා ම "**ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස!**" යනුවෙන් භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ.

"**භගවා එතදවොච**" යන්නෙන් ඒ රැස්ව සිටි භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා යන සිව් පිරිස ධර්ම ශ්‍රවණයෙහි හටගත් උත්සාහ ඇතියවුන් බව දන භාග්‍යවතුන් වහන්සේ දෙසිය යුතු සූත්‍ර දේශනාව මෙසේ දේශනා කොට වදාළ සේක.

# ❄ දෙවියන් විසින් පුණ්‍ය වාර්තා ගෙන යෑම

**"අට්ඨමියං, භික්ඛවෙ, පක්ඛස්ස චතුන්නං මහාරාජානං අමච්චා පාරිසජ්ජා ඉමං ලොකං අනුවිචරන්ති"**

මහණෙනි, පක්ෂයෙහි අටවැනි දිනයෙහි සිව්වරම් මහරජ දරුවන්ගේ පිරිසෙහි වූ ඇමතියෝ, මේ ලෝකයෙහි සැරිසරත්.

මෙහි දින ගණනය දක්වා ඇත්තේ චන්ද්‍ර මාස ක්‍රමයට ය. චන්ද්‍ර මාස ක්‍රමය අනුව ය. චන්ද්‍ර සූර්‍ය්‍ය මණ්ඩල දෙක අමාවක දවසෙහි දී එක්ව ම යයි. සූර්‍ය්‍ය මණ්ඩලය එක දිනකට මහාමේරු පර්වතය වටා සතර මහද්වීපයට ආලෝකය ලබා දෙමින් යොදුන් විසිහත් ලක්ෂයක් දුර ගමන් කරයි. එලෙස චන්ද්‍ර මණ්ඩලය එක් දිනකට යොදුන් විසිහය ලක්ෂයක් දුර ගමන් කරයි. අමාවක දිනයෙන් පසු දින වන විට සූර්‍ය්‍ය මණ්ඩලය චන්ද්‍ර මණ්ඩලය පසු කොට යොදුන් ලක්ෂයක් ඉක්මවා ඇත් ව යයි. එදින චන්ද්‍ර මණ්ඩලයෙහි රේඛාවක් පමණක් පෙනෙයි. එබැවින් එදින පෑලවිය නම් වේ. දෙවන දිනය වන විට සූර්‍ය්‍ය මණ්ඩලය චන්ද්‍ර මණ්ඩලයෙන් ඈත් ව යොදුන් දෙලක්ෂයක් දුර යයි. එදින චන්ද්‍ර මණ්ඩලයෙහි රේඛා දෙකක් වැවී පෙනෙයි. එබැවින් එදින දියවක නම් වේ. මෙලෙස දවසින් දවස යොදුන් ලක්ෂය බැගින් සූර්‍ය්‍ය මණ්ඩලය චන්ද්‍ර මණ්ඩලයෙන් ඈත් ව ගොස් පසලොස්වක දින පිරී සම්පූර්ණ වෙයි. එය හේතුවෙන් **"(පුර) පෑලවිය, දියවක, තියවක, ජලවක, විසේනිය, සැටවක, සතවක, අටවක, නවවක, දසවක, එකොළොස්වක, දෙළොස්වක, තෙළෙස්වක, තුදුස්වක, පසළොස්වක"** යනුවෙන් දින සකස් වෙයි. මෙසේ චන්ද්‍ර මණ්ඩලය අමාවක දින සිට පුර පසලොස්වක පෝය දින දක්වා වැඩෙන කාලය සුක්ඛ (පුර) පක්ෂය නම් වේ. මෙලෙස පසලොස්වක දක්වා චන්ද්‍ර මණ්ඩලය වැඩී එතැන් පටන් නැවත දවසින් දවස රේඛාව රේඛාව පිරිහීමට පත්ව අමාවක දින චන්ද්‍ර මණ්ඩලය නො පෙනී යයි. එය හේතුවෙන් **"(අව) පෑලවිය, දියවක, තියවක, ජලවක, විසේනිය, සැටවක, සතවක, අටවක, නවවක, දසවක, එකොළොස්වක, දෙළොස්වක, තෙළෙස්වක, තුදුස්වක, අමාවක"** යනුවෙන් දින සකස් වෙයි. මෙලෙස චන්ද්‍ර මණ්ඩලය පිරිහෙන කාලය

කාල (අව, කළුවර) පක්‍ෂය නම් වේ. මෙසේ දින සැකසීමත් සමග පක්‍ෂ මාස සෘතු සංවත්සර සකස් වීම වේ.

කල්පයක් විනාශ වන කල්හි පොළොවෙහි අන් සියලු තැන් විනාශ වී ගොස් අවසානයෙහි දී මහා බෝධි මණ්ඩලය විනාශ වේ. කල්පයක් නැවත හට ගැනීමෙහි දී ප්‍රථමයෙන් මහා බෝධි මණ්ඩලය හට ගනී. එහි පෙර නිමිත්තක් වී නෙළුම් ගසක් හට ගනී. ඉදින් ඒ කල්පයෙහි සම්මා සම්බුදු රජාණන් වහන්සේලා පහළ වන්නේ නම් මල් හට ගනී. නො වන්නේ නම් මල් හට නො ගනී. ඒ අනුව බුදු රජාණන් වහන්සේලා ලොව පහළ නොවන්නේ නම් ඒ කල්පය **ශූන්‍ය කල්පය** නම් වේ. එක බුදු රජාණන් වහන්සේ නමක් පහළ වන්නේ නම් එහි එක මලක් පිපෙයි. එය **සාර කල්පය** නම් වේ. දෙ නමක් පහළ වන්නේ නම් එහි මල් දෙකක් පිපෙයි. එය **මණ්ඩ කල්පය** නම් වේ. තෙනමක් පහළ වන්නේ නම් එහි මල් තුනක් පිපෙයි. එය **වර කල්පය** නම් වේ. සතර නමක් පහළ වන්නේ නම් එහි මල් සතරක් පිපෙයි. එය **සාර මණ්ඩ කල්පය** නම් වේ. පස් නමක් පහළ වන්නේ නම් එහි මල් පසක් පිපෙයි. එය **මහා භද්‍ර කල්පය** නම් වේ. ඒ මල් ද එක ම නටුවක එකට බැඳී හට ගනී.

එකල්හි ශුද්ධාවාස බඹලොව වැසි අභීත් බ්‍රහ්මයෝ අලුත හටගන්නා කල්පයෙහි පෙර නිමිති බලන්නට මහා බෝධි මණ්ඩලය පිහිටන තැනට පැමිණෙති. ඒ නෙළුම් ගසෙහි මල් හට ගෙන නැත්තේ නම් **"මේ කල්පය වනාහි අඳුරු වන්නේ ය. මැරෙන සත්වයෝ අපායෙහි උපදිති. දිව්‍ය ලෝක සය ද, බ්‍රහ්ම ලෝක නවය[1] ද හිස් වන්නේ ය"** යැයි අසතුටු වී යති. මල් පිපී ඇති කල්හි එය දැක **"සර්වඥ වූ මහ බෝසතාණන් වහන්සේ මව් කුස පිළිසිඳ ගන්නා කල්හි ද, මව් කුසෙන් බිහි වෙන කල්හි ද, සම්මා සම්බුද්ධත්වයට පැමිණෙන විට ද, ධර්මචක්‍රය පවත්වන කල්හි ද, යමක ප්‍රාතිහාර්‍ය්‍යය පවත්වන කල්හි ද, දේවාරෝහණය කරන කල්හි ද, ආයු සංස්කාරය අතහරින කල්හි ද, අනුපාදිශේෂ පරිනිර්වාණ ධාතුවෙන් පිරිනිවෙන කල්හි ද දස දහසක් සක්වළ කම්පා වීම ආදී ප්‍රාතිහාර්‍ය්‍යය දකින්නෙමු. එසේම සතර අපාය හිස් වන්නේ ය. දිව්‍ය ලෝක සය ද, බ්‍රහ්ම ලෝක නවය ද පිරී යන්නේ**

[1] මෙය භූමි භේදයෙන් කියන ලදි.

ය" යැයි සතුටු සිත් ඇතිව උදන් අනමින් තම තමන්ගේ බ්‍රහ්ම ලෝකයන්ට යති.

පොළොව හට ගැනීමෙහි දී ජලස්කන්ධය මතුපිට රස පොළොව හට ගනී. එය වර්ණයෙන් කිණිහිරි මල් මෙන් ඉතා සුදු පැහැයෙන් යුක්ත ය. දිව්‍ය සුගන්ධයක් මෙන් ඉතා සුවඳවත් ය. දිව්‍ය ඕජස් හෙලන ලද්දක් මෙන් පිලවුන් නැති දඬු වැල් බෑ මී වදයක් මෙන් පැණි මෙන් ද, දිය නුමුසු කිරෙහි මතුපිට හටගත් තෙල් පටලය මෙන් ද වේ. එකල්හි ආභස්සර බඹ ලොවින් ච්‍යුත වන බ්‍රහ්මයෝ ඒ රස පොළොව මත පහළ වෙති. ඔවුහු ධ්‍යාන උපචාර සිතින් ඔපපාතික ව ඉපිද ප්‍රීතිය ම ආහාර කොට ඇතිව ස්වකීය ශරීරාලොකයෙන් ම බබළමින් අහසෙහි හැසිරෙමින් මනොඥ ස්වභාව ඇත්තාහු ඉතා දීර්ඝ කාලයක් ජීවත් වෙති. එකල්හි මහ ඝන අන්ධකාරයක් ම වෙයි. සඳ හිරු හා ග්‍රහ තාරකාවෝ නො පෙණෙති. රෑ දහවල් මාස අර්ධ මාසයෝ නො පෙණෙති. ඍතු භේද හා අවුරුදු භේද සහ ස්ත්‍රී පුරුෂ යන භේදයක් නො පෙණෙයි. සත්වයෝ ය, සත්වයෝ ය යැයි ව්‍යවහාරයට පැමිණෙති.

එකල්හි එක්තරා ලොල් සත්වයෙක් පින්වත්නි, මේ කුමක් නම් විය යුතු වන්නේ ද? යැයි රස පොළොව මඳක් ඇඟිල්ලෙන් ගෙන දිව අග ගෑවේ ය. ඒ ක්ෂණයෙහි රස නහර දහසක ඒ රසය පැතිර යෑමෙන් එය ඔහුට ඉතා ප්‍රිය විය. ඔහු එහි බලවත් තෘෂ්ණාවෙන් බැඳී ගියේ ය. අන්‍ය සත්වයෝ ද ඔහු කළ ඒ ක්‍රියාව දැක එලෙස ම රස පොළොව ඇඟිල්ලෙන් ගෙන රස බැලුවාහු ය. එලෙස රස බලන්නා වූ ඔවුන්ගේ ද දහසක් රස නහර පිණා ගියහ. ඔවුන්ට එහි බලවත් තෘෂ්ණාවෙන් බැඳී ගියහ. එකල්හි ඔවුහු රස පොළොව පිඬු කොට වළඳන්නට පටන් ගත්හ.

එලෙස ඒ සත්වයෝ රස පොළොව අතින් පිඬු කොට අනුභව කරන්න පටන් ගත් කල්හි ඒ සත්වයන්ගේ ශරීරාලොකය නැති වී ගියේ ය. බලවත් අන්ධකාරයක් විය. එයින් සත්වයෝ ආලෝකය නැති වූයේ ය යැයි බියට තැති ගැනීමට පත්ව අපට ආලෝකය ලැබෙන්නේ නම් හොඳ ය යැයි සිතූහ. හිරුමඬල පහළ වූයේ ය. සත්වයන්ගේ සූර භාවය උපදවමින් පහළ වූ බැවින් එයට "**සූර්‍ය්‍යයා**" යැයි නම් කළහ. සූර්‍ය්‍ය

මණ්ඩලය උදෑසන පායා සවසට බැස යයි. එවිට ඉතිරි කාලය අන්ධකාර විය. එයින් බියපත් වූ සත්වයෝ රාත්‍රියට ද ආලෝකයක් ලැබෙන්නේ නම් හොඳ ය යැයි සිතූහ. එවිට රාත්‍රිය ආලෝකවත් කරමින් සඳමඬල පහළ වූයේ ය. එයින් සතුටු වූ ඔවුහු එයට **"චන්ද්‍රයා"** යැයි නම් කළහ.

චන්ද්‍ර සූර්‍ය්‍ය මණ්ඩල දෙක මහ පොළව මතුපිට සිට යොදුන් දෙසාළිස් දහසකට (42000) උඩින් චාතුර් මහාරාජික දෙව්ලො පිහිටා ඇති යුගන්ධර පර්‍වතයෙහි මුදුන මට්ටමෙන් ආකාශයෙහි පිහිටියේ ය. එයින් ද සූර්‍ය්‍ය මණ්ඩලය උඩින් පිහිටියේ ය. චන්ද්‍ර මණ්ඩලය යටින් පිහිටියේ ය. චන්ද්‍ර සූර්‍ය්‍ය දෙදෙනා අතර පරතරය යොදුනකි. චන්ද්‍ර මණ්ඩලයේ යට කෙළවරෙහි සිට සූර්‍ය්‍ය මණ්ඩලයෙහි උඩ කෙළවර දක්වා දුර යොදුන් සියයකි. සඳ ඍජු ව[2] ගමන් යන කල්හි සෙමෙන් යයි. සරස් ව[3] ඉක්මනින් යයි. සූර්‍ය්‍ය මණ්ඩලයෙහි ඍජු ව යන ගමන ඉක්මනින් යයි. සරස් ව[4] සෙමින් යයි. චන්ද්‍ර මණ්ඩලයට ඉදිරියෙන් ද, පසුපසින් ද, දෙ පසින් ද නැකත් තාරකාවෝ වෙති. එළ දෙන තම පැටවුන් ළඟට පැමිණෙන්නාක් මෙන් සඳමඬල නැකත් තරු වෙත පැමිණෙයි. නැකත් තරු තම පිහිටි ස්ථානය අතහැර නො යයි.

මෙලෙස චන්ද්‍ර සූර්‍ය්‍ය මණ්ඩල දෙක ම එක විටම පහළ වූහ. එයින් ප්‍රථමයෙන් සූර්‍ය්‍ය මණ්ඩලය පෙනුණේ ය. සූර්‍ය්‍ය මණ්ඩලය බැස ගිය විට චන්ද්‍ර මණ්ඩලය පෙනුණේ ය. චන්ද්‍ර සූර්‍ය්‍ය මණ්ඩල දෙක පහළ වූ කල්හි ග්‍රහ තාරකා ද සෙසු තාරකාවෝ ද පහළ වූහ. ග්‍රහ තාරකා හා සෙසු තාරකා පහළ වූ කල රෑ දහවල් පෙනුනාහු ය. රෑ දහවල් ප්‍රකට වූ කල්හි මාස අර්ධ මාසයෝ ප්‍රකට වූහ. මාස අර්ධ මාසයන් පෙනෙන්නට වන් කල්හි ඍතු සංවත්සර (අවුරුදු) ප්‍රකට වූහ.

චන්ද්‍ර සූර්‍ය්‍ය මණ්ඩල දෙක සතර මහද්වීපයන්ට ඉහළින් සැරිසරන අතර සය මසක් සක්වළ මධ්‍යයෙහි පිහිටි මහාමේරු

[2] උදා වූ තැන් පටන් අස්තයට යන ගමන

[3] එක මාසයක් තුළ දකුණු දෙස සිට උතුරු දිසාවට ද, උතුරු දෙස සිට දකුණු දිසාවට ද යමින් බොහෝ වර මාරු වෙමින් යයි

[4] සූර්‍ය්‍ය මණ්ඩලය සය මසකට වරක් බැගින් එක් වර්ෂයකට දෙවතාවක් උතුරු දකුණු දෙදිසාවට මාරු වෙමින් යයි.

පර්‍වතයට ආසන්නයෙහි මහද්වීපයන්ට උතුරෙන් සැරිසරති. සය මසක් සක්වළ වට කොට පිහිටි චක්‍රාවාට පර්‍වතයට ආසන්නයෙහි සතර මහද්වීපයන්ට දකුණෙන් සැරිසරති. මෙසේ සැරිසරන අතර ඇසළ මස මහාමේරු පර්‍වතයට ආසන්නයෙහි හැසිරෙති. ඉන් පසු නිකිණි බිනර යන දෙමස ක්‍රමයෙන් පර්‍වතාසන්නයෙන් දවසින් දවස ඈත් වෙමින් සැරිසරති. ඉන් පසු වප් මස මහද්වීපයන්ට මුදුන් ව සැරිසරමින් ගොස් දකුණු දෙසට ක්‍රමයෙන් සංක්‍රමණය වී ඉල් උඳුවප් දෙමස සැරිසරා දුරුතු මස චක්‍රාවාට පර්‍වතයට ආසන්න ව භ්‍රමණය වී නැවත නවම්, මැදින් දෙමස උතුරු දෙසට සංක්‍රමණය වෙමින් සැරිසරා බක් මස මහද්වීපයන්ට ආසන්නයෙහි හැසිරෙති. නැවත ද එයින් උතුරු දෙසට වෙසක්, පොසොන් දෙමස සංක්‍රමණය වෙමින් ගොස් ඇසළ මස මහාමේරු පර්‍වතය ආසන්නව සැරිසරති.

මෙලෙස චන්ද්‍ර සූර්‍ය්‍ය දෙදෙනා පහළ වීමත් සමග ම නක්‍ෂත්‍ර මෙන්ම අනෙකුත් ග්‍රහ තාරකා රූප සියල්ලක් ම පහළ වූයේ ය. රාත්‍රිය දහවල හට ගත්තේ ය. එයින් හිරු බැස යාමෙහි පටන් අරුණ නැගීම දක්වා කාලය "**රාත්‍රිය**" නම් විය. අරුණ නැගීමෙහි පටන් සූර්‍ය්‍යයා බැස යාම දක්වා කාලය "**දහවල**" නම් විය.

මේ චන්ද්‍ර සූර්‍ය්‍ය මණ්ඩල දෙදෙනා **අජ වීථිය, නාග වීථිය, ගෝ වීථිය** යැයි වීථි තුනක ගමන් කරයි.

යම් වීථියකින් සූර්‍ය්‍යයා ගමන් කරන කල්හි වැස්ස වලාහක දිව්‍ය පුත්‍රයා සූර්‍ය්‍ය රශ්මියෙන් දැඩි සේ පෙළී තම විමානයෙන් නො නික්මෙත් ද, ක්‍රීඩාවෙහි යෙදී නො හැසිරෙත් ද එකල්හි සූර්‍ය්‍යයාගේ විමානය ප්‍රකෘති මාර්‍ගයෙන් පහතට බැස හැසිරෙයි. එවිට චන්ද්‍ර මණ්ඩලය ද පහතට බැස හැසිරෙයි. එහෙයින් මෙම වීථිය ජලය නොමැති හෙයින් ද, එළුවන්ට අනුරූප පැවතුම් ඇති බැවින් ද ඒ චන්ද්‍ර සූර්‍ය්‍ය මණ්ඩලයන්හි ගමන් මාර්‍ගය "**අජ වීථිය**" නමින් හැඳින්වීමට ගියේ ය. චන්ද්‍ර සූර්‍ය්‍ය දෙදෙනා අජ වීථියට පැමිණි කල්හි එක වැසි බින්දුවකුදු නොවසී.

යම් වීථියකින් සූර්‍ය්‍යයා ගමන් කරන කල්හි වැස්ස වළාහක දිව්‍ය පුත්‍රයෝ සූර්‍ය්‍ය තාපයෙන් නො තැවෙත් ද, තමාගේ විමානයෙන් නික්ම

ක්‍රීඩාවෙහි යෙදෙමින් ඔබිනොබ සැරිසරති. එකල්හි සූර්‍ය්‍ය විමානය ප්‍රකෘති මාර්ගයෙන් උඩට නැගී ගමන් කරයි. එවිට චන්ද්‍ර මණ්ඩලය ද සූර්‍ය්‍යයා අනුගමනය කරමින් එයට අනුරූපව ගමන් කරයි. එවිට වායු මණ්ඩලය ද එයට අනුරූපව ගමන් කරයි. එබැවින් එම වීථියෙහි ජලය බහුල බැවින් නාගයින් - ඇතුන් හා සමාන බැවින් "**නාග වීථිය**" යැයි හැඳින්වීමට ගියේ ය. චන්ද්‍ර සූර්‍ය්‍ය දෙදෙනා නාග වීථියට නැගුණු කල්හි අහස බිඳුණාක් මෙන් වැසි වසී.

යම් කලෙක සූර්‍ය්‍ය මණ්ඩලය උඩට ද නො ගොස් යටට ද නො බැස ප්‍රකෘති මාර්ගයෙන් ම ගමන් කරයි ද, එකල්හි වැස්ස වළාහක දෙවියෝ කැමති පරිදි විමානයෙන් නික්ම සුව සේ හැසිරෙති. එකල්හි කලින් කලට වැස්ස වසිමින් ලොවෙහි ඍතු සම බවට පැමිණේ. එලෙස ඍතු සමතාවයට පැමිණීමෙන් චන්ද්‍ර සූර්‍ය්‍ය දෙදෙනාගේ ගමන් මග ගවයෙකුට සමාන ගති ඇති බැවින් "**ගෝ වීථිය**" යැයි හැඳින්වීමට ගියේ ය. චන්ද්‍ර සූර්‍ය්‍ය දෙදෙනා ගෝ වීථියට පැමිණි කල්හි ඍතු සමාන බවට පැමිණේ. ඒ අනුව "**හේමන්ත, ගිම්හාන, වස්සාන**" යන ඍතු තුන සකස් වේ.

එළුවන්ට ජලය පිළිකුල් වේ. එමෙන්ම චන්ද්‍ර සූර්‍ය්‍ය දෙදෙනා අජ වීථියට පැමිණි කල්හි වැසි බින්දුවකුදු නො වැසීමෙන් වියළීමට පත්ව පවත්නා බක්, වෙසක්, පොසොන්, ඇසළ යන සිව් මස "**ගිම්හාන ඍතුව**" නම් වේ.

ඇතුන්ට නාගයින්ට ජලය ඉතා ප්‍රිය ය. මනාප ය. එමෙන්ම චන්ද්‍ර සූර්‍ය්‍ය දෙදෙනා නාග වීථියට පැමිණි කල්හි අහස සිදුරු වූවක් මෙන් වර්ෂාපතනය ඇති වී ජල ගැලුම් සිදු වී හාත්පස තෙමී පවත්නා නිකිණි, බිනර, වප්, ඉල් යන සිව් මස "**වස්සාන ඍතුව**" නම් වේ.

එළ ගවයාට සීත උෂ්ණ දෙක සමාන ය. එමෙන්ම චන්ද්‍ර සූර්‍ය්‍ය දෙදෙනා ගෝ වීථියට පැමිණි කල්හි වර්ෂාව ද නැවතීමට පත්ව, අධික උෂ්ණය ද නැතිව ඍතුව සමානව පවත්නා උඳුවප්, දුරුතු, නවම්, මැදින් යන සිව් මස "**හේමන්ත ඍතුව**" නම් වේ.

මෙලෙස කල්පය සකස් වීමෙහි දී චන්ද්‍ර සූර්‍ය්‍ය මණ්ඩල දෙකේ සැරිසැරීම හේතුවෙන් රෑ දහවල සකස් විය. මෙලෙස එක රැයක් හා දහවලක් එක දවසකි. එබඳු දින සතක් එක සතියකි. එසේ වූ සති හතරක් එක් මාසයකි. එසේ වූ මාස හතරක් එක ඍතුවකි. එබඳු මාස දෙළොසක් නොහොත් ඍතු තුනක් එක් වර්‍ෂයකි. එබඳු වර්‍ෂ හෙවත් සංවත්සර දෙළොසක් ඇත්තේ ය. එනම්ඃ

**මූසිකො වසභො ව්‍යග්ඝ - සස නාගානි'මෙව ච,**
**සප්පස්සජ කපි'චෙව - කුක්කුටො සොණ සූකරො'ති.**

මූෂික සංවත්සරය, වෘෂභ සංවත්සරය, ව්‍යාඝ්‍ර සංවත්සරය, සස සංවත්සරය, නාග සංවත්සරය, සර්‍ප සංවත්සරය, අස්ස සංවත්සරය, අජ සංවත්සරය, කපි සංවත්සරය, කුක්කුට සංවත්සරය, සෝණ සංවත්සරය, සූකර සංවත්සරය යනුවෙන් දෙළොසකි. ඒ අනුව අපි දැන් ගත කරනු ලබන්නේ **මූසික** සංවත්සරය යි.

මෙලෙස චන්ද්‍ර සූර්‍ය්‍ය මණ්ඩල, නක්‍ෂත්‍ර, තාරකා රූප පහළ වීමත් සමගම **චක්‍රවාට පර්‍වතය, මහාමේරු පර්‍වතය, සප්ත කූට පර්‍වත, මහද්වීප සතර, හිමාල පර්‍වතය** ආදී සියල්ල සත්වයන්ට වාසභූමි වශයෙන් පහළ වූහ.

මෙසේ සඳෙහි ගමන් මාර්‍ගය අනුව සකස් වන දින අනුව එක් මසකට දින අටක් ධර්‍ම ශ්‍රවණය පිණිස තව්තිසා දෙව්ලොව සුධර්‍මා දිව්‍ය සභා මන්දිරයට දෙවියෝ රැස් වෙති. එහි විවරණය මෙසේ ය.

## ☸ සුධර්‍මා දිව්‍ය සභාව

තාවතිංස දිව්‍ය ලෝකය වනාහි මහාමේරු පර්‍වත මුඳුනෙහි පිහිටියේ ය. එහි පෙර දිග හා බටහිර දෙරටු අතර පරතරය යොදුන් දස දහසකි. උතුරු දිග හා දකුණු දිග අතර පරතරය යොදුන් දස දහසකි. එහි පිහිටි දේව නගරය දෙරටු දහසකින් යුක්ත ය. උයන් පොකුණු ආදියෙන් විසිතුරු ය. එම නුවර මැද යොදුන් සත් සියයක් උස් වූ වෛජයන්ත ප්‍රාසාදය පිහිටියේ ය. යොදුන් තුන් සියයක් පමණ

ධජ පතාකා ආදියෙන් හාත්පස සැම කල්හි ලෙළ දෙන්නේ ය. එහි රන් යට ලීවල මැණික් ධජ ද, මැණික් යට ලීවල රන් ධජ ද, පබලු යට ලීවල මුතු ධජ ද, මුතු යට ලීවල පබලු ධජ ද, සත් රුවන් යට ලීවල සත් රුවන් ධජ ද නිරන්තරයෙන් ලෙළ දෙන්නේ ය.

තව ද එහි යොදුන් පසළොසක් වට ඇති යොදුන් පණසක් උස කඳ ඇති යොදුන් සියයක් හාත්පස විහිද අතු පතර ඇති පරසතු වෘක්ෂය පිහිටියේ ය. එම පරසතු වෘක්ෂ මූලයෙහි සැට යොදුන් දිග ඇති පනස් යොදුන් පළල ඇති පසළොස් යොදුන් උස ඇති බඳු වද මල් පැහැති පාණ්ඩුකම්බල ශෛලාසනය පිහිටියේ ය. සක් දෙවිඳු හිඳ ගත් කල්හි සිරුරෙන් අඩක් එහි එරී යන්නේ ය. නැගී සිටි විට එය නැවත සමතල වන්නේ ය.

දෙවියන්ට රැස් වී ධර්ම ශ්‍රවණය කිරීමට හා සාකච්ඡා පැවැත්වීමට යොදුන් තුන්සියයක් 'දිග පළල ඇති යොදුන් නව සියයක් වට ඇති සුධර්මා නම් දිව්‍ය සභා මන්දිරය එහි පිහිටියේ ය. එහි බිම පළිඟුවලින් නිර්මිත ය. ඇණ මැණික්වලින් නිර්මිත ය. මැටි රනින් නිර්මිත ය. කණු හා බැඳුම් රිදියෙන් නිර්මිත ය. ව්‍යාල රූප පබළුවලින් නිර්මිත ය. කැණිමඩල හා පරාල සප්ත රත්නයෙන් නිර්මිත ය. ගඩොල් හා පියසි නිල් මැණික්වලින් නිර්මිත ය. මිනිස් ලොව දින ගෙවීම අනුව එක් මසකට අට වතාවක් දෙවියෝ රැස්ව එහි ධර්ම ශ්‍රවණය හා ධර්ම සාකච්ඡා පවත්වති.

එසේ රැස් වන කල්හි සතර වරම් දෙවි රජවරු සතර දිග සපිරිවරින් රැස් වෙති. නැගෙනහිර දෙසින් ගාන්ධර්වයන්ට අධිපති වූ ධතරාෂ්ට දිව්‍ය රාජයා බස්නාහිර දෙසට මුහුණ ලා කෝටි ලක්‍ෂයක් ගාන්ධර්ව දෙවියන් පිරිවරා කෝටි ලක්‍ෂයක් රන් මුවා පලක ද, රන් සැත් ද ගෙන දෙදෙව් ලොව දෙවියන් පෙරටු කොට හිඳියි. දකුණු දිග කුම්භාණ්ඩයන්ට අධිපති වූ විරූළ්හක දිව්‍ය රාජයා උතුරු දිගට මුහුණ ලා කෝටි ලක්‍ෂයක් කුම්භාණ්ඩ දෙවියන් පිරිවරා මිණි මුවා පලක හා රන් සැත් ගෙන දෙදෙව් ලොව දෙවියන් පෙරටු කොට හිඳියි. බස්නාහිර දෙසින් නාගයින්ට අධිපති වූ විරූපාක්‍ෂ දිව්‍ය රාජයා කෝටි ලක්‍ෂයක් නාගයින් පිරිවරා මිණි මුවා සැත් ද රන් පලක ද ගෙන නැගෙනහිර දිගට මුහුණ ලා දෙදෙව් ලොව දෙවියන් පෙරටු කොට හිඳියි. උතුරු

දිග යක්ෂයන්ට අධිපති වූ වෛශ්‍රවණ දිව්‍ය රාජයා කෝටි ලක්ෂයක් යක්ෂයන් පිරිවරා පබළු පලක ද රන් සැත් ද ගෙන දකුණු දිගට මුහුණ ලා දෙදෙව් ලොව දෙවියන් පෙරටු කොට හිඳියි.

කරුණු සතරක් පිණිස මෙලෙස දෙවියෝ සුධර්මා දිව්‍ය සභා මන්දිරයට රැස් වෙති. එනම්: **"වස්සූපනායික සංග්‍රහය, පවාරණ සංග්‍රහය, ධර්ම ශ්‍රවණය, පරසතු වෘක්ෂයෙහි ආනුභාවයෙන් ක්‍රීඩා කිරීම"** යනුයි. එහි:-

## ✪ වස්සූපනායික සංග්‍රහය

බුදු සසුනෙහි ඇසළ පෝය දිනට පසු ද වන පෑලවිය දින සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ ආඥාව පරිදි සියලු භික්ෂූන් වහන්සේලා ම වස් සමාදන් වීම සිදු වන්නේ ය. එබැවින් ඇසළ පොහෝ දින චාතුර්මහාරාජික තාවතිංස යන දෙදෙව් දෙව්ලොව දෙවියන් සුධර්මා දිව්‍ය සභා මන්දිරයට රැස්ව මෙසේ සාකච්ඡා කරති.

**"හෙට පෑලවිය දින අසවල් විහාරයෙහි එක් භික්ෂූන් වහන්සේ නමක් වස් සමාදන් වෙයි. අසවල් විහාරයෙහි භික්ෂූන් වහන්සේලා දෙනමක් වස් සමාදන් වෙති. අසවල් විහාරයෙහි භික්ෂූන් වහන්සේලා තෙනමක් වස් සමාදන් වෙති. අසවල් විහාරයෙහි භික්ෂූන් වහන්සේලා සිවු නමක් වස් සමාදන් වෙති. අසවල් විහාරයෙහි භික්ෂූන් වහන්සේලා පස් නමක් වස් සමාදන් වෙති. අසවල් විහාරයෙහි භික්ෂූන් වහන්සේලා දස නමක් වස් සමාදන් වෙති. අසවල් විහාරයෙහි භික්ෂූන් වහන්සේලා විසි නමක් වස් සමාදන් වෙති. අසවල් විහාරයෙහි භික්ෂූන් වහන්සේලා තිස් නමක් වස් සමාදන් වෙති. අසවල් විහාරයෙහි භික්ෂූන් වහන්සේලා සතළිස් නමක් වස් සමාදන් වෙති. අසවල් විහාරයෙහි භික්ෂූන් වහන්සේලා පනස් නමක් වස් සමාදන් වෙති. අසවල් විහාරයෙහි භික්ෂූන් වහන්සේලා සිය නමක් වස් සමාදන් වෙති. අසවල් විහාරයෙහි භික්ෂූන් වහන්සේලා දහස් නමක් වස් සමාදන් වෙති. අපි ඒ ඒ භික්ෂූන් වහන්සේලාට මෙම වස් කාලය තුළ ආරක්ෂාව සංවිධාන කරමු"** යැයි සාකච්ඡා කරති. එසේ ම ඒ අනුව එම වස් කාලය පුරාවට ආරක්ෂාව සංවිධාන කරති. මෙය **වස්සූපනායික සංග්‍රහය** නම් වේ.

## ✪ පවාරණ සංග්‍රහය

බුදු සසුනෙහි භික්ෂූන් වහන්සේලා ඇසළ පොහොය දින පොහොය විනය කර්මය කොට පැලවිය දින වස් සමාදන්ව තුන් මසකට පසු වප් පුර පසලොස්වක දින මහා පවාරණය කරති. චාතුර්මහාරාජික හා තාවතිංස දෙ දෙව් ලොව දෙවියෝ ද වප් පොහොය දින රැස්ව "**අද කොතැනට ගොස් කාගේ සමීපයෙහි පවාරණය කරන්නෙමු ද?**" යැයි සාකච්ඡා කරති. එදින සක් දෙව් රජතුමා පුවගු දිවයිනෙහි මහා විහාරයට පැමිණ බොහෝ සෙයින් පවාරණය කරයි. සෙසු දෙවිවරු පරසතු ආදී දිව්‍ය මල් ද, දිව්‍ය සඳුන් සුනු ද ගෙන තම තමා මනාප තැන්වලට ගොස් පවාරණය කරති. ඇතැම් දෙවියෝ ලැබුණු සැප සම්පත් තහවුරු කර ගැනීම පිණිස ද, මතු වරද නොවීම පිණිස ද පන්සිල් සමාදන්ව රකිති. වඩාත් පිරිසිදු වීම පිණිස පවාරණ කටයුතු කරති. එබැවින් එය "**මහා පවාරණය**" යැයි කියනු ලැබේ.

## ✪ ධර්ම ශ්‍රවණය

එක් මසකට දෙව්ලොව අට වතාවක් මහා ධර්ම දේශනාවක් පැවැත්වෙයි. එය පැවැත්වෙන්නේ සුධර්මා දේව සභා මන්දිරයෙහි දී ය. එම ධර්ම දේශනාව සනංකුමාර බ්‍රහ්ම රාජයා විසින් හෝ සක්දෙව් රජතුමා විසින් හෝ ධර්ම කථික භික්ෂුවක් විසින් හෝ අන්‍ය ධර්ම කථික දිව්‍ය පුත්‍රයෙකු විසින් හෝ පවත්වනු ලැබේ.

එක් මසක් තුළ යෙදෙන අව පක්ෂයෙහි අටවක සහ අමාවක යන දින දෙක ද පුර පක්ෂයෙහි අටවක සහ අමාවක යන දින දෙක ද යන පොහොය දින සතරෙහි ද, එයින් අමතරව පුර හා අව පක්ෂයෙහි ජලවක හා විසේනිය යන දෙ දින ද, අව පක්ෂයෙහි ජලවක හා විසේනිය යන දෙ දින ද යන මේ දින අටෙහි ධර්ම ශ්‍රවණය පිණිස තව්තිසා දෙව්ලොව දෙවියෝ සුධර්මා දිව්‍ය සභා මන්දිරයට රැස් වෙති.

එසේ අටවක පොහොය රැස් වූ කල්හි සක් දෙව් රජතුමා සතර වරම් දෙවි රජවරුන් අමතා "**දරුව, අද මිනිස් ලොව අටවක පොහොය**

**දිනයයි. එබැවින් මිනිස් ලොව සැරිසරා පින් කරන්නන්ගේ නම් ගොත් රන් පටක ලියා ගෙන රැගෙන එන්න"** යැයි මෙසේ අණ කරයි. එවිට සතර වරම් දෙව් රජවරු තම සේවක දෙවියන්ට එම කටයුත්ත බාර කර පිටත් කොට යවයි. එය භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

**"අට්ඨමියං, භික්ඛවෙ, පක්ඛස්ස චතුන්නං මහාරාජානං අමච්චා පාරිසජ්ජා ඉමං ලොකං අනුවිචරන්ති"**

මහණෙනි, පක්‍ෂයෙහි අටවැනි දිනයෙහි සිව්වරම් මහරජ දරුවන්ගේ පිරිසෙහි වූ ඇමතියන්ගේ සේවක දෙවියෝ මේ මිනිස් ලෝකයෙහි සැරිසරති.

**"කච්චි බහූ මනුස්සා මනුස්සෙසු මත්තෙය්‍යා පෙත්තෙය්‍යා සාමඤ්ඤා බ්‍රහ්මඤ්ඤා කුලෙ ජෙට්ඨාපචායිනො උපොසථං උපවසන්ති පටිජාගරොන්ති පුඤ්ඤානි කරොන්තී'ති.**

කිමෙක් ද? මිනිස් ලොව බොහෝ මිනිස්සු මවට උපස්ථාන කරත් ද, පියාට උපස්ථාන කරත් ද, මහණ බමුණන්ට උපස්ථාන කරත් ද, තම කුලයෙහි දෙටුවන්ට උපස්ථාන කරත් ද, උපෝසථ සිල් රක්නාහු ද, පෙර ගමන් පසු ගමන් වශයෙන් ජාගරියානුයෝගයෙහි යෙදී උපෝසථ සිල් රක්නාහු ද, තෙරුවන් සරණ යෑම, නිති පන්සිල් රැකීම, මල් පූජා පැවැත්වීම, පහන් ආලෝක පූජා පැවැත්වීම, ධර්‍ම ශ්‍රවණය කිරීම, ධර්‍ම දේශනා කරවීම, ධර්‍ම සාකච්ඡා පැවැත්වීම, වෙහෙර විහාර කරවීම ආදී වූ අනෙකුත් පින් කරත් ද යැයි විමසත්.

එසේම චාතුද්දසී පොහොය දිනයෙහි ද දිව්‍ය සභාවෙහි දෙවියන් රැස් වූ විට සක් දෙව් රජතුමා සතර වරම් දෙව් රජවරුන් අමතා **"දරුව, අද මිනිස් ලොව තුදුස්වක පොහොය දිනයයි. එබැවින් මිනිස් ලොව සැරිසරා පින් කරන්නන්ගේ නම් ගොත් රන් පටක ලියා ගෙන රැගෙන එන්න"** යැයි මෙසේ අණ කරයි. එවිට සතර වරම් දෙව් රජවරු තම සේවක දෙවියන්ට එම කටයුත්ත බාර කර දිව්‍ය පුත්‍රයන් පිටත් කොට යවයි. එය භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

**චාතුද්දසිං, භික්ඛවෙ, පක්ඛස්ස චතුන්නං මහාරාජානං පුත්තා ඉමං ලොකං අනුවිචරන්ති '**

මහණෙනි, පක්ෂයෙහි තුදුස්වක පොහොය දිනයෙහි සිව්වරම් මහරජ දරුවන්ගේ පිරිසෙහි වූ ඇමතියන්ගේ පුත්‍රයෝ මේ මිනිස් ලෝකයෙහි සැරිසරති.

**"කච්චි බහූ මනුස්සා මනුස්සෙසු මත්තෙය්‍යා පෙත්තෙය්‍යා සාමඤ්ඤා බ්‍රහ්මඤ්ඤා කුලෙ ජෙට්ඨාපචායිනො උපොසථං උපවසන්ති පටිජාගරොන්ති පුඤ්ඤානි කරොන්තී'ති.**

කිමෙක් ද? මිනිස් ලොව බොහෝ මිනිස්සු මවට උපස්ථාන කරත් ද, පියාට උපස්ථාන කරත් ද, මහණ බමුණන්ට උපස්ථාන කරත් ද, තම කුලයෙහි දෙටුවන්ට උපස්ථාන කරත් ද, උපෝසථ සිල් රක්නාහු ද, පෙර ගමන් පසු ගමන් වශයෙන් ජාගරියානුයෝගයෙහි යෙදී උපෝසථ සිල් රක්නාහු ද, තෙරුවන් සරණ යෑම, නිති පන්සිල් රැකීම, මල් පූජා පැවැත්වීම, පහන් ආලෝක පූජා පැවැත්වීම, ධර්‍ම ශ්‍රවණය කිරීම, ධර්‍ම දේශනා කරවීම, ධර්‍ම සාකච්ඡා පැවැත්වීම, වෙහෙර විහාර කරවීම ආදී වූ අනෙකුත් පින් කරත් ද යැයි විමසත්.

එසේම පසළොස්වක පුන් පොහොය දිනයෙහි ද දිව්‍ය සභාවෙහි දෙවියන් රැස් වූ විට සක් දෙව් රජතුමා සතර වරම් දෙව් රජවරුන් අමතා "**දරුව, අද මිනිස් ලොව පසළොස්වක පොහොය දිනයයි. එබැවින් මිනිස් ලොව සැරිසරා පින් කරන්නන්ගේ නම් ගොත් රන් පටක ලියා ගෙන රැගෙන එන්න**" යැයි මෙසේ අණ කරයි. එවිට සතර වරම් දෙව් රජවරු ම එය සොයා බැලීම පිණිස මිනිස් ලොවට පැමිණෙති. භාග්‍යවතුන් වහන්සේ එය මෙසේ වදාළ සේක.

**තදහු, භික්ඛවෙ, උපොසථෙ පන්නරසෙ චත්තාරො මහාරාජානො සාමඤ්ඤෙව ඉමං ලොකං අනුවිචරන්ති**

මහණෙනි, පසළොස්වක පුන් පොහෝ දින සිව්වරම් මහරජ දරුවන් ම මේ මිනිස් ලෝකයෙහි සැරිසරති.

**"කච්චි බහූ මනුස්සා මත්තෙය්‍යා පෙත්තෙය්‍යා සාමඤ්ඤා බ්‍රහ්මඤ්ඤා කුලෙ ජෙට්ඨාපචායිනො උපොසථං උපවසන්ති පටිජාගරොන්ති පුඤ්ඤානි කරොන්තී'ති.**

කිමෙක් ද? මිනිස් ලොව බොහෝ මිනිස්සු මවට උපස්ථාන කරත් ද, පියාට උපස්ථාන කරත් ද, මහණ බමුණන්ට උපස්ථාන කරත් ද, තම කුලයෙහි දෙටුවන්ට උපස්ථාන කරත් ද, උපෝසථ සිල් රක්නාහු ද, පෙර ගමන් පසු ගමන් වශයෙන් ජාගරියානුයෝගයෙහි යෙදී උපෝසථ සිල් රක්නාහු ද, තෙරුවන් සරණ යෑම, නිති පන්සිල් රැකීම, මල් පූජා පැවැත්වීම, පහන් ආලෝක පූජා පැවැත්වීම, ධර්ම ශ්‍රවණය කිරීම, ධර්ම දේශනා කරවීම, ධර්ම සාකච්ඡා පැවැත්වීම, වෙහෙර විහාර කරවීම ආදී වූ අනෙකුත් පින් කරත් ද කියා විමසයි.

මෙසේ සක්දෙව් රජතුමාගේ අණ කළ පසු අටවක දිනයන්හි සතර වරම් දෙව් රජවරුන්ගේ නියමයෙන් දිව්‍ය මහ ඇමතියන්ගේ සේවක දෙවියෝ මනුලොවට පැමිණ ගම් නියම්ගම් රාජධානීන්හි සැරිසරති. එකල්හි ගම් නියම් ගම් රාජධානිවල වෘක්ෂ පර්වත භූමි ආදියට අධිගෘහිත ව වෙසෙන භූමස්ථ දෙවියෝ සතර වරම් දෙවියන්ගේ මහ ඇමතිවරු පැමිණියහ යැයි පුද පඬුරු ගෙන ඔවුන් හමුවට යති. එවිට එම දිව්‍ය මහ ඇමතියන් ඒ පුද පඬුරු ගෙන **"පින්වත්නි, කෙසේ ද? බොහෝ මිනිස්සු මවට උපස්ථාන කරත් ද, පියාට උපස්ථාන කරත් ද, මහණ බමුණන්ට උපස්ථාන කරත් ද, තම කුලයෙහි දෙටුවන්ට උපස්ථාන කරත් ද, උපෝසථ සිල් රක්නාහු ද, පෙර ගමන් පසු ගමන් වශයෙන් උපෝසථ සිල් රක්නාහු ද, තෙරුවන් සරණ යෑම, නිති පන්සිල් රැකීම, මල් පූජා පැවැත්වීම, පහන් ආලෝක පූජා පැවැත්වීම, ධර්ම ශ්‍රවණය කිරීම, ධර්ම දේශනා කරවීම, ධර්ම සාකච්ඡා පැවැත්වීම, වෙහෙර විහාර කරවීම ආදී වූ අනෙකුත් පින් කරත් ද"** යැයි මිනිසුන්ගේ පුණ්‍ය ප්‍රතිපත්ති විමසති.

එවිට ඒ භූමස්ථ දෙව්වරු **"නිදුකාණෙනි, මේ ගමෙහි අසවලා ද අසවල් ස්ත්‍රිය ද මවට උපස්ථාන කළේ ය. පියාට උපස්ථාන කළේ ය. තිසරණ සරණ පිහිටියේ ය. පන්සිල් සමාදන්ව රක්නේ ය. තෙරුවන් විෂයෙහි උපුල් මල් සියයකින් යුත් මල් කලයක් පූජා කළේ ය. පහන් දහසක් දැල්වූවේ ය. අකල් ධර්ම දේශනා පැවැත්වූවේ ය. ඡත්‍ර වේදිකා,**

**මුදු ගරාදි වැට, ගඹ වේදිකා, සීහාසන, සීහ සෝපාන කරවන ලද්දේ ය. දස කුසල ධර්මයන්හි යෙදුණේ ය. ශ්‍රමණ බ්‍රාහ්මණාදීන් ට සිවුපසයෙන් සංග්‍රහ කළේ ය. කුල දෙටුවන් පිදුවේ ය. උපෝසථ සිල් සමාදන්ව රක්නේ ය. ධර්ම ශ්‍රවණය කරන්නේ ය. ධර්ම දේශනා කරවන්නේ ය. ධර්ම සාකච්ඡා කරන්නේ ය. වෙහෙර විහාර කරන්නේ ය. වෙහෙර විහාර කරවන්නේ ය. පාලම් ඒ දඬු සකස් කරන්නේ ය"** යනාදී ලෙස කී කල්හි ඒ පින්කම් කරන්නන්ගේ නම් ගොත් රන්මුවා පටක ඇඟිල්ලෙන් ලියා එය රැගෙන අන් තැනක ගොස් එලෙස ම විමසා ලියා එම තොරතුරු ද ගෙන මේ ක්‍රමයෙන් සියලු දඹදිව සැරිසරා පින් කරන්නන්ගේ තොරතුරු ලියා ගෙන ගොස් සතර වරම් දෙව් රජවරුන්ට දෙති.

අමාවක දිනයෙහි සතර වරම් දෙව් රජවරුන්ගේ නියමයෙන් දිව්‍ය පුත්‍රයෝ මනුලොවට පැමිණ පින්කම් කරන්නන්ගේ නම් ගොත් භූමස්ථ දෙවියන්ගෙන් අසා රන්මුවා පටක ලියා ගෙන ගොස් සතර වරම් දෙව් රජවරුන්ට දෙති.

පසළොස්වක පුන් පොහෝ දින සතර වරම් දෙව් රජවරු ම පැමිණ පින්කම් කරන්නන්ගේ නම් ගොත් භූමස්ථ දෙවියන්ගෙන් අසා රන්මුවා පටක ලියා ගෙන යති.

මෙලෙස ගෙන යන රන් පට සතර වරම් දෙව් රජවරුන් විසින් පඤ්චසිඛ දිව්‍ය පුත්‍රයාට බාර දෙති. පඤ්චසිඛ දිව්‍ය පුත්‍රයා ඒවා මාතලී දිව්‍ය පුත්‍රයාට දෙයි. මාතලී දිව්‍ය පුත්‍රයා ඒවා සියල්ල එක් කොට සක්දෙව් රජතුමාට දෙයි.

යම් කලෙක පින් කරන මිනිසුන් අඩු වේ ද, එවිට ඒ පින් පොත කුඩා වෙයි. සුධර්මා දිව්‍ය සභාවට ගෙන යන ඒ පින් පොත දැකීමෙන් ම දෙවියෝ **"දිබ්බා වත භො කායා පරිහායිස්සන්ති. පරිපූරිස්සන්ති අසුරකායා"** යනුවෙන් "දැන් මිනිස් ලොව පින් කරන්නන් අඩු ය. මනුෂ්‍යයෝ ප්‍රමාදව වාසය කරති. එබැවින් අලුත් අලුත් දෙව් පුතුන් දෙව්ලොව පහළ නො වීමෙන් සිත්කලු වූ යොදුන් දස දහසක් ප්‍රමාණයෙන් යුත් මේ මනරම් දිව්‍ය නගරය හිස් වන්නේ ය. සතර

අපායෝ පිරී යති. මෙසේ අපි පිරිපුන් දේව පුරයෙහි දේව සමූහයා මැද නැකත් ක්‍රීඩා කිරීමට නො ලබන්නෙමු" යැයි අසතුටු වෙති.

යම් කලෙක පින් කරන මිනිසුන් බොහෝ වේ ද, එවිට ඒ පින් පොත විශාල වෙයි. සුධර්මා දිව්‍ය සභාවට ගෙන යන ඒ පින් පොත දැකීමෙන් ම දෙවියෝ "**දිබ්බා වත භො කායා පරිපූරිස්සන්ති. පරිහායිස්සන්ති අසුරකායා**" යනුවෙන් "දැන් මිනිස් ලොව පින් කරන්නෝ බොහෝ වෙති. මනුෂ්‍යයෝ අප්‍රමාදී ව වාසය කරති. එබැවින් අලුත් අලුත් දෙව් පුතුන් දෙව්ලොව පහළ වීමෙන් සිත්කලු වූ යොදුන් දස දහසක් ප්‍රමාණයෙන් යුත් මේ මනරම් දිව්‍ය නගරය පිරී යෑම වන්නේ ය. සතර අපායෝ හිස් වෙති. මෙසේ අපි පිරිපුන් දේව පුරයෙහි දේව සමූහයා මැද නැකත් ක්‍රීඩා කිරීමට ලබන්නෙමු" යැයි සතුටු වෙති.

සක්දෙව් රජතුමා ඒ පොත ගෙන කියවයි. එම පින් පොත කුඩා වූ කල්හි සක්දෙව් රජතුමා එය ගෙන ස්වාභාවික හඬින් කියවයි. එවිට ඒ හඬ දොළොස් යොදුනක් දුර ඇසෙයි. පින් පොත මහත් වූ කල්හි ඉතා සතුටින් එය බාර ගෙන උස් හඬින් කියවයි. එවිට යොදුන් දස දහසක වර්ග ප්‍රමාණයෙන් යුත් දිව්‍ය නගරය පුරාවට ඒ හඬ පැතිරී යයි. මෙසේ "**ධර්ම ශ්‍රවණය**" පිණිස දෙවියෝ රැස් වෙති.

## ✪ පරසතු වෘක්ෂයෙහි ආනුභාවයෙන් ක්‍රීඩා කිරීම

තව්තිසා දෙව්ලොව චිත්‍රලතා වනයෙහි ආසාවතී නම් වැලක් ඇත. එම වැලෙහි වර්ෂ දහසක් ඇවෑමෙන් එක ගෙඩියක් හට ගනී. එහි දිව්‍යමය වූ පානයක් පිරී පවතී. බොහෝ කලකට පසු ආසාවතී වැලෙහි ඵලයක් හට ගත්තේය යැයි සතුටු ව තව්තිසා වැසි දෙවියෝ එහි රැස්ව එම ගෙඩිය තුළ ඇති ඕජාව පානය කරති. එය එක් වරක් පානය කළ කල්හි එයින් ඇතිවන මත් වීම සිවු මසක් පහව නොයයි. එබැවින් එය පානය කළ දෙව්වරු සිවු මසක් මුළුල්ලෙහි යහන්වලට වී මතින් කල් ගෙවති. මෙසේ දෙවියන්ට මහත් ආශා උපදවන බැවින් එම වැලට "**ආසාවතී**" යැයි කියනු ලැබේ. එම වැලෙහි ඵලය තුළ හටගන්නා පානයට ආශා කරන දෙව්වරු එම වැල නිරෝගී ව පවතිත් ද යැයි වර්ෂ දහසක් එය අත් නො හැර එය ඇසුරු කොට සිටිති.

එසේම තව්තිසා දෙව්ලොව පරසතු වෘක්ෂයෙහි වෂීයකට එක් වතාවක් මල් පිපෙයි. යම් කලෙක තව්තිසා දෙවියන්ගේ පරසතු වෘක්ෂය කොළ පඬුවන් පැහැ ඇති වෙයි. එකල්හි තව්තිසා දෙවියෝ පරසතු වෘක්ෂය කොළ පඬුවන් පැහැ වූයේ ය. කල් නොයවාම වැටුණ කොළ ඇත්තේ වෙයි යැයි දෙවියෝ සතුටු වෙති.

යම් කලෙක පරසතු වෘක්ෂයෙහි වැටුණ කොළ ඇත්තේ වෙයි ද, එකල්හි තව්තිසා දෙවියෝ පරසතු වෘක්ෂයෙහි වැටුණ කොළ ඇත්තේ ය. කල් නොයවාම දළු ලන්නේ ය යැයි සතුටු වෙති. එහි මල් සහ කොළ එක විටම හට ගනී.

යම් කලෙක පරසතු වෘක්ෂයෙහි දළු හට ගන්නේ වෙයි ද, කල් නොයවාම කුඩා මල් මොට්ටු ඇති වෙයි යයි සතුටු වෙති. එහි මල් කොළ හට ගන්නා විට රටා වියන ලද්දක් මෙන් මල් කොළ හට ගනී.

යම් කලෙක පරසතු රුක කුඩා මල් මොට්ටු ඇති වෙයි ද, එකල්හි තව්තිසා දෙවියෝ පරසතු වෘක්ෂයෙහි කුඩා මල් මොට්ටු ඇතිවිය. කල් නොයවාම මේරූ මල් මොට්ටු ඇති වන්නේ ය යැයි සතුටු වෙති.

යම් කලෙක පරසතු රුක මේරූ මල් මොට්ටු ඇති වෙයි ද, එකල්හි තව්තිසා වැසි දෙවියෝ පරසතු වෘක්ෂයෙහි මේරූ මල් මොට්ටු ඇතිවිය. කල් නොයවාම තැනින් තැන පිපුණු මල් ඇතිවෙයි යැයි සතුටු වෙයි.

යම් කලෙක තව්තිසා දෙවියන්ගේ පරසතු වෘක්ෂයෙහි තැනින් තැන පිපුණු මල් ඇති වෙයි ද, එකල්හි තව්තිසා වැසි දෙවියෝ පරසතු රුක තැනින් තැන පිපුණු මල් ඇතිවිය. කල් නොයවාම වෘක්ෂය මුළුල්ලේ ම මල් පිපෙන්නේ ය යැයි සතුටු වෙයි.

යම් කලෙක තව්තිසා දෙවියන්ගේ පරසතු රුක වෘක්ෂය මුළුල්ලේ ම මල් පිපෙයි ද, සතුටු වූ තව්තිසා දෙවියෝ පරසතු වෘක්ෂ මූලයෙහි සාර මාසයක් පඤ්චකාම ගුණයන්ගෙන් යුක්ත වූවාහු සැප විඳිත්. එය මනුෂ්‍ය වෂී ප්‍රමාණයෙන් අවුරුදු දෙළොස් දහසකි. පිපුණු

මල් ඇති පරසතු වෘක්ෂය ලා හුරු මඬලක් මෙන් හාත්පස පනස් යොදුනක් ප්‍රභාවෙන් බැබළෙන්නේ වෙයි. වාතය අනුව යොදුන් සියයක් සුවඳ හමයි. මෙය පරසතු වෘක්ෂයෙහි ආනුභාවයයි.

මෙම පරසතු වෘක්ෂයෙහි මල් පිපුණු කල්හි ඒ මල් නෙළීම පිණිස ගසට නැගීමක් හෝ කෙක්කක් ගෙන අතු පහත් කිරීමක් හෝ මල් නෙළා බඳුන් ආදියට දැමීමක් හෝ නැත්තේ වේ. එහි මල් පිපුණු කල්හි මල් නෙළන වාතයක් නැගී මල් නැටිවලින් සිඳිති. පිළිගන්නා වාතයෙන් මල් පිළිගනිති. ප්‍රවේශ කරන වාතයෙන් සුධර්මා දිව්‍ය සභාවට ප්‍රවේශ කරති. අමදින වාතයෙන් එම දිව්‍ය සභාවෙහි පර මල් අස් කරයි. අතුරන වාතයකින් කේසර කොළ ඉවත් කර මල් අතුරයි. එහි මධ්‍යයෙහි ධර්මාසනය වෙයි. යොදුනක් පමණ වූ රුවන් අසුනෙහි ඉහළ තුන් යොදුනක් පමණ සේසතක් දරයි. ඉන් අනතුරුව සක් දෙව් රජතුමාට ආසනය අතුරනු ලැබේ. ඉන් පසු සක් දෙව් රජතුමා සමග එක්ව උපන් දිව්‍ය පුත්‍රයින් තෙතිස් දෙනාට ආසන අතුරනු ලැබේ. ඉන් අනතුරුව අනෙකුත් මහේශාක්‍ය දෙවියන්ට ද අනෙකුත් දෙවියන්ට ද මල් ආසන අතුරනු ලැබේ. මෙසේ මල් ආසන සකස් වූ පසු දෙවියෝ දිව්‍ය සභාවට රැස්ව අසුන් ගනිති. ඉක්බිති මල් රේණු වැටී උඩට නැගී ඉහළ මල් කෙමිවල වැදී වැටෙන කල්හි රැස් වුණු දෙවියන්ගේ තුන් ගව් පමණ දිව්‍ය ශරීරයන්හි වැටී ලාකඩ කර්මයෙන් පිරියම් කලාක් මෙන් ද, රන් සුනු ගැවසුණාක් මෙන් ද කරයි. ඇතැම් දෙව්වරු එක එක මල් ගෙන ඔවුනොවුන්ට ගසමින් ද කෙලි සෙල්ලම් කරති. එසේ ගසන විට ද මහ තුඹක් පමණ වූ මල් රොන් නික්ම සිරුර පැහැයෙන් යුත් සුවඳ සුනු වලින් යුක්ත මනෝසිලා ආලේප කලාක් මෙන් කරයි. මෙසේ පරසතු වෘක්ෂානුභාවයෙන් ක්‍රීඩා කිරීම සාර මාසයකින් නිමා වෙති. මෙය **"පරසතු වෘක්ෂානුභාවයෙන් ක්‍රීඩා කිරීම"** නම් වේ.

යම් කලෙක මිනිස් ලොව රජවරු අධාර්මික වෙත් ද, එකල්හි යුව රජවරු අධාර්මික වෙති. යුව රජවරු අධාර්මික වන කල්හි සේනාපතිවරු අධාර්මික වෙති. සේනාපතිවරු අධාර්මික වන කල්හි රාජකාර්‍යයන්හි නියුක්ත පුරුෂයෝ ද අධාර්මික වෙති. ඒ රාජකාර්‍යයන්හි නියුක්ත පුරුෂයන් අධාර්මික වූ කල්හි, බ්‍රාහ්මණ ගෘහපති සිටු ආදීහු අධාර්මික වෙති. බ්‍රාහ්මණ ගෘහපති සිටු ආදීහු අධාර්මික වූ කල්හි, නියම්ගම් දනව් වාසීහු ද, අධාර්මික වෙති. නියම්ගම්

දනව් වැසියන්, අධාර්මික වූ කල්හි චන්ද්‍ර සූර්‍ය්‍යයෝ විෂම ව ගමන් කරති. චන්ද්‍ර සූර්‍ය්‍යයන් විෂම ව ගමන් කරන කල්හි නැකත් හා තරු විෂම ව යති.

යම් සේ ඉල් පොහොය ඉල් නැකත ම ලබයි ද, බිනර පෝය බිනර නැකත ම ලබයි ද මෙසේ ඒ ඒ මාසයෙහි ඒ ඒ පොහොය ම ඒ ඒ නැකත ම ලබයි ද එසේ සමව නො පෙරළෙති. එසේ නැකත් තරු විෂම ව යන කල්හි රෑ දහවල් විෂම වෙති. රෑ දහවල් විෂම වන කල්හි, මාස අඩ මාස විෂම වෙති. මාස අඩ මාස විෂම වූ කල්හි, ඍතු සංවත්සර විෂම වෙති. ඍතු සංවත්සර විෂම වූ කල්හි සුළඟ විෂම ව හමා යයි. යම් සේ සය මසක් උතුරු සුළඟ හමන්නේ ද, සය මසක් දකුණු සුළඟ හමන්නේ ද මෙසේ ඒ ඒ ජනපදයන්ට සුදුසු කාලයෙහි ඇතිවන සුළං එසේ ඇති නොවෙයි. උතුරු දෙසින් දකුණු දිසාවට ද දකුණු දිසාවෙන් උතුරු දිසාවට ද ඇති නොවී අන් දිසාවන්ට හමයි. එසේ ම ඉතා දැඩිව ද ඉතා මෘදු ව ද හමයි.

එසේ විෂම මාර්‍ගයන්හි, විෂම ව වාතය හමන කල්හි ගස් බිඳී වැටෙති. ගස් බිඳී වැටෙන කල්හි ඒ ගස් ඇසුරු කොට ඇති දිව්‍ය විමන් ද බිඳෙති. දිව්‍ය විමන් බිඳුණු කල්හි දෙවියෝ කිපෙති. දෙවියන් කුපිත වූ කල්හි වර්‍ෂාව මනාව වසින්නට ඉඩ නොදෙති. ඒ හේතුවෙන් වළාකුළු මනාව වර්‍ෂාව නො හෙළති. වළාකුළු මනාව වැසි දහර නො හෙළන කළ සස්‍යයෝ නියම අයුරින් නො පැසෙයි. විෂම ව පැසෙති. ගන්ධ රස වර්‍ණ ආදියෙන් තොර වෙයි. ඒ හේතුවෙන් එකම කුඹුරෙහි එක් තැනක ගොයම් ගැබ් ගන්නේ වෙයි. එක් තැනක කිරි වදින්නේ වෙයි. එක් තැනක පැසෙයි. එක ම වී කරලක වුව ද එහි මුල් ඇට ගැබ් ගන්නේ වෙයි. මැද ඇට කිරි වදින්නේ වෙයි. අග ඇට පැසෙන්නේ වෙයි. මෙලෙස ගොයම් විෂම ව තුන් ආකාරයකින් පැසෙන කල්හි ඒවා එක භාජනයක පිසින කල්හි නො පැසී ඇති සහලේ බත බෙරි වෙයි. අඩක් පැසී ඇති සහලේ බත මධ්‍යස්ථ ව ඉදෙයි. හොඳින් පැසී ඇසි සහලේ බත අමුව සිටී. මෙසේ එකම සැළියෙහි බත තුන් අයුරකින් ඉදෙයි. එම බත අනුභව කරන මනුෂ්‍යයන්ගේ කුස තුළ එම ආහාරය තුන් ආකාරයකින් ජීර්‍ණය වීම සිදු වෙයි. ඒ හේතුවෙන් මනුෂ්‍යයෝ අල්පායුෂ්ක වූවාහු වෙති. දුර්වර්‍ණ වූවාහු වෙති. දුර්‍වල වූවාහු වෙති.

බොහෝ ලෙඩ ඇත්තාහු වෙති. මෙසේ විෂම වූ සෘතු භෝජන හේතුවෙන් ආයු වර්ණ ආදී සම්පත්තියෙන් මිනිස් ලොව හීන වේ.

මිනිස් ලොව රජවරු අධාර්මික වෙත් ද එකල්හි යුව රජ, සේනාපති, සිටුවරු හා සියලු නුවර වාසීන් අධාර්මික වෙති. ඉක්බිති ඔවුන්ගේ ආරක්ෂක දේවතාවෝ ද එම ආරක්ෂක දෙවියන්ගේ මිත්‍ර වූ භූමිය ඇසුරු කොට වෙසෙන දෙවියෝ ද ඒ භූමස්ථ දෙවියන්ගේ මිත්‍ර වූ ආකාසස්ථ දෙවියෝ ද එම ආකාසස්ථ දෙවියන්ගේ මිත්‍ර වූ වළාකුළු ඇසුරු කොට වෙසෙන දෙවියෝ ද එම වළාකුළු ඇසුරු කොට වෙසෙන දෙවියන්ගේ මිත්‍ර වූ සීත වළාහක දෙවියෝ ද එම සීත වළාහක දෙවියන්ගේ මිත්‍ර වූ වැස්ස වළාහක දෙවියෝ ද එම වැස්ස වළාහක දෙවියන්ගේ මිත්‍ර වූ චාතුර්මහාරාජික දෙවියෝ ද එම චාතුර්මහාරාජික දෙවියන්ගේ මිත්‍ර වූ තාවතිංස දෙවියෝ ද එම තාවතිංස දෙවියන්ගේ මිත්‍ර වූ යාම දෙවියෝ ද එම යාම දෙවියන්ගේ මිත්‍ර වූ තුසිත දෙවියෝ ද එම තුසිත දෙවියන්ගේ මිත්‍ර වූ නිර්මාණරතී දෙවියෝ ද එම නිර්මාණරතී දෙවියන්ගේ මිත්‍ර වූ පරනිර්මිත වසවර්ති දෙවියෝ ද අධාර්මික වෙති. ඉන් පසු එම දෙවියන් සමග මිත්‍ර වූ බ්‍රහ්ම පාරිසජ්ජ බඹලොව බ්‍රහ්මයෝ ද එම බ්‍රහ්ම පාරිසජ්ජ බ්‍රහ්මයන්ගේ මිත්‍ර වූ බ්‍රහ්ම පුරෝහිත බ්‍රහ්මයෝ ද මෙම ක්‍රමයෙන් භවාග්‍රය දක්වා ම ආර්‍ය්‍ය ශ්‍රාවකයන් හැර සියලු දෙවි බඹුන් අධාර්මික වෙති.

යම් කලෙක මනුලොව රජවරු ධාර්මික වෙත් ද, එවිට යුව රජවරු ධාර්මික වෙති. යුව රජවරු ධාර්මික වන කල්හි සේනාපතිවරු ධාර්මික වෙති. සේනාපතිවරු ධාර්මික වන කල්හි රාජකාර්‍ය්‍යයන්හි නියුක්ත පුරුෂයෝ ද ධාර්මික වෙති. ඒ රාජකාර්‍ය්‍යයන්හි නියුක්ත පුරුෂයන් ධාර්මික වූ කල්හි බ්‍රාහ්මණ ගෘහපති සිටු ආදීහු ධාර්මික වෙති. බ්‍රාහ්මණ ගෘහපති සිටු ආදීහු ධාර්මික වූ කල්හි නියම්ගම් දනව් වාසීහු ද ධාර්මික වෙති. නියම්ගම් දනව් වැසියන් ධාර්මික වූ කල්හි චන්ද්‍ර සූර්‍ය්‍යයෝ සම ව නියම මාර්ගයෙහි ගමන් කරති. චන්ද්‍ර සූර්‍ය්‍යයන් සමව ගමන් කරණ කල, නැකත් තාරකා සමව ගමන් කරත්. නැකත් තාරකා සමව ගමන් කරණ කල්හි රෑ දහවල් සමව පිහිටයි. රෑ දහවල් සමව පිහිටි කල්හි, මාස අර්ධ මාසයෝ සම වෙයි. මාස අර්ධ මාස සම වූ කල්හි, ඍතු සංවත්සර සම වෙති. ඍතු සංවත්සර සම වූ කල්හි, සමව නියම මාර්ගයෙහි වාතය හමයි. වාතය සමව හමන කල්හි ගස් බිඳී

නොවැටෙති. ගස් බිඳී නො වැටෙන කල්හි ඒ ගස් ඇසුරු කොට ඇති දිව්‍ය විමන් නො බිඳෙති. දිව්‍ය විමන් නො බිඳුණු කල්හි දෙවියෝ නොකිපෙති. දෙවියන් කුපිත නොවූ කල්හි වර්‍ෂාව මනාව වසින්නට ඉඩ දෙති. ඒ හේතුවෙන් වළාකුළු මනාව වර්‍ෂාව හෙළති. වළාකුළු මනාව වැසි දහර හෙළන කළ සෂ්‍යයෝ සම ව පැසෙති. ඒ හේතුවෙන් කුඹුරක එක සමානව ගොයම් ගැබ් ගන්නේ වෙයි. එක සමානව කිරි වදින්නේ වෙයි. එක සමානව පැසෙයි. එක ම වී කරලක වුව ද එහි මුල මැද අග එක සමානව ගැබ් ගනී එක සමානව කිරි වදියි. එක සමානව පැසෙයි. මෙලෙස ගොයම් සම ව පැසෙන කල්හි ඒවා එක භාජනයක පිසින කල්හි එක සමානව බත ඉදෙයි. එම බත අනුභව කරන මනුෂ්‍යයන්ගේ කුස තුළ එම ආහාරය එක සමානව ජීර්ණ වීම සිදු වෙයි. ඒ හේතුවෙන් මනුෂ්‍යයෝ දීර්‍ඝායුෂ වූවාහු වෙති. වර්‍ණවත් වූවාහු වෙති. ශක්ති සම්පන්න වූවාහු වෙති. ලෙඩ රෝග නැති වූවෝ වෙති. මෙසේ සම වූ ඍතු භෝජන ලැබීම හේතුවෙන් ආයු වර්‍ණ ආදී මිනිස් ලොව සම්පත්තියෙන් ආඪ්‍ය වේ.

යම් සේ මිනිස් ලොව රජවරු ධාර්මික වෙත් ද එකල්හි යුව රජ, සේනාපති, සිටුවරු හා සියලු නුවර වාසීන් ද ධාර්මික වෙති. ඉක්බිති ඔවුන්ගේ ආරක්‍ෂක දේවතාවෝ ද එම ආරක්‍ෂක දෙවියන්ගේ මිත්‍ර වූ භූමිය ඇසුරු කොට වෙසෙන දෙවියෝ ද ඒ භූමස්ථ දෙවියන්ගේ මිත්‍ර වූ ආකාසස්ථ දෙවියෝ ද එම ආකාසස්ථ දෙවියන්ගේ මිත්‍ර වූ වළාකුළු ඇසුරු කොට වෙසෙන දෙවියෝ ද එම වළාකුළු ඇසුරු කොට වෙසෙන දෙවියන්ගේ මිත්‍ර වූ සීත වළාහක දෙවියෝ ද එම සීත වළාහක දෙවියන්ගේ මිත්‍ර වූ වැස්ස වළාහක දෙවියෝ ද එම වැස්ස වළාහක දෙවියන්ගේ මිත්‍ර වූ චාතුර්මහාරාජික දෙවියෝ ද එම චාතුර්මහාරාජික දෙවියන්ගේ මිත්‍ර වූ තාවතිංස දෙවියෝ ද එම තාවතිංස දෙවියන්ගේ මිත්‍ර වූ යාම දෙවියෝ ද එම යාම දෙවියන්ගේ මිත්‍ර වූ තුසිත දෙවියෝ ද එම තුසිත දෙවියන්ගේ මිත්‍ර වූ නිර්මාණරතී දෙවියෝ ද එම නිර්මාණරතී දෙවියන්ගේ මිත්‍ර වූ පරනිර්මිත වසවර්ති දෙවියෝ ද ධාර්මික වෙති. ඉන් පසු එම දෙවියන් සමග මිත්‍ර වූ බ්‍රහ්ම පාරිසජ්ජ බඹලොව බ්‍රහ්මයෝ ද එම බ්‍රහ්ම පාරිසජ්ජ බ්‍රහ්මයන්ගේ මිත්‍ර වූ බ්‍රහ්ම පුරෝහිත බ්‍රහ්මයෝ ද මෙම ක්‍රමයෙන් භවාග්‍රය දක්වා ම සියලු දෙව් බඹුන් ධාර්මික වෙති.

තරණය කරන ගවයන් අතර කල්හි පුංගවයා (ප්‍රධාන ගවයා) කුටිලව (ඇදට) ගිය කල්හි, අන් සියලු ගවයෝ ම ඇදට යති.

එසේම මනුෂ්‍යයන් අතරෙහි යම් මිනිසෙක් ශ්‍රේෂ්ඨ යැයි සම්මත වෙයි ද, හෙතෙම අධර්මයෙහි හැසිරෙයි නම්, සෙසු ජනයා ගැන කියනුම කවරේද? රජු අධාර්මික වේ නම් මුළු රටම දුකට පත් වේ.

තරණය කරන ගවයන් එතර වන කල්හි ප්‍රධාන ගවයා අකුටිලව (ඍජුව) යයි නම් නායක ගවයා ඍජු ව යන කල්හි අන් සියලු ගවයෝ ම ඍජුව යති.

එසේම මනුෂ්‍යයන් අතරෙහි යම් මිනිසෙක් ශ්‍රේෂ්ඨ යැයි සම්මත වේ ද, හෙතෙම ධර්මයෙහි හැසිරෙයි ද, සෙසු ජනයා ගැන කියනුම කවරේ ද, රජු ධාර්මික වේ නම් සියලු රටම සැපවත් වේ.

## ❄ වලාහක දෙවියෝ

**"වලාහකකායිකාති වලාහකනාමකෙ දෙවකායෙ උප්පන්නා ආකාසචාරිකදෙවා"** වලාහක දෙවියෝ නම් දේව කොට්ඨාශයෙහි උපන් ආකාශචාරී දෙවියෝ ය. **"සීත වලාහක, උන්හ වලාහක, අබ්භ වලාහක, වාත වලාහක, වැස්ස වලාහක"** යැයි වලාහක දේව කොට්ඨාශ පසක් වෙති. එයින් සීතල ඇති කරවන හා සීතල නැති කරවන වළාකුළු **"සීත වලාහක"** නම් වෙති. උෂ්ණය ඇති කරවන හා උෂ්ණය නැති කරවන වළාකුළු **"උණ්හ වලාහක"** නම් වෙති. වලා පටලයන්හි වෙසෙන ආකාශය පුරා සැරිසරන වළාකුළු ඇසුරු කරගත් දෙවියන් **"අබ්භවලාහක"** නම් වෙති. වාතය ඇසුරු කොට සැරිසරන දිව්‍ය පුත්‍රයෝ **"වාතවලාහක"** නම් වෙති. වර්ෂාව ඇති කරවන වලාහක දෙවියෝ වැස්සවලාහක නම් වෙති.

පූර්වයෙහි මනුෂ්‍යයෝ වලාහක දෙවියෝ දීර්ඝායුෂ ඇත්තාහ. වර්ණ ඇත්තාහ. සැප බහුල කොට ඇත්තාහ අසන්නට ලැබී, **"මම ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු වලාහක දෙවියන් හා එක්වීමට පැමිණෙන්නෙමි**

**නම් හොඳය**" යැයි සිතූහ. ඇතැමෙක් එසේ වූ ප්‍රාර්ථනා ඇතිව කයින් සුචරිතයෙහි හැසිර, වචනයෙන් සුචරිතයෙහි හැසිර, සිතින් සුචරිතයෙහි හැසිර ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු වලාහක දෙවියන් හා එක්වීමට පැමිණියේ ය.

තව ද ඇතමෙක් වලාහක දෙවියෝ දීර්ඝායුෂ ඇත්තාහ. වර්ණ ඇත්තාහ. සැප බහුල කොට ඇත්තාහ අසන්නට ලැබී "**ආහාර - පාන -වස්ත්‍ර - යාන - මල් - සුවඳ - විලවුන් - සයන - ආවාස - ප්‍රදීප**" යන දස දන වස්තු දන් දී ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු වලාහක දෙවියන් හා එක්වීමට පැමිණියේ ය. ඉන් පසු ඒ දෙවියන් ආයු කෙළවර ඒ තැන්වලින් ච්‍යුතව ගියේ නමුත් ඒ දිව්‍ය විමන් ඉතිරි වන්නේ ය.

වස්සාන ඍතුවෙහි හෝ හේමන්ත ඍතුවෙහි පරිසරයෙහි සීතලක් ඇති වෙයි ද, එය ඍතු නියාමය අනුව ම වන්නේ ය. යම් සීත කාලයක ඇතිවන අධික සීතලක් වේ ද, එසේ ම ග්‍රීෂ්ම කාලයක ඇතිවන යම් උණුසුමක් වේ ද මෙය සීත වලාහක දෙවියන්ගේ ආනුභාවෙන් ම සිදු වේ. යම් විටක සීත වලාහක දෙවියන්ට "**අපි ඒකාන්තයෙන් සීතල වැඩි කොට ප්‍රීති වන්නෙමු**" යැයි මෙබඳු සිතක් වෙයි. එවිට ඒ දෙවියන්ගේ සිතේ පැතීම අනුව ම සීත කාලයක අධික සීතලක් ඇති වෙයි ද, එසේ ම උෂ්ණ කාලයක යම් සීතලක් ඇති වෙයි ද එය සීත වලාහක දෙවියන් නිසාම සිදු වේ.

ගිම්හාන ඍතුවෙහි ඇතිවන උෂ්ණය ඍතු නියාමය අනුව සිදු වේ. යම් විටක උෂ්ණ කාලයෙහි ඇතිවන අධික උණුසුමක් වේ ද, එසේ ම සීත කාලයෙහි ඇතිවන යම් උණුසුමක් වේ ද මෙය උණ්හ වලාහක දෙවියන් නිසා ම සිදු වේ. යම් විටක උණ්හ වලාහක දෙවියන්ට "**අපි ඒකාන්තයෙන් උණුසුම වැඩි කොට ප්‍රීති වන්නෙමු**" යැයි මෙබඳු සිතක් වෙයි. එවිට ඒ දෙවියන්ගේ සිතේ පැතීම අනුව ම උෂ්ණ කාලයෙහි ඇතිවන අධික උෂ්ණය ද, ඇතැම් සීත කාලයක ඇතිවන උෂ්ණය ද උණ්හ වලාහක දෙවියන්ගේ ආනුභාවෙන් ම සිදු වේ.

වස්සාන ඍතුවෙහි හා සිසිර ඍතුවෙහි ආකාශයෙහි හට ගන්නා වළාකුළු ඍතු නියාමය අනුව ම සිදු වේ. යම් විටක ආකාශයෙහි වළාකුළු ඇති වීමක දී දැඩි වළාකුළු හට ගැනීමක් වෙයි ද, සත් දිනක්

චන්ද්‍ර සූර්‍ය්‍ය දෙදෙනා පවා වසාගෙන දැඩි අඳුරක් පවතී ද මෙය අබ්භ වලාහක දෙවියන් නිසාම සිදු වෙයි. යම් විටක අබ්භ වලාහක දෙවියන්ට "**අපි ඒකාන්තයෙන් වළාකුළු වැඩි කොට ප්‍රීති වන්නෙමු**" යැයි මෙබඳු සිතක් වෙයි. එවිට ඒ දෙවියන්ගේ සිතේ පැතීම අනුව ආකාශයෙහි වළාකුළු ඇති වීමක දී වළා පටල සිය ගණනක් දහස් ගණනක් වන ලෙස දැඩි වළාකුළු හට ගැනීමක් වෙයි ද, සත් දිනක් චන්ද්‍ර සූර්‍ය්‍ය දෙදෙනා පවා වසාගෙන දැඩි අඳුරක් පවතී ද, බක් වෙසක් මාසයන්හි වළාකුළු ඇති වෙයි ද එය අබ්භ වලාහක දෙවියන්ගේ ආනුභාවෙන් ම සිදු වේ.

හේමන්ත ගිම්හාන වස්සාන ඍතුන්හි දී උතුරු දිසාවෙහි සිට දකුණු දිසාවට ද, දකුණු දිසාවෙහි සිට උතුරු දිසාවට ද හට ගන්නා ස්වාභාවික සුළඟක් වෙයි ද ඍතු නියාමය අනුව ම සිදු වේ. යම් සුළඟක් ගස් කොළං බිඳ දමමින් ගෙවල් නසමින් දැඩිව හට ගනී ද, නොකල්හි හටගත් යම් සුළඟක් වෙයි ද ඒ සියල්ල දෙවියන්ගේ ආනුභාවයෙන් හටගත් සුළං නම් වේ.

යම් විටක වාත වලාහක දෙවියන්ට "**අපි ඒකාන්තයෙන් දැඩි සුළං ඇති කොට ප්‍රීති වන්නෙමු**" යැයි මෙබඳු සිතක් වෙයි. එවිට ඒ දෙවියන්ගේ සිතේ පැතීම අනුව ගස් කොළං බිඳ දමමින් ගෙවල් නසමින් දැඩිව සුළං හට ගනී, නොකල්හි සුළං හට ගැනීම වෙයි. මෙය වාත වලාහක දෙවියන් නිසාම සිදු වේ.

වස්සාන ඍතුවෙහි සාර මාසය තුළ හටගන්නා වැසි ඍතු නියාමය අනුව ම සිදු වෙයි. යම් වර්ෂාවක් වස්සාන ඍතුවෙහි අධික ව පවතී ද, බක් වෙසක් මාසයන්හි වසින වැසි ද වැස්ස වලාහක දෙවියන් නිසාම සිදු වෙයි. යම් විටක වැස්ස වලාහක දෙවියන්ට "**අපි ඒකාන්තයෙන් වැසි වැඩි කොට ප්‍රීති වන්නෙමු**" යැයි මෙබඳු සිතක් වෙයි. එවිට ඒ දෙවියන්ගේ සිතේ පැතීම අනුව වස්සාන ඍතුවෙහි අධික ව පවතින වැසි ද, බක් වෙසක් මාසයන්හි වසින වැසි ද වැස්ස වලාහක දෙවියන් නිසා ම සිදු වෙයි. ඒ පිළිබඳ නිදසුනක් මෙසේ ය.

පෙර එක් දිව්‍ය පුත්‍රයෙක් හිමාල පර්වතයෙහි වැඩ සිටි රහතන් වහන්සේ නමක් සමීපයට ගොස් වැඳ එකත් පසෙක සිටියේ ය. තෙරුන්

වහන්සේ **"නුඹ කවරෙක් ද?"** යැයි ඇසුවේ ය. එවිට දිව්‍ය පුත්‍රයා **"ස්වාමින් වහන්ස, මම වැස්ස වලාහක දිව්‍ය පුත්‍රයෙක්මි"** යැයි කීවේ ය. එකල්හි රහතන් වහන්සේ **"දිව්‍ය පුත්‍රය, නුඹගේ සිතෙහි මෙහෙයවීමෙන් වැසි වසින්නෙහි ද?"** යැයි ඇසුවේ ය. එවිට **"ස්වාමින් වහන්ස, එසේය"** යැයි පිළිතුරු දුන්නේ ය. එකල්හි **"අපි එය දකිනු කැමැත්තෙමි"** යැයි රහතන් වහන්සේ කීවේ ය. එවිට දිව්‍ය පුත්‍රයා **"ස්වාමින් වහන්ස, නුඹ වහන්සේ තෙමෙන්නේ ය"** යැයි කීවේ ය. එකල්හි තෙරුන් වහන්සේ **"දිව්‍ය පුත්‍රය, වැහි වලාකුළක් හෝ මේඝ ගර්ජනාවක් හෝ නො පෙනෙයි. කෙසේ තෙමෙන්නේ ද?"** යැයි ඇසුවේ ය. එවිට දිව්‍ය පුත්‍රයා **"ස්වාමින් වහන්ස, මගේ සිතින් වැස්ස වසී. නුඹ වහන්සේ පන්සලට වඩින්න"** යැයි කීවේ ය. එවිට තෙරුන් වහන්සේ **"යහපති දිව්‍ය පුත්‍රය"** යැයි කියා පා සෝද පන්සලට වැඩියේ ය. එවිට එම දිව්‍ය පුත්‍රයා එක් වැසි ගීයක් ගයා අහසට අත එසවී ය. ඒ ක්ෂණයෙහි ම හාත්පස තුන් යොදුනක් පමණ ප්‍රදේශයෙහි එකම මේඝයක් විය. තෙරුන් වහන්සේ අඩක් තෙත් වූණු සිවුරෙන් යුතුව විහාරයට වැඩියේ ය.

වැසි ඇතිවීම කරුණු අටකින් සිදු වෙති. එනම් :- නාගයන්ගේ ආනුභාවයෙන්, සුපර්ණයන්ගේ ආනුභාවයෙන්, දෙවියන්ගේ ආනුභාවයෙන්, මහා බෝධිසත්ව ආදී මහත් ගුණ ඇති උතුමන්ගේ සත්‍යක්‍රියා බලයෙන්, ඍතු හට ගැනීමෙන්, මාරාවර්තනයෙන්, ඍද්ධිමතුන්ගේ ආනුභාවයෙන්, කල්ප විනාශය පිණිස වළාකුළු විනාශ වී යෑමෙන් සිදු වේ. තව ද සත්වයන්ගේ අකුසල කර්ම බලය උත්සන්න වීම හේතුවෙන් ඒ පාප කර්මයන්ගේ බලයෙන් මහත් වැසි හට ගෙන ඒ ඒ දේශ විනාශයට පත් වෙති.

තව ද චන්ද්‍ර සූර්ය්‍ය මණ්ඩල හා නැකත් තාරකා මණ්ඩල හා මහා පෘථිවිය ද යන මේ සියල්ල සකස් වූයේ ආදි කල්පික මනුෂ්‍යයන්ගේ ප්‍රාර්ථනා අනුව ය. ඒවා ඒ මනුෂ්‍යයන්ගේ සිත ප්‍රත්‍ය වීමෙන් ඍතු නියාමයෙන් හට ගත්තේ ය.

එලෙස සකස් වූයේ ද සත්වයන් විසින් කර ගන්නා ලද කුසල කර්ම හේතුවෙන් සත්වයන්ගේ පැවැත්ම උදෙසාම ය. එබැවින් සත්වයෝ දස පුණ්‍ය ක්‍රියා දස කුසල ධර්ම ආදී කුසල ධර්මයන්හි යෙදී වාසය කරන

කල්හි එම සත්වයන්ගේ සැප විහරණය පිණිස ඉර හඳ නැකත් තරු මහ පොළොව කාල ගුණය දේශගුණය ආදී මේ සියල්ලගේ ම පැවැත්ම සමව සිදු වේ. සත්වයන් දස අකුසල කර්ම පඤ්ච දුෂ්චරිත ආදී අකුසලයන්හි යෙදී වාසය කරන කල්හි ඉර හඳ නැකත් තරු මහ පොළොව කාල ගුණය දේශගුණය ආදී මේ සියල්ලගේ ම පැවැත්ම සත්වයන්ට අහිත පිණිස විෂම ව සිදු වේ.

මිනිස් ලොව දස රාජ ධර්මයෙන් සතර සංග්‍රහ වස්තුවෙන් යුතුව රාජ්‍යානුශාසනා කරන රජවරු ඇති නිති පන්සිල් පොහොය අටසිල් ආරක්‍ෂා කරන මව්පිය උපස්ථාන කරන තෙරුවන් පුදන මිනිසුන් වෙසෙන ධාර්මික පැවතුම් ඇති කාල පරිච්ඡේදයන්හි ඉර හඳ නැකත් තරු සම තැන්හි පිහිටා ඍතු සම වී රෑ දහවල් මාස සංවත්සර සම බවට පත්ව අව් වැසි සුළං ආදිය සියල්ල සත්වයන්ගේ පිනෙන් ම සියල්ල සමව ඇති වේ. එම කාලයන්හි දී වලාහක දේව ආදීන්ට විශේෂයෙන් කිරීමට කිසිවක් ඉතිරි නොවේ.

## ☸ රාජෝවාද ජාතකය

පෙර බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ කෙනෙක් රාජ්‍ය කරවන කල්හි අප මහ බෝසතාණන් වහන්සේ බ්‍රාහ්මණ කුලයෙහි ඉපිද වැඩි විය පැමිණ උගත යුතු සියලු ශිල්ප ඉගෙන තවුස් පැවිද්දෙන් පැවිදි ව අෂ්ට සමාපත්ති හා පඤ්ච අභිඥා උපදවා ගෙන හිමාලයෙහි රමණීය වූ භූමි ප්‍රදේශයක ආශ්‍රමයක් සාදගෙන වන මුල් පලවලින් ජීවත් වූයේ ය. එකල්හි බරණැස් රජතුමා තමාගේ කිසියම් වරදක් අඩුපාඩුවක් ඇත් ද යැයි සොයමින් ස්වයං පර්යේෂණයෙහි යෙදෙමින් වාසය කරයි. රජතුමා එක් දිනක් **"රටේ ජනතාව තමාගේ අගුණ කථා කරත් ද"** යැයි විමසා බැලීම පිණිස තීරණය කරගෙන රට පුරාම දූතයන් යොදවා ඒ පිළිබඳව සොයා බැලුවේ ය. එහෙත් ඒ දූතයන්ට රජතුමාගේ දෙස් කියන්නෙකු මුණ නො ගැසුණහ. එයින් රජතුමා තමා පිළිබඳව රටෙහි දෙස් දකින්නෙකු නැති බව දැන ගෙන එයින් සෑහීමකට පත් නොවී වෙස් වලාගෙන ජනපද චාරිකාවෙහි යෙදෙන්නට සිතා රාජ්‍ය පුරා සැරිසැරුවේ ය. එම චාරිකාවෙන් ද රට තුළ ද රටෙන් බැහැර ජනපදයෙහි ද තමා පිළිබඳ දෙස් දකින්නෙකු නැති බව තේරුම් ගෙන

තමාගේ ගුණ ගැන පමණක් කථා කරන රටවැසියන් පිළිබඳව සතුටු වී තමාගේ රාජ්‍යයට අයත් හිමාලය ප්‍රදේශයෙහි හෝ තමාගේ දෙස් දකින්නෙකු ඇත් ද යැයි සිතා හිමත් ප්‍රදේශයට පිවිසියේ ය. මෙසේ හිමාල වනයෙහි සැරිසරන රජතුමාට මහ බෝසතාණන් වහන්සේගේ ආශ්‍රමය මුණ ගැසුණේ ය. එම ආශ්‍රමයට ගිය රජතුමා මහ බෝසතාණන් වහන්සේට නමස්කාර කොට එකත් පසෙක හිඳ ගත්තේ ය.

එවිට මහ බෝසතාණන් වහන්සේ වනයෙන් ගෙනෙන ලද ඉදුණු නුග ගෙඩි රජතුමාට අනුභව කිරීමට දුන්නේ ය. එම නුග ඵල ඉතා මිහිරි ය. සාරයෙන් පිරිපුන් ය. හකුරු රසයෙන් යුක්ත ය. මහ බෝසතාණන් වහන්සේ ඒ නුග ඵල රජතුමාට දී "**පින්වත,, මේ නුග ඵල අනුභව කොට පැන් පානය කරනු මැනව**" යැයි කීවේ ය. රජතුමා ද ඒ නුග ඵල අනුභව කොට පැන් බී "**ස්වාමීනි, මේ නුග ගෙඩි අතිශයින් රසවත් ය. ඉතා මිහිරි ය. ඊට හේතුව කුමක් ද?**" යැයි ඇසුවේ ය. එවිට මහ බෝසතාණන් වහන්සේ "**පින්වත එසේ ය. ඒකාන්තයෙන් මේ රටෙහි රජතුමා දැහැමියෙකු විය යුතු ය. රජු දැහැමින් රාජ්‍ය කරවන කල්හි සැම දෙයම සඵල වෙයි. යටත් පිරිසෙයින් ගස් වැල්වල ගෙඩි පවා මෙසේ වෙයි. රජවරු අදැහැමි වූ කල්හි සියල්ල අයහපත් වෙයි. තෙල් මී පැණි ආදිය පමණක් නොව වන මුල් පලවැල පවා අමිහිරි වෙයි. නිසරු වෙයි. හුදෙක් මුලු රට ම නිසරු වෙයි. තව ද රජු දැහැමි වන විට මුළු රට ම සරු වෙයි**" යැයි පිළිතුරු දුන්නේ ය.

තමා රජු බව නො හැඟවූ රජතුමා "**ස්වාමීනි, එසේ වී නම් එකත් එකට ම අපගේ රජතුමා දැහැමියෙකු විය යුතුය**" යැයි කියා තාපසයන් වහන්සේට වැඳ බරණැසට ගොස් "**තාපසයන් වහන්සේගේ වචනය විමසා බැලිය යුතුය**" යැයි තීරණය කොට අධර්මයෙන් රට පාලනය කිරීමට පටන් ගත්තේ ය. එසේ කොට ටික කලකට පසු රජතුමා නැවත තාපසයන් වහන්සේ හමුවීමට හිමවතට ගියේ ය.

මහ බෝසතාණන් වහන්සේ ද පෙර පරිදි ම රජතුමාට නුග ගෙඩිවලින් සංග්‍රහ කළේ ය. එය අනුභව කළ රජතුමාට ඒ නුග ගෙඩි තිත්ත බව වැටහුණේ ය. ක්ෂණයකින් කෙළත් සමග ඒ නුග ගෙඩි කටින් ඉවත දැමූ රජතුමා "**ස්වාමීනි, ඉතා රසවත් වූ නුග ගෙඩිවලට කුමක් වී ද?**" යැයි තාපසයන් වහන්සේගෙන් විමසුවේ ය. එවිට මහ

බෝසතාණන් වහන්සේ **"පින්වත, ඒකාන්තයෙන් රජතුමා අදැහැමියෙකු විය යුතු ය. එසේ නොමැති නම් මෙය කෙසේ වත් සිදු විය නොහැකිය. රජවරු අදැහැමි වූ කල්හි සියල්ල ම නොපිට පෙරළෙයි"** යැයි කියා මෙසේ වදාළ සේක.

**"ගවෙ චෙ තරමානානං - ජිම්භං ගච්ඡති පුඞ්ගවො,**
**සබ්බා තා ජිම්භං ගච්ඡන්ති - නෙත්තෙ ජිම්භං ගතෙ සති"**

යම් සේ නදිය තරණය කර එගොඩ තොට වෙත දියෙහි පීනා යන ප්‍රධාන ගවයා එහා තොට දෙසට කෙලින් නොගොස් ඇදට (පහළට) පීනා යයි ද, එලෙස නායක ගවයා ඇදට පීනා යන කල්හි ඔහු පසුපස පීනා යන සියලු ගවයෝ ද ඇදට ම (පහළට ම) පීනා යති.

**"එවමෙව මනුස්සෙසු - යො හොති සෙට්ඨසම්මතො,**
**සො චෙ අධම්මං චරති - පගෙව ඉතරා පජා,**
**සබ්බං රට්ඨං දුඛං සෙති - රාජා චෙ හොති අධම්මිකො"**

එපරිද්දෙන් මිනිසුන් අතර යමෙක් ශ්‍රේෂ්ඨ යැයි සම්මත ද, ඒ රාජ්‍යයෙහි වෙසෙන ජනයාට ප්‍රධාන වූ රජතුමා ඡන්ද ද්වේෂ භය මෝහ යන සතර අගතියෙන් යුතුව පඤ්ච දුශ්චරිත දස අකුසල් ආදියෙහි යෙදෙමින් අධර්මයෙන් රට පාලනය කරයි ද, සෙසු ප්‍රජාව ද එසේ ම අගතිගාමී ව පඤ්ච දුෂ්චරිත දස අකුසල ආදී දුසිරිතෙහි යෙදී අධර්මයෙන් ජීවිකාව කරති. යම් විදියකින් රටේ රජු අධාර්මික වෙයි ද, එවිට මුළු රට ම දුකට පත් වෙති. සත්වයෝ සිවු ඉරියව්ව ම දුකෙන් ගෙවති.

**"ගවං චෙ තරමානානං - උජුං ගච්ඡති පුඞ්ගවො,**
**සබ්බා ගාවී උජුං යන්ති - නෙත්තෙ උජුං ගතෙ සති"**

ඉඳින් නදිය තරණය කරන ගවයන් අතුරෙන් ප්‍රධාන ගවයා ඍජු ව එතර තොට බලා පීනා යයි ද, එලෙස නායක ගවයා ඍජු ව පීනා යන කල්හි ඒ පසුපස පීනා යන සියලු ගවයෝ ද ඍජුව ම පසුපස පීනා යති.

**"එවමෙව මනුස්සෙසු - යො හොති සෙට්ඨසම්මතො,**
**සො සචෙ ධම්මං චරති - පගෙව ඉතරා පජා,**
**සබ්බං රට්ඨං සුඛං සෙති - රාජා චෙ හොති ධම්මිකො"**

එපරිද්දෙන් මිනිසුන් අතර ශ්‍රේෂ්ඨ යැයි සම්මත, රජතුමා සතර අගතියෙහි නො යෙදී පස් පවු දස අකුසල් නොකොට දස රාජ ධර්මය සතර සංග්‍රහ වස්තුව ආදී ධර්මයන්හි හැසිරෙයි ද, එකල්හි සෙසු ප්‍රජාව ද එසේ ම පස් පවු දස අකුසල්වලින් වැළකී සුචරිත ධර්මයෙහි හැසිරෙන්නෝ වෙති. ඉඳින් රටේ රජු ධාර්මික වෙයි ද, එවිට මුළු රට ම සුවපත් වෙයි. සත්වයෝ සිවු ඉරියව්ව ම සුව සේ ගත කරති.

මෙසේ මහ බෝසතාණන් වහන්සේ ධර්ම දේශනා කළ කල්හි රජතුමා තමා රටේ රජු බව දන්වා **"ස්වාමීනි, මුල දී නුග ගෙඩි මිහිරි කළ මම ම පසුව ඒවා තිත්ත රස කළෙමි. එබැවින් නැවත වරක් මම ඒවා මිහිරි රසයට පත් කරන්නෙමි"** යැයි කියා මහ බෝසතාණන් වහන්සේට වැඳ පෙරළා තම නුවරට ගොස් ධාර්මික ව රාජ්‍යානුශාසනා කොට සියල්ල යථා තත්වයට පත් කළේ ය.

## ☸ එළාර රජතුමා

පෙර ලක්දිව බු: වර්ෂ: 339 සිට 383 දක්වා සිවුසාළිස් වසරක් එළාර රජතුමා දස රාජ ධර්මයෙන් සතර සංග්‍රහ වස්තුවෙන් යුක්තව රාජ්‍ය කළේ ය. ඒ එළාර රජතුමා අධිකරණ විනිශ්චය පිණිස සතුරු මිතුරු ඕනෑම කෙනෙකුට පැමිණ පැමිණිලි කිරීම සඳහා නාද කිරීමට මිණි ගෙඩියක් යොතකින් එල්ලා තැබීය.

ඒ රජතුමාට එක් පුතෙකු හා එක් දුවක් වූහ. ඒ කුමරුවා රථයක නැගී තිසා වැවට යන කල්හි මව් දෙන සමග හුන් කුඩා වසු පැටියෙක් රිය සකට යට වී මැරුණේ ය. එය රජ කුමාරයා නො දැන සිදු වූයේ ය. ඒ එළ දෙන කිපී රජ මාලිගය වෙත පැමිණ ඒ මිණිය ගැසුවා ය. එය දැන රජතුමා තම පුත්‍රයා ද ඒ රිය සකට යට කොට හිස සිඳ දැමී ය.

තව ද එක් තල් රුකක කැදැල්ලක හුන් ලිහිණි පැටියෙක් එක් සර්පයෙකු කෑවේ ය. ඒ පැටියාගේ මව වූ ලිහිණි දෙන ඇවිත් ඒ මිණි ගෙඩිය නාද කළා ය. රජතුමා එය දැන ඒ සර්පයා අල්ලා කුස පලා ඒ පැටියා ඉවත දමා එම සර්පයා ඒ තල් ගසට තබා ඇණ ගැස්වීය.

උතුම් වූ රත්නත්‍රයෙහි ගුණ නො දන්නේ නමුත් මේ එළාර රජතුමා චාරිත්‍ර පිළිපදිමින් සෑ ගිරියට ගොස් භික්ෂු සංඝයා පවරා දන් දී ආපසු එන ගමනෙහි දී එම රථයේ විය ගස ගැටී එක් සෑයක කොටසක් කැඩී ගියේ ය. එය රජතුමා නො දත්තේ ය. එවිට අමාත්‍යවරු රජු අමතා **"දේවයන් වහන්ස, අපගේ සෑය නුඹ විසින් බිඳින ලදී"** යැයි කීහ. එවිට රජතුමා නො දැන සිදු වූවක් නමුත් රථයෙන් බැස **"චක්‍රයෙන් මාගේ හිස සිඳිව්"** යැයි කියා මහ මග වැතිර සිටියේ ය. එකල්හි අමාත්‍යවරු **"දේවයන් වහන්ස, අපගේ ශාස්තෘ වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේ පර හිංසා නොකැමති සේක. එබැවින් සෑය ප්‍රකෘතිමත් කොට ක්ෂමා කරවුව මැනව"** යැයි කීහ. එවිට රජතුමා එම සෑයෙහි ගැලවී ගිය ගල් පසළොසක් පමණ ප්‍රකෘතිමත් කොට පිහිටුවා එම සෑය වෙනුවෙන් කහවණු පසළොස් දහසක් ද පරිත්‍යාග කොට ගියේ ය.

එක් වයෝවෘද්ධ උපාසිකාවක් වේලීම පිණිස වී පැදුරක් අවුවෙහි දමුවා ය. එදින අකල් වැස්සක් වැස ඇයගේ ඒ වී පැදුර තෙමුණේ ය. එකල්හි එම උපාසිකාව ඒ වී ගෙන රජ මාලිගාවට ගොස් මිණි ගෙඩිය ගැසුවා ය. රජතුමා කරුණු විමසූ කල්හි එතුමිය **"රජතුමාගේ වරදක් නිසා අකල් වැස්සක් වැස මගේ වී පැදුර තෙමුණාය"** යැයි කියා සිටියා ය. රජතුමා එම උපාසිකාව යවා **"සුදුසු කාලයෙහි වර්ෂාව ලබාවා"** යැයි එය විනිශ්චය කරනු පිණිස පෙහෙවස් සමාදන්ව ධර්මයෙහි පිහිටියේ ය. රජතුමාගෙන් පූජා බිලියම් ගන්නා අරක් ගත් දේවතාවෝ රජතුමාගේ තේජසින් පීඩාවට පත්ව එහි සිටිය නොහැකිව සතර වරම් දෙව් රජවරු හමුවට ගොස් එම කරුණ දැන්වූහ. එවිට වරම් දෙවිවරු ඒ දිව්‍ය පුත්‍රයා ගෙන සක්දෙව් රජතුමා වෙත ගොස් ඒ බව දැන්වූහ. එකල්හි සක්දෙව් රජතුමා වැස්ස වලාහක දෙවියන් කැඳවා කලට වැසි වැස්වීමට අණ කළේ ය. ඉන් පසු ඒ බිලියම් ගන්නා දිව්‍ය පුත්‍රයා පැමිණ එළාර රජතුමාට ඒ සියල්ල දැන්වීය.

එවක් පටන් එළාර රජතුමාගේ රාජ්‍ය කාලයෙහි නොකල් වැසි නො වැස්සේ ය. දහවල් කාලයෙහි වැසි නො වැස්සේ ය. රාත්‍රී කාලයෙහි සතියකට වරක් එක් මධ්‍යම රාත්‍රියක් පමණක් වසින්නේ ය. ඉතිරි දින සයෙහි රාත්‍රියෙහි පිනි බිඳු වැටී පොළොව දූවිලි මකන්නේ ය. එබැවින් කිසි ද ගං වතුර ගැලීමක් නියඟයක් නොවූයේ ය. සැම කල්හි ඇල දෙළ ගංගා පොකුණු තෝතැනි විල් පිරිසිදු දියෙන් පිරී පැවතුණේ ය. ගොවිතැන් ආදී සියල්ල සශ්‍රීක මත් වූහ.

## ❄ නිගමනය

රජවරු ධාර්මික ව රාජ්‍යානුශාසනා කරන කල්හි යුවරජ අමාත්‍යාදීහු ද සිටුවරු ද රටවාසීහු ද ධර්මයෙහි පිහිටීම සිදු වේ. එම කාලයන්හි සත්වයන්ට හිත පිණිස ස්වභාව ධර්මයෙන් සිදුවන සියලු ක්‍රියාවන් සත්වයන්ට හිත සුව පිණිස සිදු වේ. එම කාලයන්හි සත්වයන්ගේ කටයුතුවලට බාධා වන බැවින් දහවල් වැසි නොවසී. දින සතකට වරක් එක් රැයක සත්වයන්ට නින්දට වත් බාධාවක් නොවනු පිණිස මැදියම් රැයෙහි (රාත්‍රී 10- 02) අතර කාලයෙහි වැසි වසී. සැම කල්හි එක හා සමානව පිරිසිදු දියෙන් පිරී පවතී. ගස් වැල්වලින් පොළොවට පතිත වන මල් කොළ ගෙඩි ආදිය දිරා පොළොවට පොහොර වී මහ පොළොව සශ්‍රීකමත් වේ. මහ පොළොවෙහි සාරය දිය වී ගංගා ඇළ දෙළ උතුරා බොර වී මුහුදට ගසා ගෙන නොයයි. ඒ හේතුවෙන් ගොවිතැන් ආදී සියල්ල සාරවත් වේ. ඒවාට රසායනික බෙහෙත් පොහොර යෙදීමට අවශ්‍ය නොවේ. එසේම ඒ ගොවිතැන් කිසිවක රෝග හට නො ගනී. ඉතා රසයෙන් හා ගුණයෙන් යුක්තව හට ගනී. ඒවා අනුභව කරන අය නිරෝගී සම්පන්න වූ බලවත් කාය ශක්තිය ඇති වර්ණවත් ශරීර ඇති දීර්ඝායුෂ ඇති අය බවට පත් වේ.

තව ද පානීය පරිභෝජනීය ජලය ද පොළොව මතුපිට හටගන්නා දිය උල්පත් ආදියෙන් ස්වභාවයෙන් ම ලැබෙයි. එම ජලය මිහිරි රසයෙන් හා ගුණයෙන් යුක්ත වේ. ඒ ජලය පරිහරණය කරන සත්වයන්ට ලෙඩ රෝග හට නො ගනී.

රජවරු අධාර්මික ව රාජ්‍යානුශාසනා කරන කල්හි යුවරජ අමාත්‍යාදීහු ද සිටුවරු ද රටවාසීහු ද අධර්මයෙහි පිහිටීම සිදු වේ. එම කාලයන්හි සත්වයන්ට හිත පිණිස ස්වභාව ධර්මයෙන් සිදුවන සියලු ක්‍රියාවන් සත්වයන්ට අහිත දුක පිණිස සිදු වේ. එම කාලයන්හි නපුරු ලෙස වැසි කල ඇති වේ. වසින විට දිවා රෑ වැසි වසී. ඇළ දොළ ගංගා වැව් අමුණු උතුරා ජල ගැලුම් ඇති වේ. එම හේතුවෙන් ගස් වැල්වලින් පොළොවට පතිත වන මල් කොළ ගෙඩි ආදිය දිරා පොළොවට පොහොර වී මහ පොළොව සශ්‍රීකමත් වීම සිදු නොවේ. මහ පොළොවෙහි සාරය දිය වී ගංගා ඇළ දොළ උතුරා බොර වී මුහුදට ගසා ගෙන යයි. ඒ හේතුවෙන් ගොවිතැන් ආදී සියල්ල නිසරු වේ. එසේම වගා කරන ගොවිතැන් ආදියෙහි නොයෙකුත් රෝග හට ගනී. නිසරු ව ගුණයෙන් තොරව හට ගනී. ඒවා අනුභව කරන සත්වයන් බොහෝ ලෙඩ රෝග ඇති ඉතා දුබල වූ අවලස්සන ශරීර ඇති අල්ප ආයුෂ ඇති අය බවට පත්ව  වේ.

එසේ ම වැසි නතර වූ විට මාස ගණන් වර්ෂ ගණන් වැසි නැතිව ගොස් ගොවිතැන් ආදිය පාලු වී යයි. දූවිලි සහිත වූ ඉතා අපිරිසිදු පරිසරයක් ඇති වේ. එයින් සත්වයන්ට බොහෝ ලෙඩ රෝග හට ගැනීම වසංගත රෝග වැළඳීම සිදු වේ.

තව ද පානීය පරිභෝජනීය ජලය පොළොව මතුපිට හටගන්නා දිය උල්පත් ආදිය සිඳී යයි. නැවත මනාකොට ධර්මයෙහි පිහිටීමෙන් ම ඒ සියල්ල නිවැරදි කර ගැනීම සිදු වේ. එහෙත් මිනිසා එසේ කළ යුතු දේ නොකොට අකටයුතු කම් කරමින් පොළොව විද පොළොව යට පිහිටි ජලය උපක්‍රම මගින් ගෙන පරිහරණයට ගනී. එහෙත් එම ජලය සත්වයන්ට හිතකර නොවේ. එයින් බොහෝ රෝගාබාධ හට ගැනීම සිදු වේ. තව ද එයින් පොළොව මතුපිට ඇති ජල මූලාශ්‍ර සිඳී යෑම ද සිදු වේ. එසේ ම පොළොව යට විද ජලය ගැනීමෙහි දී පොළොව අභ්‍යන්තරයෙහි වෙනස්කම් සිදු වී භූමි කම්පා ආදී ව්‍යසන ඇති වේ. ලොව ජීවත් වන තිරිසන් ආදී කිසිම සත්වයෙකුගෙන් සොබා දහමට කිසි හානියක් සිදු නොවේ. එහෙත් මිනිසා නම් වූ සත්වයාගේ නො මනා ක්‍රියා කලාපය හේතුවෙන් සොබා දහමට ද, තිරිසන් ආදී අහිංසක සත්වයන්ට ද, සදේවක ලෝකවාසී සියලු සත්වයන්ට ම මහත් අනර්ථ සිදු වේ. එබැවින් මෙය එක්වන්ව සිහිකට යුත්තේ ය.